## කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය

# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# 2018

සම්පාදනය
සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන අංශය

ප්‍රකාශනය
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය

වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2018

සම්පාදනය
සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන අංශය

ප්‍රකාශනය
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය

තැ.පෙ. 1519, දෙවන මහල,
කම්කරු මහලේකම් කාර්යාලය, නාරාහේන්පිට, කොළඹ 05.

මුද්‍රණය
ප්‍රින්ට්මේක් පුද්ගලික සමාගම
241/41-ඒ, කිරුළ පාල, නාරාහේන්පිට, කොළඹ 05.
දුරකථන - 0112 368 443 / 0112 369 222
විද්‍යුත් තැපෑල - pmakeoffice@gmail.com

# කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය

# වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2018

## ඇතුල් පිටු


| ඇතුල් පිටු | පිටුව |
|---|---|
| ❖ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය ගරු. රවින්ද්‍ර සමරවීර මැතිතුමාගේ පණිවුඩය | v |
| ❖ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශ ලේකම්තුමාගේ පණිවුඩය | vii |
| ❖ හැඳින්වීම | 1 |
| අමාත්‍යාංශ කාර්යසාධනය | |
| I. පාලන හා ආයතන අංශය | 8 |
| II. සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන අංශය | 8 |
| III. කම්කරු හා විදේශ සම්බන්ධතා අංශය | 9 |
| IV. මුදල් අංශය | 12 |
| අමාත්‍යාංශය යටතේ වූ ආයතන | |
| I. කම්කරු දෙපාර්තමේන්තුව | 13 |
| II. මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව | 29 |
| III. ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 39 |
| IV. ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය | 41 |
| V. කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය | 46 |
| VI. සේවා නියුත්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය | 48 |
| VII. ශ්‍රම වාසනා අරමුදල | 53 |
| ඡායාරූප - අමාත්‍යාංශයේ විශේෂ ක්‍රියාකාරකම් | 54 |



## කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය
## ගරු.රවීන්ද්‍ර සමරවීර මැතිතුමාගේ පණිවුඩය

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ 2018 වර්ෂයේ කාර්යසාධන වාර්තාවට සුභ පැතුම් පණිවුඩයක් එක් කිරීමට ලැබීම පිළිබඳව මම අතිශයින් සතුටු වෙමි.

කම්කරු අමාත්‍යාංශය යටතේ පවත්නා කම්කරු දෙපාර්තමේන්තුව, මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය, ශ්‍රම වාසනා අරමුදල, කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය ආදි ආයතන සියල්ලම එක්ව වැඩ කරන ජනතාව වෙනුවෙන් ඉටු කරනු ලබන සේවය අතිමහත්ය.

ශ්‍රී ලංකාව තුළ සේවය කරනු ලබන අර්ධ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවක සුභ සාධනය අරමුණු කරගෙන කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය මගින් 2018 වර්ෂයේ කම්කරු ප්‍රජාව වෙනුවෙන් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් රාශියකි.

වෘත්තීය සමිති ලියාපදිංචි කිරීම හා රාජ්‍ය හා පෞද්ගලික අංශවල සියලුම වෘත්තීය සමිතිවල කටයුතු රටේ සංවර්ධනය සඳහා යොදා ගනිමින් කම්කරු ආරවුල්, වැඩ වර්ජන අවම කර ගනිමින් කාර්මික සාමය ඇති කර රටේ සංවර්ධන ක්‍රියාවලිය වේගවත් කිරීමටත් ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන්, සේවක පරිපාලනය හා සුභ සාධනය සම්බන්ධ ප්‍රතිපත්ති සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීමත් කම්කරු සබඳතා වලට අදාල නිතී රීති සම්පාදනය සහ නියාමනයට අදාල කටයුතුත් වර්ෂය තුළ ක්‍රියාවට නංවා ඇත.

දිවයිනේ රැකියා විරහිත තරුණ තරුණියන් පෞද්ගලික අංශයේ රැකියා සඳහා යොමු කිරීමේ පියවරක් වශයෙන් මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව මඟින් රැකියා පොළ වැඩසටහන ක්‍රියාවට නංවා ඇත. එමගින් රැකියා සඳහා ලියාපදිංචි වීම පිණිස රැකියා සේවා මධ්‍යස්ථාන දිවයිනේ දිස්ත්‍රික්ක කිහිපයක ආරම්භ කර රැකියා අවස්ථා උදා කර දීමට කටයුතු සම්පාදනය කර ඇත.

රාජ්‍ය හා පෞද්ගලික අංශයේ නිළධාරීන් සඳහා විවිධ පුහුණු වැඩසටහන් පැවැත්වීමට ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය මගින් කටයුතු සම්පාදනය කර ඇති අතර ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය මගින් පෞද්ගලික කර්මාන්තශාලා හිමිකරුවන්ගේ සහාය ඇතිව සේව්‍ය සේවක දෙපාර්ශවයම සඳහා විවිධ දැනුවත් කිරීම්, පුහුණු වැඩසටහන් පැවැත්වීම තුලින් වෘත්තීය සුරක්ෂිතතාව පිළිබඳ මනා අවබෝධයක් ලබාදීමට පියවර ගෙන තිබේ.

විශේෂයෙන්ම ළමා ශ්‍රම යෙදවුම් තුරන් කිරීමත්, ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව සේවා තත්වයන් හා සේවක අයිතීන් තහවුරු කිරීමටත් කටයුතු කර ඒවා විධිමත්ම පවත්වා ගෙනයාම පිණිස අවශ්‍ය කම්කරු කාර්යාල, ගොඩනැගිලි අලුතින් ඉදිකර මහජන අයිතියට පැවරීමටත් නගර කිහිපයක කම්කරු කාර්යාල, ගොඩනැගිලි ඉදිකිරීම් හා අලුත්වැඩියාවන් ආරම්භ කර වඩාත් ආකර්ශනීය මහජන සේවාවක් ඉටු කිරීමටත් හැකි වී තිබේ.

2018 වර්ෂය තුළ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ අරමුණු ඉලක්ක කරා රැගෙන යාමට උරදුන් අමාත්‍යාංශයේ ලේකම් එස්. ඒ. නිමල් සරණතිස්ස මහතා ඇතුළු සමස්ථ කාර්ය මණ්ඩලයටත්, අමාත්‍යාංශය යටතේ ඇති සියලුම ආයතන ප්‍රධානීන්ටත් එම ආයතනවල සියලුම නිළධාරීන්ටත් මාගේ ප්‍රණාමය මෙයින් පුද කරමි.

**රවීන්ද්‍ර සමරවීර (පා.ම)**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය



කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ
**ලේකම්තුමාගේ පණිවුඩය**

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය, ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු හා ආයතන විසින් 2018 වර්ෂයේදී අත්පත් කරගත් කාර්යසාධනය විස්තර කෙරෙන්නා වු මෙම ප්‍රකාශනය ඔබ අතට පත් කරන්නේ ඉමහත් සතුටිනි.

තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට සුවහසක් ශ්‍රී ලාංකීය ජනතාවගේ දායකත්වය අතිශය වැදගත්ය. ඒ සඳහා කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ කාර්යභාරයද අතිවිශාලය. 2018 වර්ෂයේ දී යහපාලන ප්‍රතිපත්ති, 2020 හා 2025 දැක්ම හා ප්‍රතිපත්ති රාමුව යටතේ වැඩකරන ජනතාවගේ අයිතීන් සුරක්ෂිත කිරීමට ප්‍රතිපත්ති හා වැඩසටහන් රාශියක් ආරම්භ කිරීමට හැකි විය.

2018 වර්ෂයේ සමාලෝචිත කාලවකවානුව තුළ අමාත්‍යාංශයත් අමාත්‍යාංශය යටතට ගැනෙන ආයතනයන් වු කම්කරු දෙපාර්තමේන්තුව, කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, මිනිස්බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුව, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය හා ශ්‍රම වාසනා අරමුදල විසින් සුවිශේෂි කාර්යභාරයක් ඉටුකරනු ලැබීය.

කම්කරු උපදේශන සභා සවිබල ගැන්වීම සහ වර්තමාන ජාතික හා ජාත්‍යන්තර සමාජ ආර්ථික පරිසරයට අනුරූප වන ලෙස හා ආයෝජන හිතකර පරිසරයක් ඇති කිරීම සඳහා කම්කරු අයිතිවාසිකම් සුරක්ෂිත වන අයුරින් කම්කරු නීති රීති සංශෝධනය සඳහා කටයුතු කර ඇත. එහිදී ප්‍රසූතිකාධාර විෂමතාවන් ඉවත් කිරීම තුළින් පෞද්ගලික අංශයේ සේවිකාවන්ට, සෑම දරුවෙක් සඳහාම දින 84 ක ප්‍රසූත නිවාඩු ලබා දීමට හැකි වීම අප ලද ජයග්‍රහණයකි. එසේම, සේවක අර්ථසාධක අරමුදල් පනත, කම්කරු වන්දි ආඥා පනත, පඩි පාලක ආඥා පනත හා ශ්‍රම වාසනා අරමුදල් පනත් සංශෝධනය කිරීම මගින් ඒවායේ ආවරණය පුළුල් කරමින් සිටී. සියලුම සේවා කොන්දේසි වලට අදාල පනත් වල කරුණු ඇතුලත් කර, එක් නීතියක් ක්‍රියාත්මක කිරීමටත්, ගෘහ සේවකයින් කම්කරු නීතිරීති මගින් ආවරණය කිරීමට අවශ්‍ය විධිවිධාන සකස් කරමින් පවතී. ළමා ශ්‍රමය ශ්‍රී ලංකාවෙන් පිටු දැකීම උදෙසා ජාතික ප්‍රතිපත්තියක් එළි දැක්වීමට හැකි වු අතර අදාල සියලු පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් ජාතික නියාමන කමිටුවක් පිහිටුවා එය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලදී.

එසේම මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ රැකියා විරහිත තරුණ පිරිස් පෞද්ගලික අංශයේ රැකියා සඳහා යොමු කිරීමට අවශ්‍ය මාර්ගෝපදේශ සැපයිම, රැකියා පොළ වැඩසටහන් පැවැත්වීම හා පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් මාර්ගෝපදේශ වැඩසටහන් පැවැත්වීම, කාන්තාවන් ස්වයං රැකියා සඳහා පෙළඹවීම, රැකියා සඳහා ලියාපදිංචි විම සඳහා රැකියා සේවා මධ්‍යස්ථාන (PES) දිවයිනේ දිස්ත්‍රික්ක කිහිපයක ආරම්භ කිරීම ඇතුළු කටයුතු රාශියක් මෙම වර්ෂය තුළ ඉටු කරන ලදී. විශේෂයෙන් අම්පාර සංචාරක නිවාසය විවෘත කිරීම හා මෙහෙවර පියස ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු වල අවසන් අදියරයට පැමිණවීමට හැකි වීමත්, පුත්තලම හා පොළොන්නරුව කම්කරු කාර්යාලවල ඉදිකිරීම් අවසන් කර විවෘත කිරීමට ද හැකියාව ලැබුණි. අප අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර තව දුරටත් ඔපවත් කරමින් ජංගම සේවා වැඩසටහන් හරහා කම්කරු ජනතාවගේ ගැටලු රාශියකට විසඳුම් ලබා දීමට ද හැකි විය.

ඉහත සඳහන් කළ කාර්යයන් ඉටුකිරීමට අවශ්‍ය නායකත්වය, මගපෙන්වීම හා අනුශාසකත්වය ලබාදුන් කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය ගරු රවීන්ද්‍ර සමරවීර මැතිදුන් වෙත කෘතඥතාව පළ කරමි. එසේම ඉහත කාර්යසාධනය අත්කර ගැනීමෙහිලා මහත් වූ කැපවීමෙන් ක්‍රියා කළ අමාත්‍යාංශයේ සියලුම කාර්ය මණ්ඩලයටත්, කම්කරු කොමසාරිස් ජනරාල්, මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සභාපති, කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලයේ කම්කරු වන්දි කොමසාරිස්, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් හා ශ්‍රම වාසනා අරමුදලේ සාමාන්‍යාධිකාරි සහ එම ආයතනවල සියලුම මට්ටම් වල නිලධාරීන්ටත් මෙම ප්‍රකාශනය පිළියෙල කළ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරුන් සහ සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන අංශයේ සියලුම නිළධාරින්ටත් මාගේ කෘතඥතාවය පිරිනමමි.

**එස්. ඒ. නිමල් සරණතිස්ස**
ලේකම්
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය

# කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය

ශ්‍රී ලංකාවේ අර්ධ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවයේ නියුක්ත වුවන්ගේ ජීවන හා සේවා තත්වයන් වර්ධනය කිරීම  මෙන්ම රටේ නිෂ්පාදනය හා ශ්‍රම ඵලදායිතාව ඉහළ නැංවීමට අවශ්‍ය වන කාර්මික සාමය සහ සේව්‍ය - සේවක සබඳතාව ස්ථාපනය කරමින් අදාල ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සහ ඒවා ක්‍රියාවට නැංවීම, කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ මූලික පරමාර්ථ වේ. සේවක ජනතාවගේ සුබසාධනය උදෙසා වරින් වර ඇති කරන ලද කම්කරු නීති හා අණ පනත් අනුව මෙම අමාත්‍යාංශයට පැවරෙන කාර්යභාරයද පුළුල්ය. ඒ අනුව අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර පහත පරිදි වේ.


**දැක්ම**

තෘප්තිමත් ඵලදායි ශ්‍රී ලාංකික ශ්‍රම බලකායක්

**මෙහෙවර**

කාර්මික සාමය හා සහයෝගීතාව සමාජ සුරක්ෂිතතාවය, කම්කරු අයිතිවාසිකම් හා ඵලදායිතාව තුළින් සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම.

**අමාත්‍යාංශය යටතේ ඇති ආයතන හා අංශ**



## අමාත්‍යාංශයේ අරමුණු

- ත්‍රෛපාර්ශවීය සවිබල ගැන්වීම තුළින් සේව්‍ය සේවක සබඳතා ශක්තිමත් කිරීම.
- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව සේවා තත්ත්වයන් හා සේවක අයිතීන් තහවුරු කිරීම.
- ළමා ශ්‍රම යෙදවුම් තුරන් කිරීම.
- රැකියාවල නියුතු කාන්තාවන් සවිබල ගැන්වීම, ආරක්‍ෂා කිරීම හා ස්ත්‍රී පුරුෂ සමානතාව දිරිගැන්වීම.
- කම්කරු නීති රීති හා පරිපාටිවල නම්‍යශීලීත්වය ඉහළ නැංවීම.
- සමාජ සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා සුදුසු ක්‍රමෝපායන් සකස් කිරීම.

## අමාත්‍යාංශය වෙත පැවරී ඇති රාජකාරි

2015.09.21 සහ 2018.05.12 දිනයන්හිදී ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රවලට අනුව කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයට පවරන ලද බලතල, කාර්යයන් හා කර්තව්‍යයන් පහත දැක්වේ.

1. කම්කරු හා වෘත්තීය සමිති සබඳතා විෂයන්ට සහ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
2. ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන්, සේවක පරිපාලනය සහ සුභසාධනය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
3. ජාත්‍යන්තර කම්කරු සංවිධානය සහ ජාත්‍යන්තර සමාජ ආරක්ෂණ සංවිධානය සමග අන්තර් සහයෝගීතාව පවත්වා ගැනීම.
4. සේවක අර්ථසාධක අරමුදල, පෞද්ගලික අර්ථසාධක අරමුදල් සහ පෞද්ගලික විශ්‍රාම ගැන්වීමේ ක්‍රම පරිපාලනය කිරීම.
5. කාර්මික සබඳතා සහ කාර්මික ආරවුල් නිරාකරණය කිරීම.
6. කම්කරු සබඳතා වලට අදාළ නීතිරීති සම්පාදනය සහ නියාමනයට අදාළ කටයුතු.
7. වෘත්තීය සහ රැකියා මාර්ගෝපදේශ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
8. වෘත්තීය සමිති ලියාපදිංචි කිරීම සහ රාජ්‍ය සහ පෞද්ගලික අංශවල සියලුම වෘත්තීය සමිතිවල කටයුතු රටේ සංවර්ධනයට යොදා ගැනීම සඳහා අවශ්‍ය සාධනීය පියවරයන් හඳුන්වා දීම සහ ක්‍රියාත්මක කිරීම.
9. ජාතික මිනිස්බල හා රැකීරක්ෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
10. රැකියා නියුක්ති ආයතන විසින් ගාස්තු අය කිරීම නියාමනය කිරීම.
11. විරැකියා ප්‍රතිලාභ රක්ෂණ යෝජනා ක්‍රමයට අදාළ කටයුතු.
12. වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
13. කම්කරු දෙපාර්තමේන්තුව, මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය, ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය, කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය සහ ශ්‍රම වාසනා අරමුදල යන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයන්ට අදාළ කටයුතු හා අධීක්ෂණය.


## ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධාන අණ පනත්

1. 1934 අංක 19 දරන කම්කරු වන්දි ආඥා පනත.
2. 1935 අංක 14 දරන වෘත්තිය සමිති අඥා පනත.
3. 1939 අංක 32 දරන ප්‍රසුතිකාධාර අඥා පනත.
4. 1941 අංක 27 දරන පඩිපාලක සභා ආඥා පනත.
5. 1942 අංක 45 දරන කර්මාන්තශාලා අඥා පනත.
6. 1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනත.
7. 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත.
8. 1956 අංක 47 දරන ස්ත්‍රීන් තරුණ අය සහ ළමයින් සේවයේ යෙදවීම පිළිබඳ පනත.
9. 1956 අංක 37 දරණ ගාස්තු අයකිරීමේ රැකියා නියුක්ති නියෝජිතායතන පනත.
10. 1958 අංක 15 දරන  සේවක අර්ථසාධක අරමුදල් පනත.
11. 1971 අංක 45 දරන කම්කරුවන්ගේ සේවා නියුක්තිය අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත.
12. 1979 අංක 32 දරන සේවක මණ්ඩල පනත.
13. 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත.
14. 1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල් පනත.
15. 2009 අංක 38 දරන වෘත්තිය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ ආයතන පනත.
16. 2010 අංක 12 දරන ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනත.
17. 2016 අංක 03 දරන සේවකයින්ගේ ජාතික අවම වේතන පනත
18. 2016 අංක 04 දරන අයවැය සහන දීමනා පනත

## කාර්ය මණ්ඩල තොරතුරු - 2018.12.31 දිනට

| ආයතනය | ජ්‍යෙෂ්ඨ මට්ටම | | තෘතීය මට්ටම | | ද්විතීය මට්ටම | | ප්‍රාථමික මට්ටම | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
| අමාත්‍යාංශ කාර්යාලය | 21 | 13 | 05 | 4 | 80 | 49 | 41 | 25 | 147 | 91 | 56 |
| කම්කරු දෙපාර්තමේන්තුව | 210 | 150 | 668 | 514 | 1,762 | 1553 | 489 | 452 | 3129 | 2669 | 460 |
| මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව | 15 | 07 | 04 | 0 | 673 | 568 | 15 | 14 | 707 | 589 | 118 |
| ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 09 | 03 | 13 | 07 | 18 | 06 | 05 | 03 | 45 | 19 | 26 |
| ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය | 03 | 01 | 07 | 04 | 10 | 08 | 05 | 06 | 25 | 19 | 06 |
| කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය | 05 | 02 | 02 | 01 | 31 | 27 | 05 | 03 | 43 | 33 | 10 |
| ශ්‍රම වාසනා අරමුදල | 01 | 01 | 03 | 03 | 07 | 07 | 04 | 04 | 15 | 15 | 0 |
| සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය | 70 | 58 | 80 | 62 | 762 | 748 | 174 | 168 | 1086 | 1036 | 50 |
| **මුළු සේවක සංඛ්‍යාව** | **334** | **235** | **782** | **595** | **3343** | **2966** | **738** | **675** | **5197** | **4471** | **726** |

# ආයතනික සටහන
# කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය



**සමස්ත මූල්‍ය ප්‍රගති සාරාංශය - 2018.12.31 දිනට**

| | ආයතනය | වැය විෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය (රු. 000') | වියදම (රු. 000') | ඉතිරි ප්‍රතිපාදනය (රු. 000') | වියදම් ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|---|---|---|
| 1 | අමාත්‍යාංශ කාර්යාලය | 193 | පුනරාවර්තන | 207,527 | 163,404 | 44,123 | 78.7% |
| | | | මූලධන | 268,387 | 63,726 | 204,661 | 23.74% |
| 2 | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | | පුනරාවර්තන | 12,000 | 11,851 | 149 | 98.8% |
| | | | මූලධන | 1,500 | 1,500 | 0 | 100% |
| 3 | ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය | | පුනරාවර්තන | 6,000 | 4,179 | 1,821 | 69.7% |
| | | | මූලධන | 7,000 | 690 | 6,310 | 9.9% |
| 4 | කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය | | පුනරාවර්තන | 33,400 | 33,077 | 323 | 99% |
| | | | මූලධන | 3,850 | 499 | 3,351 | 13% |
| | **මුළු එකතුව** | | පුනරාවර්තන | **258,927** | **212,511** | **46,416** | **82%** |
| | | | මූලධන | **280,737** | **66,415** | **214,322** | **23.65%** |
| 5 | කම්කරු දෙපාර්තමේන්තුව | 221 | පුනරාවර්තන | 1,619,100 | 1,614,474 | 4,626 | 99.7% |
| | | | මූලධන | 2,211,000 | 1,813,415 | 397,585 | 82.01% |
| 6 | මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව | 328 | පුනරාවර්තන | 352,655 | 348,771 | 3,884 | 98.89% |
| | | | මූලධන | 31,100 | 30,395 | 704 | 97.74% |
| | **එකතුව** | | පුනරාවර්තන | **2,230,682** | **2,175,766** | **54,916** | **97.53%** |
| | | | මූලධන | **2,522,837** | **1,910,225** | **612,612** | **75.71%** |
| | **මුළු එකතුව** | | | **4,753,519** | **4,085,991** | **667,528** | **86%** |

**තිරසාර සංවර්ධන ඉලක්ක**

2030 වර්ෂය වන විට තිරසාර සංවර්ධන ඉලක්ක අත්පත් කර ගැනීම තුළින් වඩාත් හොඳ සංවර්ධන මට්ටමක් අත්පත් කර ගැනීමට ශ්‍රී ලංකාව අපේක්ෂා කරයි. තිරසාර සංවර්ධන අරමුණු අතුරින් 8 වන අරමුණ වන ''තිරසර හා සංයුක්ත ආර්ථික වර්ධනය, සැමට පූර්ණ හා ඵලදායී රැකියා සහ සුනිසි රැකියා ප්‍රවර්ධනය'' (Promote sustained inclusive and sustainable economic growth, full and productive employment and decent work for all) සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම අමාත්‍යාංශයේ දායකත්වය සැපයිය යුතු වේ.

සංවර්ධනය කරා යන මාර්ගයට ශ්‍රී ලංකාව අවතීර්ණ වීමට නම් යහපත් රැකියා ප්‍රවර්ධනය කළයුතු වේ. මෙමගින් නිදහස, සාධාරණත්වය, ආරක්ෂාව හා මානව ගරුත්වය යන තත්ත්වයන් තුළ ඵලදායී වැඩ ලබා ගැනීමට කාන්තාවන්ට හා පිරිමින්ට සමාන අවස්ථා ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂිතය. එසේම රැකියා නිර්මාණය කිරීම පමණක් අපේක්ෂා නොකරන අතර එම නිර්මාණය කෙරෙන රැකියා පිළිගත හැකි තත්ත්වයේ ඒවා විය යුතු වීම විශේෂත්වයකි. සුනිසි මෙහෙවර වැඩසටහන ප්‍රධාන ස්ථම්භයන් 4ක් තුළ ක්‍රියාත්මක වේ.

- රැකියා උත්පාදනය, ප්‍රවර්ධනය හා ජාතික ඵලදායිතාව
- වැඩබිමෙහි හිමිකම
- සමාජ ආරක්ෂණය
- සමාජ කතිකාවත

මෙම ප්‍රධාන ස්ථම්භ 4 ට අමතරව පහත දැක්වෙන විෂය ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කරමින් සෑම අංශයක්ම සම්බන්ධීකරණය කරනු ලැබේ

1 ඵලදායිතා ප්‍රවර්ධනය.
2 ස්ත්‍රී පුරුෂ සමාජභාවය තහවුරු කිරීම.

ඒ අනුව යහපත් වැඩ පරිසරයක් නිර්මාණය කිරීම උදෙසා අමාත්‍යාංශය යටතේ පවතින සියලුම ආයතන විසින් පහත දැක්වෙන විෂය ක්ෂේත්‍රයන් (*Thrust Areas*) ඔස්සේ කටයුතු කරනු ලබයි.

1 කාර්මික සාමය හා සංහිඳියාව.
2 කම්කරු ප්‍රමිතීන් සහ නීති රීති ක්‍රියාත්මක කිරීම.
3 කාන්තා ශ්‍රමිකයින් සුරැකීම හා ළමා ශ්‍රමය පිටු දැකීම.
4 වෘත්තීය සුරක්ෂිතතාවය හා සෞඛ්‍යය.
5 සමාජ ආරක්ෂණය.
6 කම්කරු ක්ෂේත්‍රයට අදාල අධ්‍යාපන, පුහුණු, පර්යේෂණ සහ සංවර්ධනය.

අන්තර්ජාතික කම්කරු සංවිධානයේ සහයෝගයෙන් ක්‍රියාත්මක කරන ලද "ශ්‍රී ලංකාවේ සුනිසි මෙහෙවර වැඩසටහන" 2013-2017 කාල පරිච්ඡේදය තුළ ක්‍රියාත්මක කරන ලදී. 2018-2022 කාල පරිච්ඡේදය සඳහා සුනිසි මෙහෙවර වැඩසටහන සකස් කර, අන්තර්ජාතික කම්කරු සංවිධානය, වෘත්තීය සමිති හා හාම්පුතුන්ගේ සහභාගීත්වයෙන් අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

එසේම කම්කරු දෙපාර්තමේන්තුව මගින් සිදු කරන සියලුම කටයුතු වලින් සැමට සුනිසි රැකියා සාක්ෂාත් කිරීම හා රටතුළ කාර්මික සාමයක් ඇති කිරීම පිණිස ක්‍රියාත්මක වේ. ඒ අතරම අමාත්‍යාංශයට අනුබද්ධිත අනෙකුත් ආයතන විසින්ද වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය ප්‍රවර්ධනය, කම්කරු ක්ෂේත්‍රය පිළිබඳ පර්යේෂණ හා අධ්‍යයන කටයුතු සිදු කිරීම හා කම්කරු ප්‍රජාවගේ සුභ සාධනය නැංවීමට ක්‍රියා කිරීම තුලින් සැමට සුනිසි රැකියා සාක්ෂාත් කිරීමටත්, ඵලදායිතාව ඉහළ නැංවීමටත් සේව්‍ය සේවක සබඳතාව ශක්තිමත් කිරීම හා දැනුවත් ශ්‍රම බලකායක් ඇති කිරීම තුලින් රට තුළ කාර්මික සාමය ස්ථාපනයටත් අවශ්‍ය කටයුතු සිදු කරනු ලබයි.

**කම්කරු අණපනත් ප්‍රතිසංවිධානය කිරීම.**

වර්තමාන ජාතික හා ජාත්‍යන්තර සමාජ ආර්ථික තත්වයන්ට අනුකූල වන අයුරින් ශ්‍රී ලංකාව තුළ ආයෝජන හිතකාමී වාතාවරණයක් ඇති කිරීම උදෙසා කම්කරු අණපනත් ප්‍රතිසංවිධානය කරන අතර වැඩකරන ජනතාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට ද මෙම අමාත්‍යාංශය බැඳී සිටියි. මේ යටතේ පහත සඳහන් කාර්යයන් සිදු කරනු ඇත.

1. සියලුම ශ්‍රී ලාංකික ශ්‍රම බලකාය ආර්ථිකයේ කොටස්කරුවන් කර ගැනීම සඳහා සේවා කොන්දේසි ඇතුළත් කර එක පනතක් හඳුන්වා දීම. මේ තුළින් අණ පනත් අතර පවතින විෂමතාවන් හා සංකීර්ණතා ඉවත්කර සරල බවට පත් කිරීමට අපේක්ෂා කෙරෙන අතර මේ වන විට කේවල කම්කරු නීතිය කෙටුම්පත් කරමින් පවතී.
2. ප්‍රසූතිකාධාර සම්බන්ධයෙන් තිබූ විෂමතා ඉවත්කර සේවයේ නියුක්ත සියලු ම කාන්තාවන්ට සියලු දරුවන් සඳහා දින 84 ක ප්‍රසූත නිවාඩු ලබා දීමට නීති සංශෝධනය කරන ලදී.
3. සේවයෙහි යෙදවිය හැකි වයස, අවුරුදු 14 සිට 16 දක්වා සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.
4. කර්මාන්තශාලා ආඥා පනත සඳහා නව රෙගුලාසි සකස් කරමින් පවතින අතර ඒ තුළින් වඩා පුළුල් ලෙස කර්මාන්තශාලා පරීක්ෂණ සිදු කිරීමට අපේක්ෂා කෙරේ.
5. සේවක අර්ථසාධක අරමුදල් පනත කාලානුරූපීයව සංශෝධනය කරමින් පවතී.
6. ශ්‍රම වාසනා අරමුදල් පනත වඩාත් පුළුල් ක්ෂේත්‍රයක සේවක සුබ සාධන කටයුතු සිදු කිරීමට හැකි වන පරිදි සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී.
7. ගෘහස්ථ කම්කරුවන් කම්කරු නීතිරීති වලින් ආරක්ෂා කිරීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී.
8. කම්කරු වන්දි ආඥා පනත සංශෝධනය කිරීම තුළින් මේ වන විට ගෙවනු ලබන උපරිම වන්දි මුදල වන රු. 550,000.00 රු. 2,000,000.00 දක්වා වැඩි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී.

## අමාත්‍යාංශ කාර්යසාධනය

### I. පාලන සහ ආයතන අංශය

පාලන සහ ආයතන අංශය පරිපාලන, ආයතන සහ මාධ්‍ය යන ඒකක තුනින් සමන්විත වේ.

පරිපාලන ඒකකයට පරිපාලනය, කළමනාකරණය, සාමාන්‍ය නඩත්තුව, පුහුණු කිරීම සහ අමාත්‍යාංශයත් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනත් සම්බන්ධීකරණය කිරීම යනාදී භාරදූර වගකීම් සම්භාරය පැවරී ඇත.

ආයතන ඒකකය අමාත්‍යාංශයේත් කම්කරු සහ වෘත්තීය සමිති සබඳතා පිළිබඳ ගරු අමාත්‍යවරයාගේ කාර්යාලයේත් අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලත් මානව සම්පත් කළමනාකරණය පිළිබඳ කටයුතු කරයි. එසේම පාර්ලිමේන්තුවේ අසන ප්‍රශ්න, මහජන පෙත්සම් කාරක සභාව, උපදේශක කමිටු, මානව අයිතිවාසිකම් කොමිෂන් සභාව සහ විවිධාකාර ඉල්ලීම් පිළිබඳ මහජනතාව විසින් එවනු ලබන විවිධාකාර ලිපි යන මේවාට අදාළ කටයුතු භාරව ක්‍රියා කරන්නේ ද මේ ඒකකයයි.

අමාත්‍යාංශයේ මාධ්‍ය ඒකකය අමාත්‍යාංශයත් අමාත්‍යාංශය යටතේ පවතින ආයතනත් විවිධ අවස්ථාවන්හිදී ඉටු කරනු ලබන කාර්ය මහජනයාටත් මාධ්‍ය සංවිධානවලටත් දැනුම් දීමේ වගකීම භාරව සිටී.

| අනු අංකය | සැලසුම් කළ වැඩසටහන | 2018 වසර සඳහා ඉලක්ක | | 2018.01.01 දින සිට 2018.12.31 දක්වා ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | භෞතික | මූල්‍ය (රු. 000.) | භෞතික | මූල්‍ය (රු. 000.) |
| 01. | අමාත්‍යාංශයේ ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන | 100% | 200 | ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන යටතේ අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය පුහුණු කිරීමේ වැඩසටහනක් අදියර දෙකක් යටතේ පැවැත්විණි. ජාතික ඵලදායිතා සම්මාන දිනාගත් හඳුනාගත් ආයතනයක් නැරඹීම සඳහා අධ්‍යයන චාරිකාවක් අදියර දෙකක් යටතේ පැවැත්විණි | 128.38 |
| 02 | ජූලි වර්ජකයින්ට සහන සැපයීම. | - | - | වයස අවු. 65 සම්පූර්ණ වන ජූලි වර්ජකයින් 119 කට ගෙවීම් කටයුතු සඳහා (එක් වර්ජකයෙකුට රු.250,000 බැගින්) ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත නිර්දේශ කර යවා ඇත | 29,750 |

### II. සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන අංශය

අමාත්‍යාංශය හා ඒ යටතේ වන සියලුම ආයතනවල සංවර්ධන වැඩසටහන් නිවැරදි ඉලක්ක ඔස්සේ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීම, ඒවා ක්‍රියාත්මක කරවීම, ප්‍රගති සමාලෝචනය හා පසු විපරම් කිරීම, මෙම අංශයෙන් සිදු කෙරෙන ප්‍රධාන කාර්යභාරය වේ. මෙයට අමතරව පහත සඳහන් කාර්යයන්ද මෙම කාල පරිච්ඡේදය තුළ අංශය විසින් ඉටුකර ඇත.

1. අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන විසින් සිදු කරනු ලබන සංවර්ධන ඉලක්කයන් ඇතුලත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර අදාල පාර්ශව වෙත යොමු කිරීම.
    - ශුන්‍ය පාදක අයවැය සංවර්ධන වැඩසටහන යටතේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ සෑම මසකම ප්‍රගතිය ඇගයීම.

2 06/2015 (1) ජාතික අයවැය චක්‍රලේඛ අනුව ජනාධිපති ලේකම් කාර්යාලය, මුදල් අමාත්‍යාංශය, ව්‍යාපෘති කළමණාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව හා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය පැවැත්වීම හා ප්‍රගති වාර්තා මාසිකව හා ත්‍රෛයිමාසිකව ඉදිරිපත් කිරීම.

3 2017 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව සකස් කරීම.

4 ශ්‍රී ලංකා සේවක සඟරාව ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධ සියලු කටයුතු සිදු කිරීම.
සමාලෝචිත කාලයට අදාළව ශ්‍රී ලංකා සේවක සඟරාවේ කාණ්ඩ අංක 69 කලාපයේ 1,11,111 කලාපයන් කාර්තුමය වශයෙන් නිකුත් කරන ලදී.

5 කම්කරු විෂය ක්ෂේත්‍රය පිළිබඳව විද්වත් කතිකාවතක් සඳහා පර්යේෂණ වාර්තා 09ක් ලබා ගෙන වාර්තා 06ක් සඳහා අවසන් පර්යේෂණ වාර්තා කැඳවා 2018 නොවැම්බර් මාසයේ 29 වැනි දින කතිකාව කොළඹදී පවත්වන ලදී. එහි ඉදිරිපත් කරන ලද වාර්තා කැටිකර ජර්නලයක් වශයෙන් මුද්‍රණය කිරීමට කටයුතු කරගෙන යනු ලැබේ.

6 බදුල්ල දිස්ත්‍රික්කයේ කම්කරු ප්‍රජාවගේ ගැටළු විසදීම සඳහා සැප්තැම්බර් 22 හා 23 යන දෙදින තුළ විශේෂ ජංගම සේවා වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. එහි දී 2000 කට අධික සේවක ප්‍රජාවකගේ කම්කරු කෂේත්‍රය සම්බන්ධ ගැටළු වලට විසඳුම් ලබා දීමට හැකි විය. එසේම සුභසාධන වැඩසටහන් මාලාවක්ද පවත්වන ලදී.

7 "Understanding Labour Law" ග්‍රන්ථයේ තෙවන සංස්කරණය සිදු කර මුද්‍රණය කරන ලදී.

8 සුනිසි මෙහෙවර වැඩසටහන යටතේ විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට රුපියල් මිලියන 15ක් පහත සඳහන් ආයතන වලට වෙන් කර විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

**සුනිසි මෙහෙවර වැඩසටහනෙහි ප්‍රගතිය - 2018.12.31 දිනට**

| ආයතනය | ශුද්ධ ප්‍රතිපාදනය | වියදම | ඉතිරි ප්‍රතිපාදනය | වියදම් ප්‍රතිශතය (%) |
|---|---:|---:|---:|---:|
| කම්කරු දෙපාර්තමේන්තුව | 6,098,800 | 5,965,635 | 133,165 | 94% |
| මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව | 3,733,000 | 3,275,000 | 458,000 | 88% |
| ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය | 1,000,000 | 1,000,000 | - | 100% |
| ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 300,000 | - | 300,000 | - |
| කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය | 2,000,000 | 1,037,400 | 962,600 | 52% |
| කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය | 1,868,200 | 964,439 | 903,761 | 52% |
| මුළු එකතුව | **15,000,000** | **12,242,474** | **2,757,526** | **82%** |

## III. කම්කරු හා විදේශ සබඳතා අංශය

ජාත්‍යන්තර කම්කරු සංවිධානය සමග එම සංවිධානයේ සාමාජික රටක් ලෙස ශ්‍රී ලංකාව විසින් ඇති කරගත් බැඳීම, අන්තර්ජාතික වශයෙන් පිළිගත් සම්මුතීන් හා නිර්දේශයන් යටතේ මෙරට කම්කරු අයිතීන් සුරක්ෂිත කිරීම සහ කම්කරු ක්ෂේත්‍රයේ ගැටළු විසඳීම සඳහා උපයෝගී කර ගැනීමට අදාලව කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍යාංශය වෙනුවෙන් කටයුතු කිරීම මෙම අමාත්‍යාංශයේ කම්කරු හා විදේශ සබඳතා අංශය මගින් ඉටු කරනු ලබයි.

කම්කරු ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වන ජාත්‍යන්තර කම්කරු සංවිධානය හා අනෙකුත් බහුපාර්ශවීය නියෝජිත ආයතන උදෙසා සාමාජික රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ බැඳීම හා වගකීම් සපුරා ඇති බව සහතික කිරීම හා

කම්කරු ප්‍රතිපත්ති සම්පාදනය කිරීම, ජාතික මට්ටමේ සමාජ සංවාද ඇති කිරීම සහ මානව සම්පත් සංවර්ධනය සඳහා ජාත්‍යන්තර සහාය ලබා ගැනීම.

**අරමුණු**

- ගෝලීයකරණය සහ විවෘත ආර්ථිකය තුළ නිරතුරු අභියෝගවලට ලක්වන සේවක ජනතාවගේ අයිතීන් සුරක්ෂිත කිරීම සහ සේව්‍ය - සේවක දෙපාර්ශවය අතර වඩා යහපත් සම්බන්ධතාවයක් ඇති කරලීම සඳහා කටයුතු කිරීම ද ලංකාව විසින් අපරානුමත කර ඇති ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ කම්කරු ප්‍රඥප්තීන්, ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ප්‍රගතිය නියමිත කාල වකවානුව තුල ජාත්‍යන්තර කම්කරු සංවිධානය වෙත ඉදිරිපත් කිරීම.
- ශ්‍රී ලංකාව කම්කරු ක්ෂේත්‍රය සම්බන්ධව ලබා ඇති ප්‍රගතිය මත පදනම්ව ජාත්‍යන්තර ප්‍රජාව දැනුවත් කිරීමට කටයුතු කිරීම.
- කම්කරු ක්ෂේත්‍රය සම්බන්ධව පවතින ගැටළු විසඳීම සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මූල්‍ය හා තාක්ෂණික සහයෝගය ලබා ගැනීමට කටයුතු කිරීම.
- අමාත්‍යාංශය හා ඒ යටතේ වූ ආයතනවල නිලධාරීන් සඳහා විදේශ පුහුණුව ලබාදීමට ක්‍රියා කිරීම.
- නව නීති ඇති කිරීම හා පවත්නා කම්කරු නීති කාලයට ගැලපෙන ලෙස සංශෝධනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සහ සහාය ලබාදීම.

**2018 ජනවාරි 01 සිට 2018 දෙසැම්බර් 31 දක්වා කාර්යසාධනය**

- ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ව්‍යවස්ථා අංක 22 යටතේ යැවිය යුතු වාර්තා සම්පාදනය කිරීම. 2018 වර්ෂය සඳහා සම්මුතීන් 06 ක් සඳහා වාර්තා සම්පාදනය කිරීම සහ ව්‍යවස්ථා අංක 19 යටතේ යැවිය යුතු වාර්තාව සම්පාදනය කිරීම.

- වාර්ෂිකව ජිනීවාහී පැවැත්වෙන ජාත්‍යන්තර කම්කරු සමුළුව සඳහා ත්‍රෛපාර්ශවීය නියෝජිතයන් සහභාගී කරවීමට අදාළ සියලුම කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ පසුවිපරම් කටයුතු සිදු කිරීම.

- ත්‍රෛපාර්ශවීය නියෝජනයෙන් යුක්තව සෑම මසකම රැස්වන ජාතික කම්කරු උපදේශක සභාව (NLAC) සමාලෝචිත කාලය තුළ රැස්වීම් 06 ක් පවත්වා ඇත.

- EU GSP + සහනය ලබාගැනීම සම්බන්ධව ඇති ගැටළු නිරාකරණය කිරීමේ වාර්තාව සම්පාදනය කිරීම සහ GSP + බදු සහනය අධීක්ෂණය කිරීම සඳහා පත් කරනු ලැබූ ත්‍රෛපාර්ශවීය කමිටුවේ රැස්වීම් පැවැත්වීම හා ඊට අදාළ සියලු කටයුතු සංවිධානය කිරීම හා සහභාගීවීම.

- විදේශීය ශිෂ්‍යත්ව වැඩමුළු සහ පුහුණු වැඩසටහන් සඳහා මෙම අමාත්‍යාංශයට අදාළ අනෙකුත් ආයතන සහ කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහභාගී කිරීමට පියවර ගැනීම. 2018 වර්ෂය තුළ නිලධාරීන් 65 ක් විදේශ පුහුණු පාඨමාලා සහ වැඩමුළු සඳහා සහභාගී වී ඇත.

- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වාර්ෂිකව ප්‍රකාශයට පත් කරන කාලීන ආර්ථික සංවර්ධනයේ වැදගත් අංශ සහ ආර්ථික සංවර්ධනයේ ඉදිරි දැක්ම සම්බන්ධයෙන් වන වාර්තාවට අදාළ තොරතුරු සැපයීම සහ මහ බැංකු වාර්ෂික වාර්තාවට අදාළ තොරතුරු සම්පාදනය කිරීම.

- පෞද්ගලික අංශයේ සේවකයන්ගේ සේවා නියමයන් හා කොන්දේසි වලට අදාළව දැනට ක්‍රියාත්මක වන අණපනත්වල විෂමතාවයන් ඉවත් කර ගැනීම සඳහා මෙන්ම දැනට රටේ පවතින අවශ්‍යතාවයනට අනුව නම්‍යශීලි සේවා කොන්දේසි හඳුන්වා දීම සඳහා නව සේවා කොන්දේසි ඇතුළත් කර පනතක් හඳුන්වා දීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.

- ශ්‍රී ලංකාව හා විදේශ රටවල් අතර කම්කරු ක්ෂේත්‍රයට අදාලව සමාජ ආරක්ෂණ, අධ්‍යාපනය සම්බන්ධයෙන් ඉදිරියේදී ඇතිකර ගැනීමට නියමිත අවබෝධතා ගිවිසුම් හා ඒ සම්බන්ධ සියලු වැඩසටහන්වලට අදාළ ව කටයුතු කිරීම.

- ළමා ශ්‍රමය පිළිබඳ ජාතික ක්‍රියාකාරී කමිටුවට (NSCCL) අදාළ රැස්වීම් පැවැත්වීම හා ඊට අදාළ සියලුම කටයුතු සම්බන්ධීකරණය කිරීම.

- කම්කරු ක්ෂේත්‍රයට අදාළ ඇමරිකානු තානාපති කාර්යාලයෙන් විමසනු ලබන කරුණු සඳහා පිළිතුරු යැවීම.

- විදේශ කටයුතු අමාත්‍යාංශය සහ අනෙකුත් රජයේ අමාත්‍යාංශ වෙත කම්කරු ක්ෂේත්‍රයට අදාළ වන නව ප්‍රවණතා පිළිබඳ වාර්තා සම්පාදනය කිරීම.

- කම්කරු ක්ෂේත්‍රයේ සහයෝගීතාව ගොඩනැංවීම උදෙසා සිදු කරන ලද ශ්‍රී ලංකාවේ සහ විදේශීය නිල දූත සංචාර සම්බන්ධව කටයුතු කිරීම.

- ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ තාක්ෂණික සහයෝගීතාවය ඇතිව ක්‍රියාත්මක කරන ව්‍යාපෘති හා වැඩමුළුවලට අදාළව සියලුම සම්බන්ධීකරණ කටයුතු කිරීම.

- අපරානුමත කරන ලද 2006 සමුද්‍රීය කම්කරු සම්මුතිය සහ 2003 අංක 185 දරණ මුහුදු යන්නන්ගේ අනන්‍යතා ලියවිලි පිළිබඳ අවශ්‍ය කටයුතු සිදු කිරීම.

- බලහත්කාර ශ්‍රමය පිළිබඳ 29 වන මූල ලේඛය අපරානුමත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

- දකුණු අප්‍රිකානු සමාජ කතිකාව යාන්ත්‍රණය අධ්‍යයනය කිරීම හා වත්මන් ජාතික කම්කරු උපදේශන සභාවේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමේ අරමුණින් සාමාජිකයන් 10 දෙනෙකුගෙන් සමන්විත ත්‍රෛපාර්ශවීය නියෝජිත පිරිසක් දකුණු අප්‍රිකාවේ අධ්‍යයන චාරිකාවක් සඳහා සහභාගි කරවීම අදාළ කටයුතු සම්පාදනය කිරීම.

- ඇමරිකා එක්සත් ජනපදයේ පැවැත්වූ ළමා ශ්‍රමය තුරන් කිරීමේ IV වන ගෝලීය සමුළුව සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කිරීම වෙනුවෙන් අමාත්‍යාංශයේ නිලධාරීන් සහභාගි කරවීම හා එමඟින් ලෝකයේ ළමා ශ්‍රමය තුරන් කළ රටවල් අතුරින් ශ්‍රී ලංකාව ආදර්ශ රටක් ලෙස (Pathfinder Country) නම් කරනු ලැබීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.

- ශ්‍රම බලකාය තුළ කාන්තා සහභාගිත්වය අවම වීමට හේතු, අවිධිමත් ක්ෂේත්‍රයේ සේවා නියුක්තිකයන්ගේ අවශ්‍යතා අවබෝධ කර ගැනීම, තෙවන පාර්ශවීය ගිවිසුම් යටතේ සාධාරණ සේවා නියුක්තියක් ඇති කිරීම, සේවකයන්ගේ අවම වේතනය තීරණය කිරීමේ ක්‍රමවේදය, වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ පවතින ගැටලු, ප්‍රධාන අභියෝගතා සහ ඒ සඳහා ගතහැකි ක්‍රියාමාර්ග, සාමූහික කේවල් කිරීම් ප්‍රවර්ධනය කිරීමේ අභියෝගතා, කම්කරු නීති ඒකාබද්ධ කිරීමේ අවශ්‍යතා යන මාතෘකා යටතේ ත්‍රෛපාර්ශවීය වැඩමුළු මාලාවක් ප්‍රාදේශිය මට්ටමින් සංවිධානය කිරීම.

- අමාත්‍යාංශයට අදාළ ක්‍රියාත්මක වන සියලුම ආකාරයේ ප්‍රතිපත්ති සැකසීම සඳහා මූලිකත්වය දැරීම.

- කම්කරු ක්ෂේත්‍රයට අදාළ අණපනත් ප්‍රතිපත්තීන් සංශෝධනය කිරීම සහ නව පනත් ආරම්භ කිරීම පිළිබඳ කරුණු, ප්‍රවණතාවයන් හා අවශ්‍යතාවයන් පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා විශේෂිත කමිටුවක් වන කම්කරු නීති හා ප්‍රතිපත්තීන් සම්බන්ධයෙන් අමාත්‍යාංශ කමිටු රැස්වීම පැවැත්වීම.

- ශ්‍රී ලංකාවේ මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම (NHRAP 2017-2021) ට අදාල ප්‍රගතිය සම්බන්ධ වාර්තා සම්පාදනය කිරීම හා එහි අන්තර්ගත ''කම්කරු අයිතිවාසිකම්'' පරිච්ඡේදයට අදාළව සඳහන් කර ඇති අරමුණු හා ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය සැලසුම් සකස් කිරීම.

- “සුනිසි මෙහෙවර වැඩසටහන” (DWCP) යටතේ වන කාර්ය බලකා රැස්වීම් සඳහා අදාළ කටයුතු සම්පාදනය හා ඊට අවශ්‍ය සහයෝගය ජාත්‍යන්තර කම්කරු සංවිධානයට ලබාදීම

## IV. මුදල් අංශය

වැය ශීර්ෂ 193 කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රගතිය 2018 ජනවාරි මස 01 දින සිට සිට දෙසැම්බර් මස 31 දින දක්වා පහත සඳහන් පරිදි වේ.

| වැඩසටහන | ව්‍යාපෘතිය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය (රු) | වියදම (රු) | ඉතිරි ප්‍රතිපාදනය (රු) | ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|---|---|
| | 1 | පුනරාවර්තන | 29,661,000 | 25,144,653 | 4,516,347 | 85 |
| | | මූලධන | 1,582,065 | 1,317,708 | 264,357 | 83 |
| | | එකතුව | 31,243,065 | 26,462,361 | 4,780,704 | 85 |
| 1 | 2 | පුනරාවර්තන | 80,794,000 | 76,688,940 | 4,105,060 | 95 |
| | | මූලධන* | 258,414,625 | 60,828,802 | 197,585,823 | 24 |
| | | එකතුව | 339,208,625 | 137,517,742 | 201,690,883 | 41 |

* මෙහෙවර පියස ගොඩනැගිල්ලේ අභ්‍යන්තර නිර්මාණ කටයුතු වෙනුවෙන් ලබාදුන් ප්‍රතිපාදනයෙන් රු.මි. 75 ක ප්‍රතිපාදන කම්කරු දෙපාර්තමේන්තුව වෙත වෙන් කර දී ඇත.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1 | 11 | පුනරාවර්තන | 18,885,000 | 4,418,975 | 14,466,025 | 23 |
| | | මූලධන | 1,950,000 | - | 1,950,000 | 0 |
| | | එකතුව | 20,835,000 | 4,418,975 | 16,416,025 | 19 |
| 2 | 3(2) | පුනරාවර්තන | 12,000,000 | 11,850,790 | 149,210 | 99 |
| | | මූලධන | 1,500,000 | 1,500,000 | - | 100 |
| | | එකතුව | 13,500,000 | 13,350,790 | 149,210 | 99 |
| 2 | 3(3) | පුනරාවර්තන | 6,000,000 | 4,178,600 | 1,821,400 | 69 |
| | | මූලධන | 7,000,000 | 690,291 | 6,309,709 | 10 |
| | | එකතුව | 13,000,000 | 4,868,891 | 8,131,109 | 37 |
| 2 | 4 | පුනරාවර්තන | 52,782,400 | 52,401,693 | 380,707 | 99 |
| | | මූලධන | 460,000 | 146,694 | 313,306 | 32 |
| | | එකතුව | 53,242,400 | 52,548,387 | 694,013 | 99 |
| 2 | 5 | පුනරාවර්තන | 33,400,000 | 33,080,528 | 319,472 | 99 |
| | | මූලධන | 3,850,000 | 498,867 | 3,351,133 | 13 |
| | | එකතුව | 37,250,000 | 33,579,395 | 3,670,605 | 90 |
| 2 | 6 | පුනරාවර්තන | 25,405,000 | 4,763,357 | 20,641,643 | 18 |
| | | මූලධන** | 505,980,310 | 1,432,964 | 504,547,346 | 0.3 |
| | | එකතුව | 531,385,310 | 6,196,321 | 525,188,989 | 1 |
| | **මුළු එකතුව** | පුනරාවර්තන | 258,927,400 | 212,527,536 | 46,399,864 | 82 |
| | | මූලධන | 780,737,000 | 6,415,326 | 714,321,674 | 9 |
| | | එකතුව | 1,039,664,400 | 278,942,862 | 760,721,538 | 27 |

** සබරගමුව සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ලබා දී තිබූ රු.මි.500 ක ප්‍රතිපාදන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය වෙත වෙන් කර දී ඇත

# කම්කරු දෙපාර්තමේන්තුව

1923 අංක 01 දරන ඉන්දියානු ආගාමික කම්කරු ආඥා පනතට අනුව ආරම්භය සනිටුහන්වන කම්කරු දෙපාර්තමේන්තුව, මෙරට කම්කරු ප්‍රජාවගේ ප්‍රගමනය උදෙසා ක්‍රියාත්මක වන ප්‍රමුඛ ආයතනය වේ. ශ්‍රී ලංකා ආර්ථිකයෙහි වැඩි දායකත්වයක් උසුලන පෞද්ගලික සහ අර්ධ රාජ්‍ය අංශයට අයත් ශ්‍රම බලකායේ වැටුප්, සේවා කොන්දේසි, රැකියා සුරක්ෂිතතාවය, සෞඛ්‍යය හා සුබසාධනය උදෙසා අදාල නීතිරීති සකස්කර ක්‍රියාවට නැංවීම සහ කාර්මික සාමය පවත්වා ගැනීම තුළින් ජාතික ආර්ථිකය ශක්තිමත් කරලීම කම්කරු දෙපාර්තමේන්තුවේ මූලික කාර්යභාරය වේ.

දිවයින පුරා විසිරී සිටින කම්කරු ජනතාවගේ විවිධ අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය බහුවිධ සේවාවන් සලසමින් යහපත් හා වඩාත් සංවිධිත සාමකාමී කාර්මික පරිසරයක් සිය කාර්යභාරය ලෙස සලකා කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයට අනුබද්ධව ප්‍රධාන අංශ 13 ක් ක්‍රියාත්මකව පවතින අතර, දිවයින පුරා විසිරී සිටින කම්කරු ප්‍රජාවගේ අපේක්ෂිත සේවා පහසුකම් සපුරා ගැනීමට නීතිමය රැකවරණයත්, සුභසාධනයත් සැලසීමේ අදිටනින් කලාප කම්කරු කාර්යාල 11 ක් ද, දිස්ත්‍රික් කම්කරු කාර්යාල 40 ක් ද, උප කම්කරු කාර්යාල 17 ක් හා දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල 10 ක් ද කම්කරු දෙපාර්තමේන්තුවේ කටයුතු විමධ්‍යගත කිරීම යටතේ, දිවයින පුරා පිහිටුවා ඇත. 2018 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය මණ්ඩලය 2669 කි.

### දැක්ම

ජාත්‍යන්තර තරඟකාරී ආර්ථිකයක් සඳහා කාර්මික සාමය තහවුරු වූ රටක් ගොඩනැගීමට දායක වීම


### මෙහෙවර

කාර්මික සාමය තහවුරු කල යහපත් වැඩ පරිසරයක් තුල සේවක අයිතිවාසිකම් සුරක්ෂිත කරමින් ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම

### කාර්යභාරය

- කම්කරු සුභසාධනය හා ප්‍රවර්ධනය උදෙසා සුසැදි අණපනත් ක්‍රියාවට නැංවීම සහ කාර්මික ආරවුල් සමථයකට පත් කිරීම.
- කම්කරු ප්‍රජාව පාදක කරගත් සමාජ ආරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- කම්කරු ක්ෂේත්‍රය පිළිබඳව සමීක්ෂණ පැවැත්වීම, කම්කරු ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනයට හා කම්කරු ප්‍රජාවගේ අභිවෘද්ධියට පාදක වන ව්‍යාපෘති හඳුනාගැනීම, සැලසුම් සකස් කිරීම, බාහිර හා අභ්‍යන්තර දැනුවත් කිරීමේ හා අධ්‍යාපනය ලබාදීමේ කටයුතු සිදු කිරීම.
- කම්කරු ක්ෂේත්‍රයට අදාළ පාර්ශවකරුවන් අතර සමාජ කතිකාවත ප්‍රවර්ධනය කිරීම.
- කම්කරු ක්ෂේත්‍රයට අදාළ සංඛ්‍යාලේඛන රැස් කිරීම, විශ්ලේෂණය කිරීම හා ඉදිරිපත් කිරීම.
- වෘත්තීය සමිති සමග සබඳතා යහපත්ව හා සජීවී අයුරින් පවත්වාගෙන යාම.
- ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ශ්‍රී ලංකා නියෝජිතයා වශයෙන් කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය සමග සහයෝගයෙන් හා සජීවී ආකාරයෙන් කටයුතු කිරීම


# කම්කරු දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය



## කම්කරු පරීක්ෂණ

ජාත්‍යන්තර තරඟකාරිත්වය හමුවේ දේශීය නිෂ්පාදන රැක ගනිමින් ජාතික ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා වැඩපොළ සහයෝගීතාවය සහ කාර්මික සාමය අත්‍යවශ්‍ය සාධකයන් වේ. ඒ සඳහා කම්කරු පරීක්ෂණ මගින් විශාල පිටිවහලක් ලැබේ. විධිමත් කම්කරු පරීක්ෂණ ක්‍රියාවලියක් තුලින් වැඩපොළ අනතුරු අවම කිරීමත්, නියමිත වැටුප් හා කොන්දේසි ක්‍රියාත්මක කිරීමත්, සේවකයන්ගේ විශ්‍රාමික දිවිය සඳහා සමාජ ආරක්ෂණය ඇති කිරීමත් කාර්මික සාමය ස්ථාපනය වීමත් සිදු වේ.


2018 වර්ෂයේදී කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු නිලධාරීන් විසින් සිදුකළ ශ්‍රමික පරීක්ෂණ සංඛ්‍යාව 71270 කි. එය පසුගිය වසර 05 තුළදී සිදුකළ ඉහළම කම්කරු පරීක්ෂණ සංඛ්‍යාව වේ. 2017 වර්ෂයේදී බඳවා ගන්නා ලද නවක කම්කරු නිලධාරීන් සේවය ඵලදායීව ප්‍රයෝජනයට ගැනීම මේ සඳහා ඉවහල් වී ඇත.




සටහන - දැනට ලැබී ඇති දත්ත අනුව ඉහත ප්‍රස්තාරය සකස් කර ඇති බැවින් 2018 වර්ෂයේ දත්ත වෙනස්විය හැකිය.

## කාර්මික ආරවුල් විසඳීම

2018 වර්ෂයේදීද කම්කරු ආරවුල් ප්‍රමාණය අවම වීමට කම්කරු දෙපාර්තමේන්තුවේ විවිධ අංශ මගින් ක්‍රියාත්මක කළ විවිධ වැඩසටහන් බලපා ඇති අතර, ඒ පිළිබඳව විමර්ශනය කිරීමේදී දෘශ්‍යමාන හේතු ලෙසට සිදු කරන ලද කම්කරු පරීක්ෂණ සහ කම්කරු දෙපාර්තමේන්තුවේ විවිධ අංශ මගින් ජනමාධ්‍ය ඉවහල් කර ගනිමින් කරනු ලැබූ විවිධ දැනුවත් කිරීමේ වැඩසටහන් පුළුල් වීම යන කරුණු බලපා ඇති බව පෙනී යයි.




සටහන - 2018 වර්ෂය සඳහා දැනට ලැබී ඇති දත්ත අනුව ඉහත ප්‍රස්තාරය සකස් කර ඇති බැවින් මෙම දත්ත වෙනස්විය හැකිය.

## සාමූහික ගිවිසුම් ලියාපදිංචි කිරීම

සේවකයන්ට කම්කරු නීති රීතිවලින් ලබාදී ඇති අයිතිවාසිකම් සහ වරප්‍රසාදවලට වඩා වැඩි වරප්‍රසාද ලබා ගැනීමට සාමූහික ගිවිසුම් නිසා හැකි වේ. ඒ අනුව, 2018 වර්ෂය තුළ ලියාපදිංචි කරන ලද සාමූහික ගිවිසුම් සංඛ්‍යාව 60 කි.

## වෘත්තීය සමිති කටයුතු

2018 වර්ෂය තුළදී ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිති / සම්මේලන සංඛ්‍යාව 183 ක් වන අතර අවලංගු කළ වෘත්තීය සමිති / සම්මේලන සංඛ්‍යාව 83 කි. ඒ අනුව 2018 වර්ෂය අවසන්වන විට ක්‍රියාත්මක වෘත්තීය සමිති / සම්මේලන සංඛ්‍යාව 1909 කි

## කාර්මික අධිකරණ කටයුතු

2018 වර්ෂයේදී අනිවාර්ය බේරුම්කරණයට යොමු කිරීම් 72 ක්ද ප්‍රධාන නිකුත් කිරීම් 43 ක්ද සිදුකර ඇත.


## සේවය අවසන් කිරීමේ කටයුතු

සේවය අවසන් කිරීම සම්බන්ධයෙන් 2018 වර්ෂය තුළ ලැබුනු පැමිණිලි සංඛ්‍යාව 224 ක් වන අතර වර්ෂය තුල විසඳූ සංඛ්‍යාව 154 කි. සේවය අවසන් කිරීම සම්බන්ධයෙන් ලැබුනු ඉල්ලුම්පත් සම්බන්ධයෙන් අවසර ලබා දීම් 46 ක් සිදුකර ඇත.

## වැඩ වර්ජන වාර්තා වීම්

අර්ධ රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ සේවක ප්‍රජාව විසින් 2018 වර්ෂයේදී වාර්තාවූ වැඩවර්ජන පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

## වැඩ වර්ජන වාර්තා වීම



## නීති කටයුතු

කම්කරු නීති උල්ලංඝනය කරන්නන්ට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමත් ඒ තුළින් සේව්‍ය සේවක අයිතීන් සුරක්ෂිත කරමින් සේව්‍ය සේවක සහයෝගීතාවය වර්ධනය කිරීමත් දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි.

2018.01.01 දින සිට 2018.12.31 දින දක්වා අධිකරණවල ගොනුකළ නඩු පිළිබඳ තොරතුරු

| අධිකරණය | 2018 වර්ෂයට ඉදිරියට ගෙනා ශේෂය | 2018 වර්ෂයේදී පැවරූ නඩු සංඛ්‍යාව | 2018 වර්ෂයේදී අවසන් නඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණය | 181 | 24 | 0 |
| අභියාචනාධිකරණය | 336 | 47 | 0 |
| මහාධිකරණය | 173 | 50 | 49 |
| දිසා අධිකරණය හා වාණිජ මහාධිකරණය | 210 | 17 | 11 |

2018.01.01 දින සිට 2018.12.31 දින දක්වා දිවයින පුරා කම්කරු කාර්යාලවල පවරන ලද නඩු පිළිබඳ තොරතුරු

| | අදාල පනත | පවරන ලද නඩු සංඛ්‍යාව | අවසන් නඩු සංඛ්‍යාව | අයකරගත් මුදල රු. මිලියන |
|---|---|---|---|---|
| 1 | පාරිතෝෂික ගෙවීම් පනත | 753 | 530 | 88.71 |
| 2 | කාර්මික ආරවුල් පනත | 34 | 08 | 1.15 |
| 3 | සේවය අවසන් කිරීමේ පනත | 15 | 06 | 0.73 |
| 4 | පඩි පාලක සභා ආඥා පනත | 174 | 37 | 6.12 |
| 5 | සාප්පු හා කාර්යාල සේවක පනත | 71 | 09 | 0.1 |
| 6 | ප්‍රසූතිකාධාර ආඥා පනත | 2 | - | - |
| 7 | ස්ත්‍රීන් තරුණ අය සහ ළමයින් සේවයේ යෙදවීම පිළිබඳ පනත | 3 | 1 | - |
| 8 | සේවක අර්ථසාධක අරමුදල් පනත | 1986 | 1352 | 1120.9 |
| 9 | කම්කරු විනිශ්චය සභා නියෝග | 63 | 12 | 4.2 |
| 10 | අයවැය සහන දීමනා පනත | 128 | 16 | 0.08 |
| 11 | අනුමත අර්ථසාධක අරමුදල් | 25 | 1 | 0.001 |

## සේවක අර්ථසාධක අරමුදල් කටයුතු

ශ්‍රී ලංකාවේ සේවක ප්‍රජාවගේ විශ්‍රාම දිවිය සුරක්ෂිත කිරීම සඳහා ආකර්ෂණීයම සමාජ ආරක්ෂණ ක්‍රමය වන සේවක අර්ථසාධක අරමුදල කම්කරු දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලැබේ. එහි 2018 වර්ෂයේ ප්‍රගතිය පහත පරිදි වේ.

| | | 2018.12.31 දිනට |
|---|---|---|
| සමස්ත සාමාජික ගිණුම් සංඛ්‍යාව | | 18,032,464* |
| මුළු සේවායෝජක සංඛ්‍යාව | | 229,048* |
| අරමුදලේ වටිනාකම (රු. මිලියන) | | 2,183,308* |
| සක්‍රිය සාමාජික සංඛ්‍යාව (මිලියන) | | 2.7* |
| සක්‍රිය සේවායෝජක සංඛ්‍යාව | | 76,782* |
| නව ලියාපදිංචි කිරීම් | සාමාජිකයන් | 417,041* |
| | සේවායෝජකයන් | 9267* |
| | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 55658* |
| | ගෙවූ ප්‍රතිලාභ මුදල (රු. මිලියන) | 50415* |
| දායක මුදල් රැස් කිරීම (රු. මිලියන) | | 70956* |
| සේ.අ.අ. නිවාස ණය | අනුමත කළ අයදුම්පත් සංඛ්‍යාව | 4805* |
| | අනුමත කල ණය මුදල් වටිනාකම (රු. බිලියන) | 2.12* |

*සටහන - 2018.06.30 දිනට ඇස්තමේන්තුගත දත්ත වේ.

2018 වසර තුළ සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ලැබූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව

| ප්‍රතිලාභය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|
| විශ්‍රාම වයසට එළඹී සේවයෙන් ඉවත් වූ පසු සේ.අ.අ. ප්‍රතිලාභ ගෙවීම | 88,690 |
| විවාහ හේතුමත සේවයෙන් ඉවත්වූ කාන්තා සාමාජිකාවන්ට ප්‍රතිලාභ ගෙවීම | 22,522 |
| පූර්ණ දුබලතාවයට පත්වීම නිසා සේවයෙන් ඉවත්වීම හේතුවෙන් ප්‍රතිලාභ ගෙවීම | 1,038 |
| මියගිය සාමාජික ප්‍රතිලාභ | 4,944 |
| 30% විශ්‍රාම පූර්ව ප්‍රතිලාභ | 29,876 |
| විදේශ රටක ස්ථිර පදිංචියට යෑම නිසා ප්‍රතිලාභ ගෙවීම | 2,067 |
| රාජ්‍ය සේවයේ හෝ පලාත් රාජ්‍ය සේවයේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත පත්වීමක් ලැබීම නිසා සේවයෙන් ඉවත්වීම හේතුවෙන් ප්‍රතිලාභ ගෙවීම | 7,215 |
| රාජ්‍ය සංස්ථාවක් / මණ්ඩලයක් වසා දැමීම, වියදම් අඩුකිරීමට සේවකයන් ඉවත්කිරීම හෝ සමාගමක් බවට පරිවර්තනය කිරීම හේතුවෙන් සේවය හැරගිය සේවකයන්ට ප්‍රතිලාභ ගෙවීම | 662 |

- සේවක අර්ථසාධක අරමුදල් සාමාජිකයන්ගේ ලියාපදිංචි තොරතුරු සංශෝධනය මෙම වර්ෂයේ මැද භාගයේ සිට දිස්ත්‍රික් කම්කරු කාර්යාල වෙත විමධ්‍යගත කිරීමට කටයුතු කර ඇත.
- සේවක අර්ථසාධක අරමුදලේ 30% පූර්ව ප්‍රතිලාභ ගෙවීම් කටයුතු සඳහා සියලු කම්කරු කාර්යාල වෙත ඒකාකාරී ක්‍රමවේදයක් හඳුන්වා දී ඇත .
- සේවක අර්ථසාධක අරමුදලේ 75% නිවාස ණය ලබාදීමේ ක්‍රමවේදය විධිමත් කිරීමට කටයුතු කර ඇත .
- සේවක අර්ථසාධක අරමුදල් ප්‍රවර්ධනය සඳහා 2018 වර්ෂය තුළ ජංගම සේවා වැඩසටහන් 30 ක් පවත්වා ඇති අතර රූපවාහිනී නාලිකා දෙකක හා ගුවන්විදුලි නාලිකා දෙකක සේවක අර්ථසාධක අරමුදල පිළිබඳ දැන්වීම් ප්‍රචාරය කරන ලදී.

## සමාජ කතිකාව

සමාජ කොටස්කරුවන් අතර සන්නිවේදනය, අදහස් විමසීම හා එක්ව තීරණ ගැනීම ප්‍රචලිත කිරීම සඳහා ඔවුන් අතර කතිකාව සහ සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම තුළින් කාර්මික සාමය හා සංහිඳියාව පවත්වාගෙන යාමෙන් ආර්ථික සමෘද්ධිය උදාකර ගැනීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුව කැපවී සිටී. ඒ අනුව, සමාජ කතිකාවත ප්‍රවර්ධනය උදෙසා 2018 වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් සිදු කළ ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

| | | ආයතන වැඩමුළු | අර්ධ රාජ්‍ය අංශය සඳහා වැඩමුළු | කළමනාකරුවන් හා සේවකයන් සඳහා වැඩමුළු |
|---|---|---|---|---|
| සමාජ කතිකා අංශය මඟින් | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | 60 | 10 | 10 |
| | සහභාගි වූ සේවක සංඛ්‍යාව | 2,918 | 541 | 410 |
| දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාල මඟින් | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | 54 | - | - |
| | සහභාගි වූ සේවක සංඛ්‍යාව | 2,232 | - | - |

සමාජ කතිකා හා වැඩපොළ සහයෝගිතා සංකල්පය ප්‍රවර්ධනය සඳහා සමාජ කතිකා හා වැඩපොල සහයෝගිතා දීපව්‍යාප්ත තරඟාවලිය සංවිධානය කොට පැවැත්වීමද කම්කරු දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව සිදුකරනු ලබන අතර 2018 වර්ෂයේදී ද එම තරඟාවලිය සාර්ථකව පවත්වා ජයග්‍රාහකයන් වෙත සම්මාන පිරිනමන ලදී. සමාජ කතිකා හා වැඩපොල සහයෝගිතා සංකල්පය ප්‍රශස්ත මට්ටමින් ක්‍රියාත්මක ආයතන ඇගයීම හා සේවක සේවිකාවන්ගේ නිර්මාණ කුසලතා ඇගයීම සඳහා ආයතන මට්ටමින් පැවැත්වෙන දීප ව්‍යාප්ත සමාජ කතිකා විශිෂ්ඨතා සම්මාන තරඟාවලිය සහ ආයතනයන්හි සේවක/සේවිකාවන්ගේ නිර්මාණ තරඟාවලිය යන දෙඅංශයෙන් මෙම තරඟාවලිය පවත්වන ලදී. එසේම, සමාජ කතිකාව හා වැඩපොල සහයෝගිතාව පණිවිඩය ව්‍යාප්ත කිරීමේ අරමුණ ඇතිව ඒ පිළිබඳව සම්පාදනය වන ලිපි, රචනා හා නිර්මාණ එකතුවක් ලෙස වාර්ෂිකව එළිදක්වනු ලබන කතිකාව පුවත් සඟරාව 2018 වර්ෂයේදීද මුද්‍රණය කර එළිදක්වන ලදී.

## ශ්‍රම ප්‍රමිති

පෞද්ගලික අංශයේ සේවා නියුක්ත වූවන්ගේ රැකියා සුරක්ෂිතතාවය සහ සුභසාධනය කෙරෙහි බලපාන සේවා තත්ත්වයන් හා සේවා කොන්දේසි පිළිබඳව ප්‍රමිතීන් සැකසීම හා ඒවාට නෛතික තත්ත්වයන් ලබා දීමට කටයුතු කිරීම හා අධීක්ෂණය කිරීමද දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ.

ඒ අනුව පහත ක්‍රියාකාරකම් සිදු කර ඇත

- නිල කාලය අවසන්වන පඩි පාලක සභා 06ක් සඳහා නියෝජිතයන් පත් කිරීම.
- අවම වේතනය රු. 10,000ට අඩු පඩි පාලක සභා 19ක වේතන ඉහළ නැංවීම.
- කොකෝවා, කරදමුංගු හා ගම්මිරිස් වැවීමේ හා සෑදීමේ කර්මාන්තයේ මාසික වැටුප් ප්‍රසිද්ධ කිරීම. (ඔක්තෝබර් මාසය සඳහා)
- දින පහේ සතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා දීම් 269 ක් සිදුකිරීම.
- සාමූහික ගිවිසුම් සඳහා නීතිමය වලංගුභාවය පරීක්ෂා කිරීම් 61 ක් සිදු කිරීම.
- තේ වැවීමේ හා සෑදීමේ කර්මාන්තයේ ආඥාව නැවත සකස් කිරීම හා ප්‍රසිද්ධ කිරීම.
- සාප්පු හා කාර්යාල සේවක පනත, පඩි පාලක සභා ආඥා පනත, අයවැය සහන දීමනා පනත සහ අවම වේතන පනත පිළිබඳව නවක කම්කරු නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- අංශයට අදාල අණ පනත් සියල්ල පරිලෝකනය කර දෙපාර්තමේන්තු වෙබ් අඩවියට ඇතුලත් කිරීම සහ පඩි පාලක සභා 11ක තීරණ දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම

## කාන්තා හා ළමා කටයුතු

කාන්තා හා ළමා රැකවරණය, සුරක්ෂිතභාවය සහ අයිතීන් සුරැකීම, කාන්තාවන් බල ගැන්වීමේ වැඩසටහන් තුලින් ශ්‍රම ප්‍රවර්ධනය හා ළමා ශ්‍රමය පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම හා නීති ක්‍රියාත්මක කිරීම දෙපාර්තමේන්තුව සතු සුවිශේෂී කාර්යභාරයක් වේ.

ඒ අනුව, 2018 වර්ෂයේ දී පහත ක්‍රියාකාරකම් සිදු කර ඇත.

- **පනත් සංශෝධනය**

2018 වර්ෂයේ ජූනි මස 18 වන දින 2018 අංක 14 දරණ සාප්පු හා කාර්යාලීය සේවකයන් පිළිබඳ පනත හා 2018 අංක 15 දරණ සූතිකාධාර පනත යන පනත් වල සංශෝධනයක් සිදු කරන ලදී.
එසේම, 1956 අංක 47 දරණ ස්ත්‍රීන් හා තරුණ අය හා ළමයින් සේවයේ යෙදවීමේ පනතේ අංක 24 දරණ සංශෝධනය අනුව පනතේ 20 (අ) වගන්තිය යටතේ පනවා ඇති රෙගුලාසි යටතේ වයස අවුරුදු 18ට අඩු කිසිවෙකු අනතුරුදායක රැකියා වල හෝ රැකියාවක යෙදවීම තහනම් කොට ඇති බැවින් 2018 වර්ෂයේ දී අනතුරුදායක රැකියා ලැයිස්තුව සංශෝධනය කොට වයස අවුරුදු 18ට අඩු පුද්ගලයන්ගේ කායික හා මානසික සෞඛ්‍යයට හා ආරක්ෂාවට හානිකර රැකියා 77ක් හඳුනාගෙන ඒ සඳහා කැබිනට් අනුමැතිය ලබා ගැනීමට කටයුතු සූදානම් කරන ලදී.

- **ජාත්‍යන්තර කාන්තා දිනය (2018.03.08)**

වතු වැවිලි ක්ෂේත්‍රයේ බහුතරය කාන්තාවන්ය. ඔවුන් ශ්‍රී ලාංකීය ආර්ථිකය උදෙසා සිදු කරනු ලබන අමිල මෙහෙවර ඇගයීමට ලක් කිරීම, වතු වැවිලි ක්ෂේත්‍රයේ ශ්‍රම දායකත්වය උදෙසා කම්කරු දායකත්වය හීන වීම නිසා ඇති වන සේවා ඉල්ලුම සැපයීම සඳහා නවක කම්කරු ප්‍රජාව දිරි ගැන්වීම හා දීර්ඝ කාලයක් වතු කම්කරු කාන්තාවන් සේවා සැපයීමට රාජ්‍ය මට්ටමින් ඇගයීමට ලක් නොකිරීම නිසා රාජ්‍ය මට්ටමින් ඇගයීමට ලක් කිරීම අරමුණින් මෙම වර්ෂයේ කාන්තා දිනය සඳහා සම්මාන පිරිනැමීමේ වැඩසටහනක් පවත්වන ලදී.

එහිදී තේ හා රබර් වැවිලි ක්ෂේත්‍රයේ වතු සමාගම් ආශ්‍රිතව සේවය කරනු ලබන වසර 20කට වැඩි අඛණ්ඩ සේවා කාලයක් ඇති උද්යෝගිමත් ඵලදායිතාවයෙන් ඉහළ ගුණාත්මක සේවාවක් ලබා දෙන දිරිය කාන්තාවන් 105 දෙනෙකු උදෙසා ''දිරිය රන්ලිය'' ශ්‍රමාභිමානි සම්මානය පිරිනමන ලදී .

- **ලෝක ළමා ශ්‍රම විරෝධී දිනය (2018.06.12)**

ශ්‍රී ලංකාවේ ළමා ශ්‍රමය හා අනර්ථකාරී රැකියා අවම කිරීම තුළින් දරු පරපුරට සුරක්ෂිත පරිසරයක් නිර්මාණය කිරීම හා එමගින් දරුවන්ගේ කායික, මානසික සංවර්ධනය ඇති කිරීම, සෞඛ්‍ය හා අධ්‍යාපනය ඉහළ නැංවීමෙන් රටෙහි තිරසාර සංවර්ධනය ඇති කිරීම අරමුණු කර ගනිමින් කම්කරු දෙපාර්තමේන්තුවේ කාන්තා හා ළමා කටයුතු අංශය විසින් දීප ව්‍යාප්ත අනර්ථකාරී ශ්‍රම වැටලීමේ හා දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.

- **ලෝක ළමා දින සැමරුම ( 2018.10.01)**

ලෝක ළමා දින සැමරුම - 2018 වැඩසටහන කම්කරු දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලැබුයේ 2018 වර්ෂයේ ඔක්තෝබර් 01 වන දිනය. එහිදී, දිවයිනේ විවිධ ප්‍රදේශ වලට කේන්ද්‍රගත වූ කර්මාන්තයන් ආශ්‍රිතව පවත්නා ළමා ශ්‍රම සැපයුම අවම කර, අඛණ්ඩව වසර පුරා පාසල් අධ්‍යාපනයට එම දරුවන් යොමු කිරීම සඳහාත්, පාරම්පරිකව උරුම වන රැකියාවෙන් (ජීවනෝපායෙන්) ඔබ්බට ගොස් වෘත්තීන්හි නියැලීමට ඇති හැකියාව පිළිබඳ වෘත්තීය මාර්ගෝපදේශනයත් ඇතුළත් වැඩසටහන් 05ක් තෝරා ගත් පාසල් 05ක් තුළ පැවැත්විය.

එහිදී, මෙම වැඩසටහන් වල ප්‍රධාන වැඩසටහන බස්නාහිර II කලාප කම්කරු කාර්යාලයේ සංවිධානත්වයෙන් කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී පැවැත්වුනි. ඊට අමතරව දකුණු කලාප කම්කරු කාර්යාලය මගින් හික්කඩුව කුමාරකන්ද විද්‍යාවර්ධන විද්‍යාලයේදී පැවැත්වුනු අතර මධ්‍යම කලාප කම්කරු කාර්යාලය මගින් නුවරඑළිය වජිරඥාන මහා විද්‍යාලයේදී පැවැත්වුනි. වයඹ කලාප කම්කරු කාර්යාලය මගින් සංවිධානය වූ වැඩසටහන හලාවත වැල්ලකොළණිය ශාන්ත සෙබස්තියන් විද්‍යාලයේදී පවත්වන ලද අතර නැගෙනහිර කලාප කම්කරු කාර්යාලය මගින් තිරුක්කෝවිල්, තම්බිලුවිල් මධ්‍ය මහා විද්‍යාලයේදී පැවැත්විය. එම පාසල් වලින් 8 - 10 ශ්‍රේණිය දක්වා වූ වයස් වල දරුවන් 50 දෙනෙකු බැගින් තෝරා ගෙන ( බස්නාහිර කලාප II කම්කරු කාර්යාලයේ පමණක් ළමුන් 100 දෙනෙකු සහභාගි විය) ඔවුන්ට මනෝවිද්‍යාත්මක හා වෘත්තීය පුහුණු උපදේශන වැඩසටහනක් පැවැත්වීම, ළමා ශ්‍රමය පිළිබඳව අවබෝධය ලබා දීම සමඟ දරුවන්ගේ ඉදිරි අධ්‍යාපනයට අත්වැලක් ලබා දීම සිදු විය.

- **ශ්‍රී ලංකාවේ ළමා ශ්‍රමය තුරන් කිරීමේ ව්‍යාපෘතිය යටතේ ළමා ශ්‍රමයෙන් තොර කලාප පිහිටුවීමේ 2018 වර්ෂයේ වැඩසටහන්**

ලෝක ළමා ශ්‍රම විරෝධී දිනයට සමගාමීව 2018.06.12 හා 2018.06.14 යන දෙදින තුළ කාන්තා හා ළමා කටයුතු අංශය, කලාප කාර්යාල, දිස්ත්‍රික් කාර්යාල හා උප කාර්යාල එක්ව මුළු දිවයිනම ආවරණය වන පරිදි ආයතන 472 ක් පරීක්ෂා කරන ලදී.

- **2018 වර්ෂයේ ළමා පැමිණිලි**

කාන්තා හා ළමා කාර්යාංශය, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, විවිධ පුද්ගලයන්ගෙන් නාමිකව හා නිර්නාමිකව ලැබෙන ළමයින් සේවයේ යෙදවීම සම්බන්ධ පැමිණිලි විභාග කර බැලීම හා ඒ සඳහා සේවා යෝජකයන්ට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම මෙම අංශය මගින් සිදු කරයි.

ඒ අනුව 2018 වර්ෂයේ ළමා පැමිණිලි පිළිබඳ ප්‍රගතිය පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| වර්ෂය තුළ ලද මුළු පැමිණිලි ගණන | 127 | |
| කටයුතු අවසන් කරන ලද ගොනු ගණන | පැමිණිල්ල ලද වර්ෂය | 2018 වර්ෂයේදී අවසන් කරන ලද පැමිණිලි ගණන |
| | 2016 | 13 |
| | 2017 | 40 |
| | 2018 | 76 |
| උසාවි ගත කරන ලද පැමිණිලි ගණන | 03 | |
| අවසන් කරන ලද නඩු ගණන | 01 | |

- **කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීම**

ආයතන වල කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීම සම්බන්ධව කලාප කාර්යාල හා දිස්ත්‍රික් කාර්යාල හා ඒකාබද්ධව පරීක්ෂණ 71 ක් දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ රු.246,500/= ක ප්‍රතිපාදන යොදා ගනිමින් සිදු කරන ලදී.

| | |
|---|---|
| සිදු කළ රාත්‍රී පරීක්ෂණ සංඛ්‍යාව | 71 |
| වැය වූ මුදල | රු. 246 500 |
| ආවරණය වූ සේවිකාවන් සංඛ්‍යාව | 5943 |
| අනාවරණය වූ කොන්දේසි කඩවීම් සංඛ්‍යාව | 57 |
| නඩු පැවරීමට කටයුතු කරන ගොනු ගණන | 17 |

තවද, කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීම සඳහා කාන්තා හා ළමා කටයුතු අංශය විසින් අනුමැතීන් 51ක් ද දිස්ත්‍රික් හා උප කාර්යාල විසින් අනුමැතීන් 528ක් ද වශයෙන් රාත්‍රී සේවා අනුමැතීන් 579ක් ලබා දෙන ලදී.

- **දකුණු අප්‍රිකානු ජනරජයේ නියෝජ්‍ය කම්කරු අමාත්‍යවරයා හා දූත පිරිසේ ශ්‍රී ලංකා චාරිකාව**

ළමා ශ්‍රමය තුරන් කිරීම සඳහා සිදු කරනු ලබන කටයුතු පිළිබඳව අධ්‍යන චාරිකාවක යෙදීම සඳහා දකුණු අප්‍රිකානු ජනරජයේ නියෝජ්‍ය කම්කරු අමාත්‍යවරයා ඇතුළු විදේශීය දූත පිරිසක් 2018.10.07 වන දින ශ්‍රී ලංකාවට පැමිණෙන ලදී.

එහිදී ළමා ශ්‍රමය, කම්කරු නීතිය කේත ගත කිරීම, ආරවුල් විසඳීමේ යාන්ත්‍රණය, සමාජ කතිකාව හා ආබාධිත පුද්ගලයන් සඳහා රැකියා උපායමාර්ග යන කරුණු පිළිබඳව කටයුතු කිරීමට ප්‍රතිපත්තිමය වශයෙන් එකඟ විය.

## 2018 වර්ෂයේ අංශය විසින් පවත්වන ලද විශේෂ වැඩසටහන්

- **කොග්ගල කාන්තා නේවාසිකාගාරයේ පවත්වනු ලැබූ මනෝවිද්‍යා උපදේශන වැඩමුළුව**

කොග්ගල කාන්තා නේවාසිකාගාරයේ නේවාසිකාවන් සඳහා මනෝවිද්‍යාත්මක උපදේශන වැඩමුළුවක් කාන්තා හා ළමා කටයුතු අංශය විසින් 2018.11.25 වන දින එම නේවාසිකාගාරයේදී පවත්වන ලදී.

- **වැල්ලවත්ත ප්‍රදේශයේ පාසල් ළමුන් මුහුණ දෙන ගැටළු හා ඒවා වළක්වාලීම සම්බන්ධයෙන් දෙම්විපියන් දැනුවත් කිරීම සඳහා වැඩසටහනක් පැවැත්වීම**

ළමා ශ්‍රමය පිළිබඳ වැඩි අවධානමක් සහිත ළමා කාලයේ සුන්දරත්වය හා නිසි අධ්‍යාපනයක් ලැබීමට අවස්ථාව අහිමි දරුවන් පිළිබඳව වැඩි අවධානමක් සහිත ප්‍රදේශයන්හි දෙමව්පියන් ඇතුළු පාර්ශවකරුවන් දැනුවත් කිරීම සඳහා එම ගැටළු බහුලව පවතින පාමංකඩ රාමක්‍රිෂ්ණ විද්‍යාලයේ, දරුවන්ගේ දෙමව්පියන් මේ සම්බන්ධව දැනුවත් කිරීමට වැඩසටහනක් 2018.11.27 වන දින කාන්තා හා ළමා කටයුතු අංශය විසින් එම විද්‍යාලයේ දී පවත්වන ලදී.

- **''සේවා ස්ථාන වල දී සිදු වන ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් කාන්තා හිංසනය'' පවත්නා තත්ත්වය සමාලෝචනය කිරීමේ වැඩමුළුව**

කම්කරු දෙපාර්තමේන්තුවේ කාන්තා හා ළමා කටයුතු අංශය විසින් සේවා ස්ථානයන්හි ලිංගික හිංසනයන්ට විසඳුම් සැපයීම සඳහා දැනට පවතින ක්‍රමවේදය, යාන්ත්‍රණය හා විශිෂ්ඨ පරිචය පිළිබඳව සමාලෝචනයක් සිදු කිරීම සඳහා තෝරාගත් පාර්ශවකරුවන් සහභාගි කරවා ගනිමින් සමාලෝචන වැඩමුළුවක් 2018.12.13 වන දින පෙ.ව. 9.00 සිට ප.ව. 2.00 දක්වා කම්කරු දෙපාර්තමේන්තුවේ සිව්වන මහලේ ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.

## කර්මාන්තමය සුරක්ෂිතතාවය

අනතුරු සහ උපද්‍රවයන්ගෙන් තොර සහ සෞඛ්‍යාරක්ෂිත සේවා පරිසරයක් සේවකයන්ගේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය ඉහල නැංවීමට ඉවහල්වන අතර නිෂ්පාදිත භාණ්ඩ හා සේවාවන්ගේ ගුණාත්මකභාවය උසස් කිරීමට ද හේතුවේ. ඒ අනුව, සේවා ස්ථානවල ඇතිවන ආපදා, අනතුරු සහ වෘත්තීමය රෝගාබාධ අවම කිරීම උදෙසා කම්කරු දෙපාර්තමේන්තුව ක්‍රියා කරනු ලබන අතර 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥා පනත අනුව සේවකයන්ගේ වෘත්තීය සෞඛ්‍යය හා සුරක්ෂිතතාවය සැලසීම අනිවාර්ය නෛතික අවශ්‍යතාවයක් ලෙසට නීත්‍යානුකූලභාවය ලබාදී ඇත.

2018.01.01 දින සිට 2018.12.31 දක්වා ප්‍රගතිය


| වැඩසටහන / ක්‍රියාකාරකම/අදියර | 2018 වසර සඳහා ඉලක්ක | 2018.01.01 දින සිට 2018.12.31 දින දක්වා ප්‍රගතිය |
|---|---|---|
| කර්මාන්තශාලා අනතුරු, පරීක්ෂණ, පැමිණිලි විමර්ෂණය කිරීම | 6400 | 4424 |
| වෘත්තීය සෞඛ්‍ය හා සුරක්ෂිතතාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 240 | 199 |
| අධි අන්තරාදායක යන්ත්‍ර සූත්‍ර පරීක්ෂණය | 8000 | 8407 |
| කර්මාන්තශාලා නව ලියාපදිංචි කිරීම | 1600 | 1429 |
| නීතිමය ක්‍රියාමාර්ග ගැනීම | 16 | 35 |
| කාර්මික සිසුන් සඳහා වෘත්තීය සුරක්ෂිතතාවය සහ සෞඛ්‍ය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම | 15 | 11 |
| ලෝක සුරක්ෂිතතා දින හා ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සතියට සමගාමීව වැඩසටහන් පැවැත්වීම | 6 | 8 |

2018 වර්ෂය තුළ මරණීය අනතුරු 105ක්ද මරණීය නොවන අනතුරු 1467ක්ද වාර්තා වී ඇත. එම අනතුරු ඉදිරි කාලයේදී අවම කර ගැනීම සඳහා පහත ක්‍රියාමාර්ග ගෙන ඇත

- අනතුරු සිදුවිය හැකි අවස්ථා කර්මාන්තශාලා පරීක්ෂණ මගින් හඳුනාගෙන අදාල අනතුරු වළක්වා ගත හැකි ආකාර හා ගත යුතු පියවරයන් පිළිබඳව ඔවුන් දැනුවත් කිරීම
- අධි අන්තරාදායී යන්ත්‍ර භාවිතා කරන කර්මාන්තශාලා නිරන්තරයෙන් පරීක්ෂා කර එම යන්ත්‍ර සඳහා නිසි පරිදි පරීක්ෂණ වාර්තා ලබා ගැනීම හා පවත්වා ගැනීම පිළිබඳ උපදෙස් ලබා දීම
- අනතුරු වළක්වා ගැනීමට දැනුවත් කළ කර්මාන්තශාලා එසේ නොකිරීම පිළිබඳ නීතිමය ක්‍රියාමාර්ග ගැනීම
- අනතුරු වාර්තා නොකිරීම සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම
- අත් පත්‍රිකා 12,000ක් මුද්‍රණය කර බෙදා දීම
- කර්මාන්තශාලා සේව්‍ය සේවක පිරිස් දැනුවත් කිරීමේ වැඩසටහන් 154ක් ප්‍රතිලාභීන් 11,400 දෙනෙකු ආවරණය කරමින් පැවැත්වීම

| අංශය | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | සහභාගි වූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|
| ඉදිකිරීම් | 78 | 4690 |
| ඇඟළුම් | 30 | 2690 |
| වෙනත් නිෂ්පාදන | 37 | 2820 |
| වෙනත් | 09 | 1200 |
| එකතුව | **154** | **11400** |

**මරණීය සහ මරණීය නොවන අනතුරු වාර්තා වීම**




සෑම වසරකම අප්‍රේල් 28 දිනට යෙදෙන ලෝක සුරක්ෂිතතා දිනය වෙනුවෙන් ජාතික සම්මන්ත්‍රණයක් 2018.04.27 දින කම්කරු හා වෘත්තීය සමිති සබඳතා ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් සේවකයන් 250කගේ සහභාගිත්වයෙන් කම්කරු දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයීය 10වන මහල ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.

එසේම ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සතිය සම්බන්ධයෙන් ජාතික සම්මන්ත්‍රණය 2018.10.11 දින කම්කරු හා වෘත්තීය සමිති සබඳතා ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් කොළඹ 07 සච්සිරිපාය ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී. මෙහිදී සේව්‍යයන් සහ සේවකයන් 250 දෙනෙකු සඳහා වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ දේශන සහ වැඩසටහන්ද පවත්වන ලදී.

වෘත්තීමය රෝගාබාධ ඇතිවිය හැකි සේවා වටපිටාවන් පරීක්ෂා කිරීම සඳහා පාරිසරික මිනුම් සිදු කිරීමත් සේවකයන් වෙත වෘත්තීය රෝගාබාධ හෝ රෝග ලක්ෂණයන් පවතීදැයි මූලික අවධියේදී හඳුනා ගැනීම උදෙසා විවිධ ජීව විද්‍යාත්මක පරීක්ෂණ සිදු කිරීමත් දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ. එම කටයුතුවල 2018 වර්ෂයේ ප්‍රගතිය පහත පරිදි වේ.

| වැඩසටහන | 2018 වසර සඳහා ඉලක්ක | 2018.01.01 දින සිට 2018.12.31 දක්වා ප්‍රගතිය |
|---|---|---|
| පාරිසරික මිනුම් | 150 | 170 |
| ජීව විද්‍යාත්මක පරීක්ෂණ | 1000 | 1905 |
| වෘත්තීය සෞඛ්‍ය හා සුරක්ෂිතතා විගණනයන් | 250 | 237 |
| දැනුවත් කිරීමේ වැඩසටහන් | 230 | 222 |
| සේ. අ. අ. සහ සේ. නි. භා. අ. වෛද්‍ය මණ්ඩල | 24 | 24 |

වර්ෂය තුළදී වෘත්තීය සුරක්ෂිතතාවය සහ සෞඛ්‍යය සම්බන්ධයෙන් ඇතිවූ අවධානයට ලක්වූ ගැටළුකාරී තත්ත්වයන් කිහිපයක් සම්බන්ධයෙන් පහත මැදිහත්වීම් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී.

- ඉතා අවදානම්කාරී නිෂ්පාදන ක්‍රියාවලියක් ඇති ඊයම් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තශාලා වන නවම් ලංකා - මීරිගම, ලියොචි ලංකා - බටඅත, කයිලාශ් මෙටාකෙම් - අවිස්සාවේල්ල මාස 6 කට වරක් සේවකයන්ගේ රුධිරගත ඊයම් ප්‍රමාණය පරීක්ෂාව සහ කර්මාන්තශාලා පරීක්ෂා කර අවශ්‍ය උපදෙස් ලබා දීම.

- හදිසියේ සිදුවන රසායනික අනතුරු විමර්ෂණය කිරීම සහ වලකාලීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දීම.

- ඇගියෝ දුම්කොළ පුද්ගලික සමාගම, එහි සේවකයින් සහ අන්තර් සමාගම් සේවක සංගමය අතර ඇති වූ කාර්මික ආරවුල නිරාකරණය කිරීම සඳහා මෙම අංශය විසින් කාර්මාන්තශාලා පරීක්ෂා කර ඒ සඳහා නිර්දේශ සහ නිගමන ලබා දුන් අතර එම කාර්මික ආරවුල විසඳීමට සේව්‍ය,සේවක සහ වෘත්තීය සංගම් සමග සහයෝගීත්වයෙන් කටයුතු කිරීම.

- ජා-ඇල පොලිටෙක්ස් ඇඟලුම් කර්මාන්ත ශාලාවේ සිදු වූ වැඩ කරන පරිසරයේ වාතාශ්‍රය අපවිත්‍ර වීම නිසා වර්ෂය තුළ දෙවරක දී ඇති වූ කාර්මික ආරවුල විසදීම සඳහා සේවක සේව්‍ය සහ වෘත්තීය සමිති සමඟ සහයෝගීත්වයෙන් කටයුතු කිරීම.

එසේම 2018.10.03 දින පැවැත්වූ ජාතික වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය සිම්පොසියම් මගින් කර්මාන්ත ක්ෂේත්‍රයේ 150ක නියෝජිතයන් දැනුවත් කිරීමට කටයුතු කරන ලදී.

## පුහුණු කටයුතු

දෙපාර්තමේන්තුවේ ඵලදායීතාවය ඉහළ නැංවීම පිණිස කුසලතා පිරිපුන් නිලධාරීන් පිරිසක් බිහි කිරීමේ අරමුණින් දෙපාර්තමේන්තුව විසින් සිය නිලධාරී පුහුණුව සඳහා විශේෂ අවධානයක් යොමු කර ක්‍රියාකරනු ලැබේ.

ඒ අනුව, 2018 වර්ෂයේදී නිලධාරීන් සඳහා දෙපාර්තමේන්තුව විසින් පහත පුහුණු වැඩසටහන් සංවිධානය කර පවත්වා ඇත.

| | වැඩසටහන | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | සහභාගි වූ නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1. | සේවාරම්භක පුහුණු වැඩසටහන් | 02 | 301 |
| 2. | දෙමළ භාෂා පුහුණු වැඩසටහන් | 02 | 168 |
| 3. | දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධති සම්බන්ධ පුහුණු වැඩසටහන් | 06 | 349 |
| 4. | වෘත්තීය සෞඛ්‍ය හා කර්මාන්ත සුරක්ෂිතතාව පිළිබඳ පුහුණු වැඩසටහන් | 03 | 166 |
| 5. | කම්කරු නීති පිළිබඳ පුහුණු වැඩසටහන් | 01 | 200 |
| 6. | මූල්‍ය කටයුතු පිළිබඳ පුහුණු වැඩසටහන් | 02 | 95 |
| 7. | සේවක අර්ථසාධක අරමුදල් ක්‍රියාකාරකම් පිළිබඳ පුහුණු වැඩමුළු | 30 | 2500 |
| 8. | ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ අනුග්‍රහය යටතේ පැවැත්වූ පුහුණු වැඩමුළු | 05 | 240 |
| | එකතුව | **51** | **4019** |

එසේම, බාහිර පුහුණු ආයතනයන්හි පහත පාඨමාලා හැදෑරීම සඳහා නිලධාරීන් වෙත ප්‍රතිපාදන ලබා දී ඇත.

| | වැඩසටහන | ප්‍රතිපාදන ලබා දුන් නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| 1. | පශ්චාත් උපාධි | වර්ෂය තුල නව අනුමත කිරීම් - 06, වාරික ගෙවීම් - 21 |
| 2. | නීති උපාධි | 13 (වාරික ගෙවීම් පමණි) |
| 3. | ඩිප්ලෝමා පාඨමාලා | 08 |
| 4. | සහතික පත්‍ර පාඨමාලා සහ වැඩමුළු | 51 |
| | එකතුව | **99** |

## දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාලයන්හි අධීක්ෂණ කටයුතු

2018 වර්ෂයේදී දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාලයන්හි කටයුතු අධීක්ෂණය කිරීමේ ක්‍රියාවලිය සැලසුම්, පර්යේෂණ, පුහුණු හා ප්‍රකාශන අංශය විසින් නව ආකෘතියකින් ආරම්භ කරන ලදී. ඒ අනුව, සියලු කම්කරු කාර්යාලයන්හි කම්කරු පරීක්ෂණ, සේවක අර්ථසාධක අරමුදල් කටයුතු, පැමිණිලි විසඳීම ආදී ප්‍රමුඛ ක්‍රියාකාරකම් අධීක්ෂණයට ලක් කරන ලදී. එහිදී කම්කරු පරීක්ෂණවල සංඛ්‍යාව සහ ගුණාත්මක භාවය ඉහළ නංවා ගැනීම සහ පැමිණිලි විසඳීම් කටයුතු කඩිනම් කිරීම, සේවක අර්ථසාධක අරමුදල් හිඟ අයකර ගැනීම් සහ ගෙවීම් පිළිබඳ පරිගණකගත පද්ධතිය පූර්ණ ධාරිතාවයෙන් භාවිතා කිරීම, LISA වැඩසටහන යාවත්කාලීන කිරීම සහ පොදු තැන්පත් ගිණුම නිරවුල් කිරීම ආදී කටයුතු ප්‍රශස්ත මට්ටමකින් සිදු කිරීමට අවශ්‍ය උපදෙස් දිස්ත්‍රික් කම්කරු කාර්යාල වෙත ලබා දීම සිදු කරන ලදී. අධීක්ෂණයෙන් අනතුරුව ඌව, මධ්‍යම, බස්නාහිර 11, වයඹ සහ දකුණ යන කලාපයන්ට අදාලව ප්‍රගති සමාලෝචන රැස්වීම්ද පවත්වන ලදී.

## සංඛ්‍යා ලේඛන කටයුතු

ශ්‍රී ලංකාවේ කම්කරු අංශයේ කාලීන සංකීර්ණ වෙනස්වීම් අධ්‍යයනය කරමින් වඩා නිවැරදි තොරතුරු හා සංඛ්‍යාලේඛන එක්රැස් කිරීම, විශ්ලේෂණය කිරීම හා ඒ තුළින් අනාගත පුරෝකථන ඉදිරිපත් කිරීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන අංශය සංවිධානය වී ඇත. ඒ අනුව 2018 වර්ෂය තුලදී පහත කටයුතු සිදු කර ඇත.

- වාර්ෂික රැකිරක්ෂා සමීක්ෂණ වාර්තාව 2017 මුද්‍රණය කිරීම සහ වෙබ් අඩවිය මගින් ප්‍රකාශයට පත් කිරීම
- 2018 වාර්ෂික රැකිරක්ෂා සමීක්ෂණයේ දත්ත විශ්ලේෂණය කර අවසන් වාර්තාව සකස් කිරීම
- කම්කරු සංඛ්‍යාති වාර්ෂික ප්‍රකාශනය 2017 වාර්ෂික ප්‍රකාශනය මුද්‍රණය කිරීම සහ වෙබ් අඩවිය මගින් ප්‍රකාශයට පත් කිරීම
- සාමාන්‍ය ඉපැයීම් සහ වැඩකළ පැය ගණන පිළිබඳ සමීක්ෂණ වාර්තාව 2017 මුද්‍රණය කිරීම සහ වෙබ් අඩවිය මගින් ප්‍රකාශයට පත් කිරීම
- සාමාන්‍ය ඉපැයීම් සහ වැඩකළ පැය ගණන පිළිබඳ සමීක්ෂණ වාර්තාව 2018 මාර්තු සහ සැප්තැම්බර් සමීක්ෂණ කටයුතු අවසන් කිරීම
- ශ්‍රී ලංකා සේවක සඟරාව කාර්තුමය ප්‍රකාශනය 2018 සඳහා වෙනත් ආයතන වලින් දත්ත එක් රැස් කිරීම
- අවම වැටුප් අනුපාත දර්ශකාංකය ගණනය කිරීම - අදාල කාලය සඳහා පඩි පාලක සභා අනුව මාසික අවම වැටුප් දර්ශනාංකය ගණනය කර එම තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කිරීම
- සේවක අර්ථසාධක අරමුදල් නව ලියාපදිංචි කිරීම් පරිගණක ගත කිරීම සඳහා ලැබී ඇති දත්ත පරිගණක ගත කිරීම

## පරිපාලන කටයුතු

### භෞතික සම්පත් පරිපාලනය

කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට කාර්යක්ෂම ලෙස රාජකාරි කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ යටිතල පහසුකම් ක්‍රමවත් ලෙස සකස් කිරීම අත්‍යාවශ්‍ය සාධකයක් වේ.

ඒ අනුව, කම්කරු දෙපාර්තමේන්තුව සතු භූමියෙහි ''මෙහෙවර පියස'' ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු කඩිනමින් සිදු වෙමින් පවතී. මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් වෙනුවෙන් 2018 වර්ෂය තුල දැරූ වියදම රු. මිලියන 1524.38 කි. 2018.12.31 දිනට එහි භෞතික ප්‍රගතිය 92.73% කි.

පොළොන්නරුව සහ පුත්තලම කම්කරු කාර්යාලවල ඉදිකිරීම් කටයුතු නිම කර ඇත. හැටන් කම්කරු කාර්යාලයේ නව ගොඩනැගිල්ල සඳහා මුල්ගල තබා ඇත.

## කම්කරු කාර්යාලවල සිදු කෙරෙන ඉදිකිරීම් කටයුතුවල ප්‍රගතිය පහත පරිදි වේ.

| වැඩසටහන /ක්‍රියාකාරකම | 2018 වසර සඳහා වූ ඉලක්ක | | 2018.01.01. දින සිට 2018.12.31 දක්වා ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | භෞතික | මූල්‍ය (රු.මිලි) | භෞතික | මූල්‍ය (රු.මිලි) |
| මෙහෙවර පියස | 100% | 1742 | 92.73% | 1524.38 |
| කුරුණෑගල දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ ඉදිකිරීම් - අදියර 2 | 100% | - | 100% | 3 |
| අම්බලන්ගොඩ කම්කරු කාර්යාලයේ ඉදිකිරීම් - අදියර 2 | 95% | 35 | 65% | 35 |
| මහියංගනය කම්කරු කාර්යාලයේ ඉදිකිරීම් - අදියර 1 | 100% | 40 | 98% | 40 |
| අනුරාධපුර කම්කරු කාර්යාලයේ ඉදිකිරීම් - අදියර 3 | 100% | 4 | 75% | 3 |
| නාඋල කම්කරු කාර්යාලයේ ඉදිකිරීම් - අදියර 1 | 100% | 30 | 80% | 29.99 |
| රත්නපුර කම්කරු කාර්යාලයේ ඉදිකිරීම් - අදියර 1 | 65% | 75 | ටෙන්ඩර් කටයුතු | - |
| බදුල්ල කම්කරු කාර්යාලයේ ඉදිකිරීම් - අදියර 1 | 65% | 60 | ටෙන්ඩරය පිරිනැමීමට ඇත | - |
| හැටන් කම්කරු කාර්යාලයේ ඉදිකිරීම් - අදියර 1 | 75% | 15 | 12% | 15 |
| පොළොන්නරුව කම්කරු කාර්යාලයේ ඉදිකිරීම් - සෝපාන පද්ධතිය ඉදිකිරීම් | 100% | 20 | 100% | 20 |
| පුත්තලම කම්කරු කාර්යාලයේ ඉදිකිරීම් - සෝපාන පද්ධතිය ඉදිකිරීම් | 100% | 7 | ටෙන්ඩරය පිරිනමා ඇත | 6.91 |
| යාපනය සහ මීගමුව කම්කරු කාර්යාලවල සෝපාන ඉදිකිරීම් | 100% | 8 | යාපනය - 95%, මීගමුව - ටෙන්ඩර් කටයුතු | 7.99 |

### මානව සම්පත් කළමනාකරණය

කාර්ය මණ්ඩලය ප්‍රශස්ත මට්ටමින් පවත්වාගෙන යාම තුළින් දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කිරීම පහසු වේ. ඒ සඳහා ඉටු කරන ලද කාර්යයන් පහත පරිදි වේ.

- පර්යේෂණ නිලධාරීන් බඳවා ගැනීම සඳහා විද්‍යාත්මක සේවයේ බඳවා ගැනීමේ පටිපාටියට රාජ්‍ය සේවා කොමිෂන් සභා අනුමැතිය ලබා ගැනීමට යොමු කිරීම කම්කරු කොමසාරිස් වෘත්තීය සුරක්ෂිතතා සහ ස්වස්ථතා තනතුරට අදාල බඳවා ගැනීමේ පරිපාටිය සඳහා අනුමැතිය ලබාගැනීම සඳහා යොමු කිරීම
- රියදුරු සේවයේ තනතුරුවල පුරප්පාඩු සඳහා 09 දෙනෙකු බඳවා ගැනීම
- කාර්යාල සේවක සේවයේ (කා.සේ.සේ.) තනතුරුවල පුරප්පාඩු සඳහා 35 දෙනෙකු බඳවා ගැනීම
- සහකාර කම්කරු කොමසාරිස්වරුන් (දෙපාර්තමේන්තුමය) බඳවා ගැනීමේ තරඟ විභාගය (සීමිත) පැවැත්වීම සඳහා විභාග නිවේදනයේ සංශෝධන සිදුකර විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම
- කම්කරු නිලධාරි තනතුරට බඳවා ගැනීමේ තරඟ විභාගය (සීමිත / විවෘත) පැවැත්වීම සඳහා විභාග නිවේදනය අනුමැතිය සඳහා විභාග දෙපාර්තමේන්තුව වෙත යැවීම
- ලඝු ලේඛක තනතුරට බඳවා ගැනීමේ තරඟ විභාගය (විවෘත) පැවැත්වීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත අනුමැතිය සඳහා යොමු කිරීම
- මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන්ගේ කාර්යසාධන ගෙන්වා ගැනීමට කටයුතු කිරීම

- නිල ඇඳුම් දීමනා ලබා දීම ( මුරකරු සේවය, රියදුරු, කා.කා.සේ. අදාල සේවකයින් හට)
- වාර්ෂික වැටුප් වර්ධක ලබාදීම
- විශ්‍රාම වැටුප් ගොනු සකස් කිරීම
- සහකාර කම්කරු කොමසාරිස් (දෙපාර්තමේන්තු), ඉංජිනේරු සේවය, නීති නිලධාරි, පර්යේෂණ නිලධාරි, කම්කරු නිලධාරි, මානව සම්පත් සංවර්ධන නිලධාරි, විදුලි කාර්මික ශිල්පි, ලඝු ලේඛක, කාර්යාල සේවක සේවය සහ රියදුරන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීම
- වාර්ෂික වැටුප් වර්ධක අනුමත කිරීම
- විශ්‍රාමිකයන්ගේ ගොනු සම්පූර්ණ කිරීම
- කාර්ය සාධන ගෙන්වා ගැනීම
- වත්කම් බැරකම් වාර්තා ගෙන්වා ගැනීම
- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව වැටුප් පරිවර්තනය කිරීම
- දෙපාර්තමේන්තු ප්‍රතිව්‍යුහගතකරණ වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අදාල කටයුතු සිදු කිරීම
- මාරු මණ්ඩල සහ අභියාචනා මණ්ඩල පැවැත්වීම
- පුද්ගලික ලිපි ගොනු සම්බන්ධයෙන් Google Drive හරහා පරිගණක තොරතුරු පද්ධතියක් සකස් කර දත්ත ඇතුලත් කිරීම ආරම්භ කිරීම

## පුස්තකාල හා තොරතුරු සේවාව

දෙපාර්තමේන්තුවේ සේවකයන්ට සහ පොදු මහජනතාවට කම්කරු ක්ෂේත්‍රය පිළිබඳ දැනුම ව්‍යාප්ත කිරීම සඳහා පුස්තකාලයක් දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන අතර එහි 2018 වර්ෂයේ කටයුතු පහත පරිදි වේ.

- ප්‍රකාශන කමිටුව විසින් අනුමත කරන ලද පොත් 935ක්, දේශිය සඟරා 93ක් සහ විදේශිය සඟරා 21ක් මිලදී ගැනීම
- සමාජිකයන් 225 දෙනෙකු සඳහා සාමාජිකත්වය ලබා දීම
- පොත් බැහැර දීම් 15,123ක් සිදු කිරීම
- ඡායා පිටපත් සේවාව පවත්වාගෙන යාම
- දත්ත සමුදා සහ පටුන පිටු සේවාව පවත්වාගෙන යාම

### මූල්‍ය කළමනාකරණය

දෙපාර්තමේන්තුව වෙත 2018 වර්ෂය සඳහා වෙන් කර තිබුණු මූල්‍ය ප්‍රතිපාදන වර්ෂය තුලදී සඵලදායීව කළමනාකරණය කර ගැනීමට හැකිවී ඇත.

**2018 ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රගතිය**

| වැඩසටහන | වියදම් වර්ගය | 2018 වර්ෂය සඳහා ප්‍රතිපාදනය (රු) | 2018 දෙසැම්බර් 31 දිනට වියදම (රු) | ඉතිරිය (රු) | වියදම් ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| 221 | පුනරාවර්තන | 1,619,100,000 | 1,614,473,945 | 4,626,055 | 99.71% |
| | මූලධන | 2,211,000,000 | 1,813,415,443 | 108,983,671 | 95.07% |

## අභ්‍යන්තර විගණන කටයුතු

2018 වර්ෂයට අදාලව සකස් කරන ලද විගණන සැලැස්ම අනුව දිස්ත්‍රික් කම්කරු කාර්යාල 07ක් සහ දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන අංශය, සේවක අර්ථසාධක අරමුදලේ ගබඩාව (සැපයුම් අංශය) විගණනයට ලක් කරන ලදී. එසේම රජයේ විගණන අංශය විසින් දෙපාර්තමේන්තුවේ විවිධ කාර්යාල පරීක්ෂා කර නිකුත්කර තිබූ විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දී ඇත. කාර්තුමය විගණන හා කළමනාකරණ රැස්වීම් 04ක් පැවැත්වීමට කටයුතු කරන ලදී.

# මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

2010.02.12 දිනැති අංක 1640/31 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ විධිවිධාන අනුව මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව 2010 වසරේදී කම්කරු සබඳතා හා මිනිස්බල අමාත්‍යාංශය යටතේ ස්ථාපනය කරන ලදි. වර්තමානයේ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන දෙපාර්තමේන්තුව වෙත රාජ්‍ය රැකියා සේවාවන් පවත්වාගෙන යාම හා ජාතික මානව සම්පත් හා රැකියා ප්‍රතිපත්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ වගකීම ද පැවරී ඇත.

**දැක්ම**

ලෝක මට්ටමේ ශ්‍රී ලාංකික ශ්‍රම බලකායක්

**මෙහෙවර**

පුළුල් නිපුණතාවයෙන් යුත්, ක්‍රියාශීලී සහ ගෝලීය වශයෙන් තරඟකාරී ශ්‍රම බලකායක් ගොඩනැගීම සහ
අපේ මානව සම්පත්වල මුළු ශක්තිය ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික
සංවර්ධනය සඳහා යොදා ගැනීම

මෙම දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් කාර්යයන් ඉටු කරලීමට බලාපොරොත්තු වේ.

- ජාතික මිනිස්බල හා රැකීරක්ෂා ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කිරීම.
- රැකියා නිර්මාණ හා ප්‍රවර්ධන කටයුතු
- වෘත්තීය මාර්ගෝපදේශනයට අයත් කටයුතු
- ශ්‍රම වෙළඳපල තොරතුරු එක්රැස් කිරීම, විශ්ලේෂණය හා බෙදාහැරීම
- රැකියා පියස (Jobs Net) මගින් සිදු කෙරෙන වෙනත් සේවාවන්
  සහ ඉහත විෂයන්ට ආනුෂාංගික සහ සම්බන්ධිත සෙසු සියලු කටයුතු.

## දෙපාර්තමේන්තුවේ අරමුණු

ඉහත ඉලක්කයන් ඉටුකරගැනීම බලපැවැත්වන්නේ පහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම තුළිනි.

1. ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තිය සකස් කර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
2. කුසලතා නොගැලපීම යන ව්‍යුහාත්මක සේවා වියුක්ති ගැටළුව විසඳීම
3. වර්තමාන ශ්‍රම බලකායට අයත් සහ අනාගතයේ ශ්‍රම වෙළඳපොළට එක්වීමට නියමිත සියලුම ශ්‍රී ලාංකිකයන් හට නිවැරදි වෘත්තීය දිශානතිය නිශ්චය කරගැනීම සඳහා පහසුකම් සැලසීම.
4. මිනිස්බල සැලසුම් කිරීම, සංවර්ධනය හා පුරෝකථනය.
5. අවිධිමත් අංශය සංවර්ධනය
6. පෞද්ගලික අංශයේ රැකියා සඳහා රැකියා අපේක්ෂකයින් පෙළඹවීම
7. නිදහස් රාජ්‍ය රැකියා සේවය ලබාදීම
8. අවධානමට ලක් වූ කණ්ඩායම්, ආබාධිත පුද්ගලයන් හා ඌන සංවර්ධිත ප්‍රදේශවල වෙසෙන පුද්ගලයන් සඳහා මිනිස්බල හා සේවා නියුක්තිය ආශ්‍රිත පහසුකම් සැපයීම
9. ගෝලීය හා දේශීය වශයෙන් නිවැරදි ශ්‍රම වෙළඳපොළ තොරතුරු සියලුම ශ්‍රී ලාංකිකයන්ට ලබාදීම
10. දේශීය හා ගෝලීය ශ්‍රම වෙළඳපොළ නැමියාවන් පුරෝකථනය මේ අයුරින් විරැකියාව අවම කිරීම හා යහපත් රැකියා ඇතිකිරීම යන සත්කාරයයන් ඉටුකර ගැනීම උදෙසා මෙම දෙපාර්තමේන්තුව සිය මානව සම්පත් උපයෝගී කරගනිමින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

## දෙපාර්තමේන්තුවේ අංශ


- පාලන අංශය, සැලසුම් හා ප්‍රගති මෙහෙයුම් ඒකකය
- ගිණුම් අංශය
- මිනිස්බල සැලසුම්, සංවර්ධන හා පර්යේෂණ අංශය
- රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ අංශය

2018 දෙසැම්බර් 31 දක්වා මූල්‍ය ප්‍රගතිය

| | ප්‍රතිපාදනය (රු.000) | වියදම (රු.000) | ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 352,655 | 348,741 | 98.89% |
| ප්‍රාග්ධන වියදම් | 31,100 | 30,395 | 97.74% |
| එකතුව | 383,755 | 379,137 | 98.80% |

## රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ අංශය

රැකියාවක් බලාපොරොත්තුවෙන් සිටින හා නව්‍යලෙස රැකියා වෙළඳපල වෙත ප්‍රවේශ වන හා අනාගතයේ ප්‍රවේශ වීමට නියමිත ජනතාව වෙත සේවා නියුක්ති ආශ්‍රිත පහසුකම් සැපයීමේ අරමුණින් මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව විවිධ වැඩසටහන් පවත්වනු ලබයි.




## මිනිස්බල සැලසුම්, සංවර්ධන හා පර්යේෂණ අංශය

### රැකියා කේන්ද්‍රය

මෙම අංශය මිනිස්බල සැලසුම්, සංවර්ධන හා පර්යේෂණ අංශය යටතේ ක්‍රියාත්මක වේ. දිවයිනේ දිස්ත්‍රික්ක 25ක මෙම රැකියා කේන්ද්‍රය (Job Center / PES) ක්‍රියාත්මක වේ. ප්‍රධාන රැකියා කේන්ද්‍රය බත්තරමුල්ල කාර්යාල පරිශ්‍රයෙහි ස්ථාපිත කර ඇත.

රැකියා කේන්ද්‍ර ජාලය






**ප්‍රධාන කාර්යාලය**

**9 වන මහල**
**සෙත්සිරිපාය දෙවන අදියර**
**බත්තරමුල්ල**

### දිස්ත්‍රික් රැකියා කේන්ද්‍රය මගින් සිදු කරනු ලබන කාර්යයන්

- රැකියා අපේක්ෂිතයින් ලියාපදිංචි කිරීම.
- පුරප්පාඩු සහ ආයතන ලියාපදිංචි කිරීම.
- ආයතනවල පුරප්පාඩු සොයා බැලීම සඳහා කටයුතු කිරීම.
- රැකියා අපේක්ෂිතයින්ගේ රැකියා පුරප්පාඩු පිළිබඳ ලේඛණ සකස් කිරීම.
- සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම හා රැකියා අපේක්ෂිතයින්ගේ සුදුසුකම් තහවුරු කර ගැනීම.
- රැකියා ගැලපීම් හා සම්මුඛ පරීක්ෂණ සඳහා යොමුකිරීම.
- රැකියා ගතකිරීම් හා පසුවිපරම්
- වෘත්තීය මාර්ගෝපදේශන සේවාවන් සැපයීම.
- පුහුණුව සඳහා පහසුකම් සැපයීම.
- රැකියා තත්ත්වයන් පිළිබඳව සංඛ්‍යා ලේඛණ රැස්කිරීම හා ප්‍රකාශයට පත් කිරීම.
- විදේශීය රැකියා අවස්ථා සඳහා මඟපෙන්වීම.
- දිස්ත්‍රික් රැකියා පොළ වැඩසටහන සංවිධානය කර පැවැත්වීම.

රැකියා අපේක්ෂිතයින් ලියාපදිංචි කිරීම ක්‍රම කිහිපයකට සිදුවේ. ප්‍රාදේශීය මට්ටමේ මානව සම්පත් සංවර්ධන සහකාරවරුන් විසින් හා රැකියා පොළවල්, රැකියා කේන්ද්‍ර මධ්‍යස්ථාන හරහා ලබා දෙන තොරතුරු මඟින් මෙම තොරතුරු ලබා ගැනේ. මේ යටතේ රැකියා අපේක්ෂිතයන් දැනුවත් කිරීමේ මූලික වැඩසටහන් සංවිධානය කෙරේ.

දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියට මාර්ගගත (online) රැකියා සේවා රැකියා සේවා සැපයීමේ අන්තර්ජාල බිහිදොර මගින්ද රැකියා අපේක්ෂිතයන්ට හා ලියාපදිංචි විය හැකි අතර සේවා යෝජකයන් හටද මෙහි ලියාපදිංචි වී තම අවශ්‍යතා අනුව පුරප්පාඩු සඳහා රැකියා අපේක්ෂිතයන් තෝරා ගත හැක.

එසේම රැකියා අපේක්ෂිතයන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශනය, පුහුණුව සඳහා යොමු කිරීම, Career Me ආයතනය විසින් පහසුකම් සපයන පෞරුෂත්ව සඳහා නොමිලේ පෙනී සිටීමට අවශ්‍ය පහසුකම් සපයා ඇත. මෙයට අමතරව විවිධ නිපුණතාවයක් සහිත වෘත්තිකයන් සඳහා සිය සේවාවන් දෙපාර්තමේන්තු අන්තර්ජාල බිහිදොර මගින් ලියාපදිංචි වී ලබා දීමටත් එම සේවා අවශ්‍ය පිරිස සඳහා අන්තර්ජාලය මගින් තම පදිංචි ප්‍රදේශ අනුව සේවා සපයන්නන් තෝරා ගැනීමටත් අවස්ථාව සලසා ඇත. ඉහත දැක්වූ මෙම සේවා ජංගම දුරකථන ආශ්‍රිත යෙදවුමක් (Mobile App.) මගින් ලබා ගැනීමටත් හැකියාව ඇතිවන පරිදි මෘදුකාංග සංවර්ධනය කර ඇත. උක්ත දෙපාර්තමේන්තු වෙබ් අඩවිය හා ඒ ආශ්‍රිත සංවර්ධනය පිළිබඳ කෙටි ව්‍යාපෘති දෙකක් සඳහා ලෝක කම්කරු සංවිධානය (ILO) මගින් අනුග්‍රහය දක්වා ඇත.

## ශ්‍රම වෙළඳපල තොරතුරු ඒකකය

මෙම අංශය මිනිස්බල සැලසුම්, සංවර්ධන හා පර්යේෂණ අංශය යටතේ ක්‍රියාත්මක වේ. ශ්‍රම වෙළඳපල තොරතුරු විවිධ ක්ෂේත්‍රයන්හි ප්‍රතිපත්ති සම්පාදකයින් සඳහා මෙන්ම අධ්‍යාපන ක්ෂේත්‍රයේ අධ්‍යාපන වැඩසටහන්, පුහුණු හා කුසලතා සංවර්ධන වැඩසටහන් සම්පාදකයන් සඳහා ද අවශ්‍ය වේ.

ශ්‍රම වෙළඳපළ තොරතුරු රැස්කිරීමේදී සීඝ්‍රව වෙනස්වන කුසලතා සපිරි මානව සම්පත සඳහා ශ්‍රම වෙළඳපල ඉල්ලුම මනාව අධීක්ෂණය කිරීම හා තක්සේරු කිරීම අත්‍යවශ්‍ය වේ. මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව ශ්‍රම වෙළඳපල තොරතුරු රැස්කිරීම, විශ්ලේෂණය කිරීම හා බෙදාහැරීම කරනු ලබයි.

එමෙන්ම ශ්‍රී ලංකාවේ කාලීන හා සංවර්ධන අවශ්‍යතාවන්ට සරිලන ලෙස ශ්‍රම වෙළඳපල පර්යේෂණ හා සමීක්ෂණ පැවැත්වීම, ශ්‍රම ඉල්ලුම හා සැපයුම පිළිබඳ අධ්‍යයන සිදු කිරීම හා එම තොරතුරු බෙදා හැරීම ශ්‍රම වෙලඳපළ ඒකකයෙන් සිදුකරයි. ශ්‍රම වෙළඳපොළ තොරතුරු සඟරාව හා පාසල් පාදක දත්ත අත්පොත මේ මගින් ප්‍රකාශයට පත්කරනු ලබයි.

## ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තිය

2017 වර්ෂයේදී ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තිය හා සම්බන්ධව කරන ලද ප්‍රගතිය වර්තමාන රජයේ මධ්‍යකාලීන සංවර්ධන ප්‍රතිපත්ති රාමුවට අනුකූලව නැවත සංශෝධනය කරන ලදී.

- එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට සෘජුවම අදාල වන බවට හඳුනා ගෙන ඇති අමාත්‍යාංශ 43ක් වෙතින්, ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම 2018 - 2021 කාලසීමාවට අදාල වන පරිදි සංශෝධනය කිරීමට යෝජනා කැඳවන ලදී.
- අමාත්‍යාංශ 5 කින් සම්පූර්ණ කරන ලද ක්‍රියාකාරී සැලැස්ම ලබා දී ඇති අතර අනෙකුත් අමාත්‍යාංශ වෙතින් ලබා දී ඇති ක්‍රියාකාරී සැලැස්ම යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කරනු ලබයි.
- ප්‍රතිපත්තිය සමඟ සම්බන්ධ වී ඇති අමාත්‍යාංශ වලින් ඉටු කරනු ලබන කාර්යයන් පිළිබඳව ප්‍රගතිය අධීක්ෂණය කිරීමේ කටයුතු ද මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ පිහිටුවා ඇති ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්ති මෙහෙයුම් ඒකකය මගින් සිදු කරනු ලබයි.

මෙහි ක්‍රියාකාරී සැලැස්ම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය ලබා ගැනීම සඳහා අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ සහභාගිත්වයෙන් වැඩමුළුවක් සංවිධානය කිරීමට කටයුතු යොදා තිබූ අතර අවසාන කාර්තුවේ ඇති වූ අමාත්‍යාංශ වෙනස්වීම් හා ගැටළු සහගත තත්වය මත එය සංශෝධනයට ලක් කරන ලදි. එම කටයුතු 2019 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ.

මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම හා ඒ සම්බන්ධ අමාත්‍යාංශ මෙහෙයවීමේදී දෙපාර්තමේන්තුවට හා කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයට වන ගැටළු අවම කර ගැනීම හා ප්‍රශස්ථව ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයත් ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයත් එක්ව සාමූහික අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය අමාත්‍ය මණ්ඩල සංදේශයේ කෙටුම්පත සකස් කර කරන ලදි. මෙහිදී ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති ජාතික මානව සම්පත් සංවර්ධන කවුන්සිලය (NHRDC) මෙහි මෙහෙයුම් භාරය

වශයෙනුත් මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව ඒ සඳහා ප්‍රගති ඇගයීම් කටයුතු සිදු කිරීමටත් යෝජනා කර ඇත.

සියලු අමාත්‍යාංශ සම්බන්ධ කරමින් ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී එක් එක් ආයතන වල ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය ලබා ගන්නා මාර්ගගත ක්‍රමවේදයක් සකස් කර ඒ සඳහා වූ පරිගණක පද්ධති ස්ථාපනය කර ඇත. ඒ සඳහා වන ආවරණ උපකරණ ලෝක කම්කරු සංවිධානය (ILO) මගින් සපයා ඇත. මෙම ක්‍රියාකාරී මෘදුකාංගය ICTA ආයතනය මගින් ස්ථාපිත රාජ්‍ය තොරතුරු අවකාශය (Government Cloud) තුල ස්ථාපනය කිරීමට මූලික කටයුතු සිදු කර ඇත.

**දෙපාර්තමේන්තුවේ වැඩසටහන්වල ප්‍රගතිය**

| | වැඩසටහන/ක්‍රියාකාරකම | 2018 වසර සඳහා වූ ඉලක්ක | | 2018/01/01 දින සිට 2018/12/31 දක්වා ප්‍රගතිය | | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|---|---|
| | | **භෞතික** | **මූල්‍ය (රු.මි)** | **භෞතික** | මූල්‍ය (රු.මි) | |
| | **රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ අංශය** | | | | | |
| 1 | අ.පො.ස සාමාන්‍ය පෙළ වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන | 1865 | 1.054 | 2160 | 0.948 | 54787 |
| 2 | අ.පො.ස උසස් පෙළ වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන | 1328 | 1.105 | 1402 | 0.991 | 37546 |
| 3 | ස්වයං රැකියා පෙළඹවීම් වැඩසටහන | 311 | 0.947 | 384 | 0.804 | 11545 |
| 4 | වෘත්තීය අභියෝග ජය ගැනීම | 150 | 0.794 | 149 | 0.679 | 4655 |
| 5 | උපාධි අපේක්ෂිතයන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන අභ්‍යන්තර / බාහිර | 20 | 0.739 | 20 | 0.684 | 789 |
| 6 | ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන | 23 | 0.637 | 25 | 0.601 | 1002 |
| 7 | දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන | 300 | 0.959 | 348 | 0.794 | 19534 |
| 8 | හසර සඟරාව මුද්‍රණය | 3 | 0.450 | 1 | 0.182 | - |
| 9 | ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන | 25 | 0.541 | 36 | 0.515 | 1145 |
| 10 | ප්‍රාදේශීය රැකියා පොළ වැඩසටහන | 48 | 0.458 | 77 | 0.462 | 7602 |
| 11 | අවශ්‍යතා මත පුහුණු වැඩසටහන | 240 | 1.687 | 288 | 1.559 | 9773 |
| 12 | උද්‍යාන අලංකරණ වැඩසටහන | 3 | 0.105 | 3 | 0.097 | 123 |
| | **මිනිස්බල සැලසුම්, සංවර්ධන හා පර්යේෂණ අංශය** | | | | | |
| 13 | Manpower සේවකයන්ගේ රැකියා පැතිකඩ | 100% | 0.500 | 75% | 0.340 | - |
| 14 | කුළී රථ කර්මාන්තය තුල මානව සම්පත උපයෝගීතාවය පිළිබඳ සමීක්ෂණය | 100% | 0.025 | 75% | - | - |

| | වැඩසටහන/ක්‍රියාකාරකම | 2018 වසර සඳහා වූ ඉලක්ක | | 2018/01/01 දින සිට 2018/12/31 දක්වා ප්‍රගතිය | | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|---|---|
| | | භෞතික | මූල්‍ය (රු.මි) | භෞතික | මූල්‍ය (රු.මි) | |
| 15 | රාජ්‍ය අංශයේ වෘත්තීය ඉදිරි මාර්ගය පිළිබඳ අධ්‍යයනය (I) | 100% | 0.095 | 100% | 0.094 | - |
| 16 | ධීවර ක්ෂේත්‍රයේ රැකියා පැතිකඩ අධ්‍යයනය | 100% | 0.050 | 100% | 0.050 | - |
| 17 | රාජ්‍ය අංශයේ වෘත්තීය ඉදිරි මාර්ගය පිළිබඳ අධ්‍යයනය (II) | 100% | 0.175 | 100% | 0.190 | - |
| 18 | ස්වයං රැකියා පිළිබඳ අධ්‍යයනය (Extended Report) | 100% | - | 100% | - | - |
| 19 | ශ්‍රම වෙළඳපොළ තොරතුරු සඟරාව තැටිය (bulletin CD) | 100% | 0.083 | 100% | 0.082 | - |
| 20 | ශ්‍රම වෙළඳපොළ සම්මේලනය ( LMI forum) | 100% | 0.822 | 100% | 0.744 | - |
| 21 | සමාජ ආර්ථික දත්ත අත්පොත (Socio - Economic Data Hand book) | 100% | 0.750 | 100% | 0.722 | - |
| | **රැකියා කේන්ද්‍රය** | | | | | |
| 22 | දිස්ත්‍රික් රැකියා කේන්ද්‍ර මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම හා ආරම්භ කිරීම | 4 | 2.750 | 4 | | - |
| 23 | දිස්ත්‍රික් රැකියා පොළ පැවැත්වීම | 7 | | 7 | 1.267 | 6615 |
| 24 | රැකියා අපේක්ෂිතයන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 150 | 0.750 | 197 | 0.715 | 7597 |
| 25 | WAPES Membership -ලෝක මහජන රැකියා සේවා සංගමය | 100% | 0.500 | | | - |
| 26 | දිස්ත්‍රික් රැකියා කේන්ද්‍ර පවත්වාගෙන යාම | 100% | 1.354 | 100% | 1.374 | |
| * | රැකියා අපේක්ෂිතයන් ලියාපදිංචි කිරීම (ප්‍රතිලාභීන්) | 371908 | | 121016 | | |
| * | රැකියා පුරප්පාඩු ලියාපදිංචි කිරීම | 35402 | | 31933 | | |
| * | රැකියා ගැලපීම | | | 27546 | | |
| * | රැකියා ගත කිරීම (ප්‍රතිලාභීන්) | 24097 | | 12807 | | |
| 27 | හාම්පුතුන් සමඟ කතිකාවත Conducting of Employer Forums | 19 | 0.346 | 14 | 0.286 | |
| 28 | අවශ්‍යතාවය අනුව පවත්වන විශේෂ වැඩසටහන්/ Tailormade Programmes for Companies and Job Seekers | 10 | 0.300 | 35 | 0.300 | - |
| | **කළමනාකරණ තොරතුරු පද්ධතිය - MIS** | | | | | |
| 29 | මූලික ව්‍යාපාර අධ්‍යයනය-Business Analysis Study | 100% | 0.500 | 90% | 0.515 | - |
| 30 | තෝරා ගත් දිස්ත්‍රික්ක සඳහා ක්ෂේත්‍ර නිලධාරීන් වෙනුවෙන් ලැප්ටොප් යන්ත්‍ර මිලදී ගැනීම | 100% | 5.000 | 100% | 4.925 | 47 |

| | වැඩසටහන/ක්‍රියාකාරකම | 2018 වසර සඳහා වූ ඉලක්ක | | 2018/01/01 දින සිට 2018/12/31 දක්වා ප්‍රගතිය | | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|---|---|
| | | භෞතික | මූල්‍ය (රු.මි) | භෞතික | මූල්‍ය (රු.මි) | |
| | **සුනිසි මෙහෙවර** | | | | | |
| 31 | ජාතික මානව සම්පත් රැකියා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම | 100% | - | 20% | 0.005 | - |
| 32 | ලක් රැකියා හරසර වැඩසටහනහන * | 100% | 2.160 | 100% | 1.833 | - |
| 33 | ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන | 10 | 0.337 | 13 | 0.337 | 484 |
| 34 | නුවර එළිය දිස්ත්‍රික් රැකියා කේන්ද්‍රය ආරම්භ කිරීම * | 100% | 0.902 | 100% | 0.772 | - |
| 35 | කොරියානු රාජ්‍ය ත්‍රාන්තික මැදිහත් වීම මත සේවා නියුක්තිය හා ශ්‍රම වැඩසටහන් පිළිබඳ ප්‍රතිපත්ති උපදේශන වැඩසටහන* | 100% | 0.128 | 100% | 0.128 | - |
| 36 | අවශ්‍යතා මත පුහුණු විශේෂ පුහුණු වැඩසටහන* | 9 | 0.204 | 9 | 0.205 | 381 |

ජාතික මානව සම්පත් රැකියා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වෙන්ව තිබූ ප්‍රතිපාදන යටතේ වන ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කරන ලදි.(*)

## රැකියාගත කිරීම් 2018/12/31 දක්වා ප්‍රගතිය

| | දිස්ත්‍රික්කය | සෘජු රැකියා ගත කිරීම් | | ස්වයං රැකියාලාභින්/ව්‍යවසායකයින් බිහි කිරීම |
|---|---|---|---|---|
| | | දිස්ත්‍රික් රැකියා කේන්ද්‍ර මගින් | ප්‍රා. ලේ. කා. මට්ටමින් | |
| 01 | කොළඹ | 408 | 294 | 15 |
| 02 | ගම්පහ | 349 | 352 | 92 |
| 03 | කළුතර | 205 | 589 | 64 |
| 04 | මහනුවර | 490 | 427 | 63 |
| 05 | මාතලේ | 139 | 172 | 6 |
| 06 | නුවරඑළිය | 0 | 131 | 0 |
| 07 | ගාල්ල | 176 | 409 | 115 |
| 08 | මාතර | 163 | 496 | 90 |
| 09 | හම්බන්තොට | 236 | 365 | 57 |
| 10 | යාපනය | 442 | 259 | 206 |
| 11 | මන්නාරම | 105 | 76 | 49 |
| 12 | වවුනියාව | 148 | 68 | 38 |
| 13 | මුලතිව් | 24 | 0 | 20 |
| 14 | කිලිනොච්චිය | 32 | 78 | 80 |
| 15 | මඩකලපුව | 113 | 122 | 206 |
| 16 | අම්පාර | 277 | 447 | 442 |

| | | | | |
|---|---|---|---|---|
| 17 | ත්‍රිකුණාමලය | 113 | 61 | 116 |
| 18 | කුරුණෑගල | 511 | 1196 | 521 |
| 19 | පුත්තලම | 31 | 242 | 109 |
| 20 | අනුරාධපුරය | 165 | 112 | 65 |
| 21 | පොළොන්නරුව | 150 | 50 | 38 |
| 22 | බදුල්ල | 561 | 126 | 104 |
| 23 | මොණරාගල | 118 | 147 | 10 |
| 24 | රත්නපුර | 192 | 394 | 131 |
| 25 | කෑගල්ල | 626 | 420 | 116 |
| | එකතුව | **5774** | **7033** | **2753** |

**දිස්ත්‍රික් රැකියා පොළ වැඩසටහනෙහි ප්‍රගතිය - 2018**

| දිස්ත්‍රික්කය | රැකියා අපේක්ෂිත යන් ගණන | සහභාගි වු ආයතන ගණන | පුහුණු ආයතන ගණන | රැකියා ගත කිරීම | රැකියා ගැලපීම | වියදම (රු) |
|---|---|---|---|---|---|---|
| මාතලේ | 549 | 13 | 02 | 44 | 313 | 107,670 |
| අම්පාර | 1876 | 12 | 06 | 68 | 516 | 94,500 |
| අනුරාධපුර | 425 | 25 | 06 | 42 | 214 | 123,055 |
| යාපනය | 985 | 33 | 10 | 191 | 479 | 144,100 |
| බදුල්ල | 1350 | 34 | 08 | 163 | 563 | 298,500 |
| රත්නපුර | 645 | 30 | 10 | 114 | 771 | 207,042 |
| වවුනියාව | 785 | 20 | 09 | 28 | 85 | 161,908 |
| එකතුව | **6615** | **167** | **51** | **650** | **2941** | **1,136,775** |

## සේවා යෝජකයන් සමග පවත්වන ලද විශේෂ වැඩසටහන්

| දිනය | ස්ථානය | සහභාගීත්වය (ආයතන සංඛ්‍යාව) | වැය ශීර්ෂය | වියදම රු. |
|---|---|---|---|---|
| **BOI යටතේ ලියාපදිංචි ව්‍යවසායක ආයතන සමග සාකච්ඡා** | | | | |
| 2018 පෙබරවාරි 27 | බියගම | 14 | - | - |
| 2018 අප්‍රේල් 02 | කටුනායක | 13 | 2 2509 | 1,180.00 |
| 2018 අප්‍රේල් 27 | පල්ලෙකැලේ | 18 | 2 2509 | 650.00 |
| 2018 මැයි 30 | වතුපිටිවල | 10 | 2 2509 | 1,145.00 |
| **දිස්ත්‍රික් ව්‍යවසායක සමුළු** | | | | |
| 2018 අප්‍රේල් 18 | අම්පාර | | 11 2509 | 11,625.53 |
| 2018 අප්‍රේල් 26 | කළුතර | 52 | 2 2509 | 35,450.00 |
| 2018 ජුනි 12 | කොළඹ | 25 | 2 2509 | 59,590.00 |
| 2018 ජුනි 20 | යාපනය | 35 | 11 2509 | 32,500.00 |
| 2018 ජුනි 25 | ගම්පහ | 47 | 2 2509 | 51,100.00 |
| 2018 ජුලි 25 | මාතර | 74 | 2 2509 | 40,710.00 |
| 2018 සැප්තැම්බර් 13 | රත්නපුර | 43 | 2 2509 | 46,080.00 |

මේ මගින් සේවා යෝජකයන් හා දිස්ත්‍රික් රැකියා කේන්ද්‍ර හා ජාතික රැකියා කේන්ද්‍ර අතර එනම් සමස්ථයක් වශයෙන් දෙපාර්තමේන්තුවත් දෙපාර්තමේන්තුවේ සේවය සැපයිය හැකි සේවා යෝජකයන් අතරත් යහපත් සම්බන්ධතාවයක් ඇති කර ගැනීම මගින් රැකියා සේවා ලබා ගැනීම හා සැපයීම අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රතිලාභ සලසා ගැනීම මෙහි මූලික අරමුණ වේ.

## ලක් රැකියා හරසර වැඩසටහන

මෙම වැඩසටහන 2018 වර්ෂයේ දෙසැම්බර් 13 වෙනි දින සුහුරුපාය ප්‍රධාන සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්විණි. සේවා යෝජකයන් හා දෙපාර්තමේන්තු සේවක මණ්ඩලය යන පාර්ශව දෙකහිම සහභාගිත්වයෙන් සිදු කෙරෙන නියමු ව්‍යාපෘතියකි. මෙහිදී රැකියා ලබා දීම හා අනෙකුත් පහසුකම් සැපයීම සම්බන්ධව සේවා යෝජකයන් ඇගයීමට ලක් කරන ලදි. එසේම රැකියා අපේක්ෂිතයන් රැකියා ගත කරවීම ප්‍රමුඛ කොට ගෙන වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මේ ඉලක්කයන් ලඟා කර ගැනීම පිළිබඳව දෙපාර්තමේන්තු නිලධාරීන් ඇගයීම සිදු කරන ලදි. මෙහිදී කණ්ඩායම් ගොඩනැගීම, එක් එක් සේවකයාගේ හැකියාවන් ඔප් නංවා උපරිම ඵලදායිතාවයක් ලබා ගැනීම තුළින් දෙපාර්තමේන්තුවේ මානව සම්පත ජාතික අරමුණු සාක්ෂාත්කර ගැනීම අපේක්ෂිතය. දිස්ත්‍රික් වශයෙන් දෙපාර්තමේන්තු සේවකයන් ඇගයීමට ලක්කරන ලද අතර තෝරා ගත් දිස්ත්‍රික්ක තුනක සේවා යෝජක ආයතන ඇගයීම සිදු කරන ලදි. මෙම නියමු ව්‍යාපෘතියේ සේවා යෝජකයන් ඇගයීමට ලක් කරන ලද්දේ යාපනය, කුරුණෑගල හා අම්පාර යන දිස්ත්‍රික්ක තුළ වේ. මෙම ව්‍යාපෘතියට ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇති අතර එය 2019 - 2021 මධ්‍යකාලීන අයවැය රාමුව ඔස්සේ ප්‍රතිපාදන සැලසීමට නිර්දේශ කර ඇත.

## කොරියානු රාජ්‍ය ත්‍රාන්තික මැදිහත් වීම මත සේවා නියුක්තිය හා ශ්‍රම වැඩසටහන් පිළිබඳ ප්‍රතිපත්ති උපදේශන වැඩසටහන

කොරියානු ජනරජය විදේශ රටවල් සමග විශේෂයෙන්ම සේවා නියුක්තිය හා කම්කරු ක්ෂේත්‍රය පිළිබඳ ද්විපාර්ශවීය සම්බන්ධතාවය පැවැත්වීමේදී විශේෂ වැදගත්කමක් ශ්‍රී ලංකාව වෙත ලබා දී ඇත. 2016 දී සේවා නියුක්තිය හා කම්කරු කටයුතු පිළිබඳ කොරියානු අමාත්‍යාංශය ශ්‍රී ලංකාවේ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය සමග සහයෝගීතා වැඩසටහන් ආරම්භ කරන ලදි. 2018 වර්ෂයේදී ද මේ පිළිබඳ කොරියානු මහාචාර්යවරුන් ඇතුළු සේවා නියුක්තිය, වෘත්තීය මාර්ගෝපදේශනය, මහජන රැකියා සේවා සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා ඇගයීම පිළිබඳ කණ්ඩායමක් ශ්‍රී ලංකාවේ සංචාරය කරන ලදි. මෙහිදී කොරියානු ජනරජය හා සේවා නියුක්තිය හා මහජන රැකියා සේවය පිළිබඳ ද්වි පාර්ශවික අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදි. මෙවර මහජන රැකියා සේවයේ ව්‍යුහය වෘත්තීය මාර්ගෝපදේශන ලබා දීම හා මාර්ගගතව මහජන රැකියා සේවා ලබා දීම පිළිබඳව කොරියානු අත්දැකීම් දෙපාර්තමේන්තුව වෙත විස්තර කරන ලදි. එසේම කොරියානු ජනරජයේ මහජන රැකියා සේවය වර්තමාන තත්වයට පත් වීමේදී පසු කරන ලද සන්ධිස්ථාන හා ගැටළු, එම ගැටළු විසදාගත් ආකාරය පිළිබඳ අප දෙපාර්තමේන්තුව දැනුවත් කරන ලදි. කොරියානු ජනරජයේ සාර්ථක ආදර්ශ (Benchmark) සහය හා උපදේශකත්වය මත ශ්‍රී ලංකාවේ මහජන රැකියා සේවය වැඩි දියුණු කිරීම පිළිබඳ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට යෝජනා වී ඇත.

## නුවරඑළිය රැකියා කේන්ද්‍රය ආරම්භ කිරීම

මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව දිස්ත්‍රික් රැකියා කේන්ද්‍රයන් ස්ථාපිත කිරීම මගින් දිස්ත්‍රික්කයේ තරුණ විරැකියාව අවම කිරීම, රැකියා අපේක්ෂිතයන් ලියාපදිංචි කිරීම, රැකියා ඇබෑර්තු ලියාපදිංචිය, රැකියා ගැලපීම හා රැකියා ගත කිරීම, ශ්‍රම වෙළඳපොළ පිළිබඳව රැකියා අපේක්ෂිතයන් දැනුවත් කිරීම, තම තමන් අභිමත වෘත්තීය ක්ෂේත්‍රයන්ට පිවිසීම සඳහා පුහුණු ආයතන රැකියා අපේක්ෂිතයන්ට හඳුන්වා දීම ප්‍රධාන වශයෙන් අපේක්ෂිතය. මෙහිදී එක් මධ්‍යස්ථානයක් මගින් රැකියා ආශ්‍රිත සේවා සියල්ල ලබා දීම ප්‍රධාන ක්‍රමවේදයයි. මෙය ප්‍රධාන වශයෙන් 2018 වර්ෂයේ සුනිසි මෙහෙවර ප්‍රතිපාදන මත ස්ථාපනය කරන ලදි.

# ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය 2007 සැප්තැම්බර් 11 වන දින නිල වශයෙන් ස්ථාපිත කරන ලද අතර 2010 අංක 12 දරන ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනත මගින් බලාත්මක කරන ලදී. එම ආයතනය, කම්කරු ක්ෂේත්‍රයේ ත්‍රෛපාර්ශව හවුල් කරුවන් වන සේව්‍ය පාර්ශවය, වෘත්තීය සමිති නියෝජනය වන සේවක පිරිස් හා රජයේ නිලධාරීන්ගෙන් සැදුම්ලත් පාලක මණ්ඩලයන් මගින් පාලනය වේ. ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය වර්තමානයේදී කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

කම්කරු අණපනත්, නිතී රීති රෙගුලාසි පිළිබඳව දැනුවත් ඵලදායි ශක්තිමත් ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, සංවිධානය හා මෙහෙයවීම මෙම ආයතනය මගින් සිදුකරනු ලබයි.

මෙම කාර්යයන් ඉටු කිරීම සඳහා ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය තුළ පහත දැක්වෙන ප්‍රධාන අංශ 3ක් ක්‍රියත්මක වේ.

I. පුහුණු හා සංවර්ධන අංශය
II. පර්යේෂණ, සැලසුම් හා ප්‍රකාශන අංශය
III. පාලන හා මුදල් අංශය

### 2018-01-01 සිට 2018-12-31 දක්වා සිදුකළ වැඩසටහන් වල ප්‍රගතිය

| වැඩසටහන් විස්තරය | සැලසුම් කළ වැඩසටහන් සංඛ්‍යාව | අපේක්ෂා කළ ආදායම(රු.) | පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව | ලද ආදායම (රු.) |
|---|---|---|---|---|
| ඩිප්ලෝමා | 6 | 7,155,000.00 | 4 | 5,117,000.00 |
| ඒක්දින වැඩසටහන් | 66 | 2,535,000.00 | 43 | 2,583,600.00 |
| දෙදින වැඩසටහන් | 43 | 5,670,000.00 | 39 | 3,606,000.00 |
| තුන්දින වැඩසටහන් | 14 | 2,160,000.00 | 14 | 1,802,400.00 |
| සිව් දින වැඩසටහන් | 4 | 600,000.00 | 4 | 1,317,500.00 |
| සහතිකපත්‍ර පාඨමාලා | 13 | 2,535,000.00 | 14 | 2,753,900.00 |
| Donor Funded Project | 1 | 800,000.00 | 1 | 12,498,320.00 |
| වැඩමුළු | 12 | 7,480,000.00 | 14 | 5,610,000.00 |
| විභාග පැවැත්වීව | 18 | 720,000.00 | 16 | 3,131,109.54 |
| Tailor Made | 15 | 675,000.00 | 35 | 3,210,630.00 |

### 2018 වර්ෂයේ විශේෂ ක්‍රියාකාරකම්

### විදේශ රැකියා ඒජන්තවරුන් පුහුණු කිරීමේ සහතිකපත්‍ර පාඨමාලාව

මෙම පාඨමාලාව ජාත්‍යන්තර විගමන සංවිධානය (IOM), විදේශ රැකියා නියුක්ති කාර්යාංශය හා එක්ව සැළසුම් කර ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය මගින් විදේශ රැකියා ඒජන්තවරුන් උදෙසා පවත්වන ලද ‘Promoting Ethical Conduct and Professionalizing the Recruitment Industry in Sri Lanka’ ව්‍යාපෘතිය හා සම්බන්ධ සහතික පත්‍ර පාඨමාලාවකි.

විදේශ රැකියා නියුක්ති කාර්යාංශය යටතේ ලියාපදිංචි හා ශ්‍රී ලංකාව තුළ විදේශ රැකියා ඒජන්තවරුන් ලෙස කටයුතු කරනු ලබන ආයතනයන්හි නිළධාරීන්ගේ හා ආයතනයන්හි ධාරිතා සංවර්ධනය ඉලක්ක කර ගනිමින්

සැළසුම් කරන ලද උක්ත පාඨමාලාව 2018 වර්ෂය තුළ ඉලක්කගත ඒජන්තවරුන් 400 ක් සඳහා ක්‍රියාත්මක කරන ලදී. මෙම පාඨමාලාව අධ්‍යයන මොඩියුල 14 කින් සමන්විත වූ සහතික පත්‍ර පාඨමාලාවකි.

ඒ අනුව මීට අදාළව කොළඹ ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය තුළ සිංහල මාධ්‍ය පාඨමාලා 4ක්, දෙමළ මාධ්‍ය පාඨමාලා 01ක් හා ඉංග්‍රිසි මාධ්‍ය පාඨමාලා 01ක් ලෙසත්, කුරුණෑගල කේන්ද්‍ර කර ගත් සිංහල මාධ්‍ය පාඨමාලා 02ක් ද මහනුවර පොල්ගොල්ල සමූපකාර මධ්‍යස්ථානය තුළ සිංහල පාඨමාලා 01ක් ද මඩකලපුවේ දෙමළ පාඨමාලා 02ක් ද ලෙස සමස්ථ පාඨමාලා 10ක් ක්‍රියාත්මක කරන ලදී.

### සමෘද්ධි සංවර්ධන නිලධාරීන් ඉලක්ක කර ගත් ඩිප්ලෝමා පාඨමාලාව

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව හා ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය අතර ඇති කර ගත් අවබෝධතා ගිවිසුමක් මත සමෘද්ධි සංවර්ධන නිලධාරීන් ඉලක්ක කර ගනිමින් මානව සම්පත් සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාවන් 2018 වර්ෂයේ දී ආරම්භ කරන ලද අතර එය 2018 - 2019 වර්ෂයන් තුළ මොඩියුල 12ක් හා සහතිකපත්‍ර පාඨමාලා 03ක් යටතේ සම්පූර්ණ කිරීමට නියමිතය.

මෙම පාඨමාලාවන් සඳහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි සේවයේ නියුතු සමෘද්ධි සංවර්ධන නිලධාරීන් 50ක් තෝරා ගනිමින් එම දෙපාර්තමේන්තුව මගින් ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය වෙත ගෙවන ලද රු. 2,550,000 ක මුදලක් යටතේ පැවැත්වීමට තීරණය කර ඇත.

# ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

2009 අංක 38 දරණ ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතන පනත මඟින් කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ අනුබද්ධ ආයතනයක් ලෙසින් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය පිහිටුවන ලදී.

**දැක්ම**

සැමට වෘත්තීය සුරක්ෂිතතාව සෞඛ්‍ය සහ සුභසාධනය ලබා දීම

**මෙහෙවර**

සේවා ස්ථානවල සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය සහතික කරලීම සහ ඵලදායිතාව වර්ධනය කිරීම සඳහා සියලු ආකාරයේ රැකියා උපද්‍රවයන් වළක්වාලීම පිණිස අධ්‍යාපනය පුහුණුව හා පර්යේෂණය තුළින් ත්‍රෛපාර්ශවීය කොටස් කරුවන් සවිබලගැන්වීම

**ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ වැඩසටහන් සහ ක්‍රියාකාරකම්**

- වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
- වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
- වැවිලි අංශයේ වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ උසස් සහතිකය
- බොයිලේරු ක්‍රියාකරවන්නන් පුහුණු කිරීම
- කාර්මාන්තයන් පිළිබඳ වැඩ අධ්‍යයන වැඩසටහන
- කර්මාන්ත ක්ෂේත්‍රයේ හෙදියන් පුහුණු කිරීම
- රෝහල් කාර්ය මණ්ඩලය සඳහා වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍යය
- කාර්යාලයීය කාර්ය මණ්ඩලය සඳහා වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍යය
- පරික්ෂණාගාරවල වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍යය
- රසායනික ද්‍රව්‍ය ආරක්ෂා සහිතව පරිහරණය කිරීම
- ආහාර පරිහරණය කරන්නන් සඳහා සුරක්ෂිතතාව සහ සෞඛ්‍යය
- ආතති කළමනාකරණ පුහුණු වැඩසටහන

1. පාරිසරික සමීක්ෂණ
   - වාතයේ තත්ත්වය සමික්ෂණය කිරීම සඳහා Indoor Air Quality හා දුම් පරික්ෂා කිරීම සඳහා Flu Gas Analyzer meter උපකරණය භාවිතා කිරීම
   - කර්මාන්තය තුළ දූවිලි මට්ටම් සමීක්ෂණය කිරීම හා දූවිලි පොම්ප උපකරණ භාවිතා කිරීම.
   - ඝෝෂා මට්ටම සමීක්ෂණය කිරීම හා ශබ්ද මැනීමට Sound Level Meter උපකරණය භාවිතා කිරීම.
   - උෂ්ණත්ව මට්ටම සමීක්ෂණය කිරීම හා Heat Stress Meter (තාප ආතති) දර්ශකය භාවිතා කිරීම.

2. වෛද්‍ය පරික්ෂණ
   - ශ්‍රවණ තත්වය මැනීමේ පරික්ෂණ
   - රුධිර විශ්ලේෂණය
   - වැඩ කිරීමට යෝග්‍යතාව තක්සේරු කිරීම
   - පෙනහළු ක්‍රියාකාරිත්වය පිළිබඳ පරික්ෂණ
   - දෘෂ්ටි පරික්ෂණ

3. වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍යය පිළිබඳ ජාතික ආයතනයේ සිද්ධි කළමනාකරණය සහ පරිපාලන සේවය

**2018.01.01 - 2018.12.31 දින දක්වා ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ විශේෂ වැඩසටහන් හා ඒවායේ මුල්‍ය හා භෞතික ප්‍රගතිය**

| | පාඨමාලාව | පැවැත් වූ පාඨමාලා ගණන | සහභාගී වූ සංඛ්‍යාව | මුල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|---|
| 01 | ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 02 | 102 | 9.84 |
| 02 | ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව | 04 | 128 | 5.95 |
| 03 | ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා දෙදින වැඩමුළුව | 01 | 18 | 0.18 |
| 04 | අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ එක්දින වැඩමුළුව | 02 | 51 | 0.23 |
| 05 | සිංගර් ආයතනයේ සේවකයින් සඳහා වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ දෙදිනක දැනුවත් කිරීමේ වැඩසටහන | 01 | 62 | 0.50 |
| 06 | හෙදියන් සඳහා වු එක්දින වැඩමුළුව | 01 | 17 | 0.06 |
| 07 | ඇඟලුම් ක්ෂේත්‍රය අලලා ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ දැනුවත් කිරීමේ එක්දින වැඩමුළුව | 01 | 23 | 0.09 |
| 08 | අභ්‍යන්තර වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ එක් දින වැඩමුළුව | 01 | 85 | 0.30 |
| 09 | ISO 14001 ප්‍රමිති පිළිබඳ එක්දින වැඩමුළුව | 01 | 40 | 0.20 |
| 10 | සුපරීක්ෂකවරුන් සඳහා වු එක්දින සුරක්ෂිතතා වැඩමුළුව | 01 | 10 | 0.04 |
| 11 | රසායනික ද්‍රව්‍ය භාවිතය පිළිබඳ එක්දින වැඩමුළුව | 01 | 43 | 0.15 |
| 12 | විදුලි ආරක්ෂණ ක්ෂේත්‍රය පිළිබඳ දෙදින වැඩමුළුව | 02 | 41 | 0.41 |

**විශේෂ වැඩසටහන්**

| | | |
|---|---|---|
| 13 | වෘත්තීය සුරක්ෂිතතාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම (වෘත්තීය සමිති) | 2018 ඔක්තෝම්බර් 08 |
| 14 | වෘත්තීය සුරක්ෂිතතාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් මාධ්‍යවේදීන් සඳහා පැවැත්වීම | 2018 ඔක්තෝම්බර් 09 |
| 15 | TVAC ආයතනය සඳහා වෘත්තීය සුරක්ෂිතතාවය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් පැවැත්වීම | 2018 සැප්තැම්බර් 21 |
| 16 | පාසල් සිසුන් සඳහා වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන - පාදුක්ක කණිෂ්ඨ විද්‍යාලය | 2018 මැයි 18 |
| 17 | ගෝතමී විද්‍යාලයේ පැවති විද්‍යා ප්‍රදර්ශනය සඳහා ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය සහභාගි වීම හා ප්‍රථමාධාර පිළිබඳ දේශනයක් පාසල් සිසුන් සඳහා පැවැත්වීම | 2018 ජූනි 29 |
| 18 | වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා වු එක්දින වැඩමුළුව | 2018 නොවැම්බර් 29 |

## දෛනික වැඩසටහන්

### පාරිසරික මිනුම් ගැනීම

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය මගින් වැඩපරිසරය පිළිබඳ මිනුම් හා වාර්තා ලබාදීම සිදුකරනු ලැබේ. මෙහි දී වැඩ පරිසරයේ ශබ්ද පරීක්ෂාව, ආලෝක තත්ත්වයන්, උෂ්ණත්ව පරීක්ෂාව, දූවිලි අංශු පරීක්ෂාව සහ විෂ වායු පරීක්ෂාව සිදුකරනු ලැබේ.

**2018 වර්ෂයේ සිදුකරන ලද පාරිසරික සමීක්ෂණ ප්‍රමාණය පහත පරිදි දැක්විය හැක.**

| පාරිසරික සමීක්ෂණය | ආයතන ප්‍රමාණය |
|---|---|
| ශබ්දය | 170 |
| ආලෝකය | 165 |
| උෂ්ණත්වය | 160 |
| දූවිල්ල | 169 |
| වාතය (Emission) | 130 |
| වාත සමීක්ෂණය | 130 |

### අවධානම් තක්සේරු කිරීම

මෙහි දී විවිධ ආයතනයන්ට ගොස් අවධානම් තක්සේරු කිරීම සිදුකරනු ලබයි. 2018 වර්ෂයේදී එවැනි පරීක්ෂණ 10 ක් සිදු කිරීමට සැලසුම් කරන ලද අතර පරීක්ෂණ 40ක් සිදු කර ඇත.

### වෘත්තීය සුරක්ෂිතතාව නැංවීම සඳහා තේ / රබර් වතු ආශ්‍රිත ILO වැඩසටහන

මෙම වැඩසටහන විශේෂ වැඩසටහන් ලෙස ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මූල්‍ය අධාර සහිතව 2018 වර්ෂයේ පෙබරවාරි මාසයේ ආරම්භ කරන ලදී.

මෙහිදී රබර් කර්මාන්ත වල නියුතු කම්කරුවන්ගේ සුරක්ෂිතභාවය තහවුරු කිරීමට විශේෂ වැඩමුළුවක් පවත්වන ලදී. එහි දී පළමු අදියර ලෙස වතු අධිකාරිවරු දැනුවත් කිරීමේ එක්දින වැඩසටහනක් රත්නපුර හා ගාලු දිස්ත්‍රික්කවලදී සිදු කෙරිනි.

ඉන් පසු තේ හා රබර් ආශ්‍රිත කර්මාන්ත ආයතනවල ඉහළ කළමනාකාරිත්වය දැනුවත් කිරීමට දින තුනක වැඩසටහන් දෙකක් පැවැත් වූ අතර එක් වැඩසටහනකට 50 කට වැඩි පිරිසකගේ සහභාගිත්වයක් සිදු විය. මෙහි දී විශේෂයෙන් යුනිලිවර් ආයතනයේ සුරක්ෂිතභාවය තහවුරු කරන ආකාරය මෙන්ම එම ආයතනයන්ට ගොස් එහි දී විශේෂ දැනුවත් කිරීමක් සිදු කෙරිනි.

ඉන් අනතුරුව වතු 38කට වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය විගණනය සිදු කරමින් ඒ ඒ ආයතන වල ඇති සුරක්ෂිතා ක්‍රමයන් පිළිබඳ අධ්‍යයනයන් සිදුකරන ලදී. ඉන්පසු සියලුම වතු අධිකාරිවරු මේ පිළිබඳව දැනුවත් කරමින් ඔවුනට වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය වැඩිදියුණු කිරීමට උපදෙස් ලබාදෙන ලදී. තවද වතු අධිකාරිවරු සඳහා විශේෂ අත්මේස් සකස් කරන ලදී.

තවද ගී කියන කන්ද හා ඕපාත වතුයාය දෙක සඳහා තේ දළු නෙලන හා රසායනික භාවිත කරන්නන් සඳහා පුද්ගල ආරක්ෂක උපකරණ කට්ටල ලබාදීමත් ආරක්ෂක උපකරණ භාවිතය පිළිබඳ දැනුම ලබා දීමත් සිදුකරන ලදී.

සාර්ථක දැනුවත් කිරීමේ කටයුතු හා ප්‍රායෝගික දැනුම ලබාදීම සිදුකරන ලද අතර අවසාන වශයෙන් ILO විශේෂඥයින් විසින් තුන්දින වැඩමුළුවක් පවත්වන ලදී.

## වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන

පාසල් සිසුන්හට සුරක්ෂිතතාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය විසින් 2018 මැයි මස 18 වන දින පාදුක්ක ආනන්ද සමරකෝන් ආදර්ශ කනිෂ්ඨ විද්‍යාලයේ දී පැවැත්වීම. මෙහිදි විද්වත් දේශකයෙන් දෙදෙනෙකු සහභාගි වූ අතර පාසල් සිසුන් 100කට වැඩි පරිසක් සහභාගි විය. මෙහි සුවිශේෂත්වය වූයේ මේ සඳහා පාසල් සිසුන්, ගුරු මණ්ඩලයට අමතරව සිසුන්ගේ දෙමාපියන්ද මේ වැඩසටහනට සහභාගි වී සිටීමයි. පාසල් කිහිපයක සහභාගිත්වය මෙහිදි සිදු විය. මෙහිදි ආහාර සුරක්ෂිතතාවය හා මත්ද්‍රව්‍ය පිළිබඳ වැඩමුළුවක් පැවැත්විය. එමෙන්ම එදිනට සහභාගි වූ සිසුන් හට සහභාගිත්ව සහතික පත්‍රයක්ද නිකුත් කිරීම සිදු කරන ලදී.

## පෞද්ගලික ආරක්ෂණ උපකරණ භාවිතය පිළිබඳ එක් දින ප්‍රදර්ශනය හා ප්‍රථමාධාර දේශනය

කොළඹ ගෝතමී විද්‍යාලයේ ආරාධනයෙන් එම විදුහලේ ප්‍රදර්ශන කුටියක් පාසල් සිසුන් සඳහා විවෘත කෙරුණි. විද්‍යා සතිය වෙනුවෙන් පැවැත්වූ මෙම වැඩසටහන සඳහා පාසල් කිහිපයක සහභාගිත්වය සිදු විය. මෙහිදි පාසල් සිසුන්හට ඔවුන්ගේ ආරක්ෂාව තහවුරු කර ගැනීම ආදාල උපදෙස් ලබාදීම සිදු කරන ලදී. මීට අමතරව හදිසි ගිනි ගැනීමක දී සිදු කළ යුතු දෑ මෙන්ම, ගිනි ආරක්ෂක උපකරණ භාවිතය පිළිබඳ දැනුම පාසල් සිසුන් හට ලබා දීම සිදුකරන ලදී. එමෙන්ම මෙදින දී පාසල් සිසුන්හට අවශ්‍ය ප්‍රථමාධාර පිළිබඳ අවශ්‍ය දැනුම ලබාදීම සඳහා දේශනයක් ද පැවැත්වීම සිදුකරන ලදී.

## සුනිසි මෙහෙවර යටතේ ක්‍රියාත්මක කළ වැඩසටහන්

Mas Kreeda ආයතනය සමග එකතුවී ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය විසින් පාසල් ළමුන්ගේ සුරක්ෂිතතාවය වර්ධනය කිරීම උදෙසා ඔක්තෝබර් 30වන දින තුල්හිරිය Mas ආයතනයේ මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මෙහි දී ශ්‍රී ලංකාව පුරා විසිරි ඇති තෝරාගත් පාසල් කිහිපයක් සුරක්ෂිතතා කමිටු ඇති කිරීම සිදු විය. එදින පාසල් ළමුන්, විදුහල්පතිවරුන්, ගුරුවරුන් හා දෙමාපියන් රැසකගේ දායකත්වය ලබා දීම සිදුකරන ලදී. මෙහි දී චිත්‍ර ප්‍රදර්ශනයක් පැවති අතර ජයග්‍රහණය කරන ලද සිසුන් සඳහා සහතික පත්‍ර ලබාදීම සිදුකරන ලදී. එමෙන්ම එදින සහභාගි වූ සිසුන් සියලු දෙනා හට තම ආරක්ෂාව හා පාසලේ දී අන් අයගේ ආරක්ෂාව ලබාදීම පිළිබඳ හරවත් දේශන කිහිපයක් පවත්වන ලදි. අතර එදින පැමිණි සියලු දෙනා හට සුරක්ෂිතතාව පිළිබඳ අත්පොතක් ලබාදීම සිදුකරන ලදී. මෙම වැඩසටහන ලංකාව පුරා ව්‍යාප්ත කිරීමට හා අඛණ්ඩව පාසල් සමග එක් වී කටයුතු කිරීමට නියමිතය. එමෙන්ම මෙහිදී ප්‍රධාන අරමුණ වූයේ පාසල් තුළ සුරක්ෂිතතා කමිටු පිහිටුවීමත් ඔවුන් පාසල් අධ්‍යාපනයෙන් පසු රැකියාවෙහි යෙදෙන විට ඔවුන්ගේ සුරක්ෂිතතාවය වර්ධනය කිරීම උදෙසා මහත් සහයෝගයක් ලබා දීමත්ය. මෙහි දී අනුරාධපුරය, කිලිනොච්චිය, කෑගල්ල, තුල්හිරිය ආදි ස්ථානයන්හි පාසල් වල සහභාගිත්වය ද සිදු විය.

## ජාතික සුරක්ෂිතතා වෘත්තිකයන්ගේ සංවිධානය

NIOSH සමාජිකත්ව වැඩසටහනෙහි සමාරම්භක උත්සවය හිල්ටන් හෝටලයේ දී පැවැත්වීම. මෙහි දී NIOSH සමාජිකත්වය ලබා ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳ සමාජිකයින් දැනුවත් කිරීම සිදු කරනු ලැබීය. එමෙන්ම NIOSH සමාජිකත්වය ලබාගැනීමෙන් පසු ලැබෙන ප්‍රතිලාභ පිළිබඳව දැනුවත් කිරීමේ දේශන හා එහි වැදගත්කම පිළිබඳව පැහැදිලි කිරීම් සිදුකරනු ලැබීය.

## වෘත්තීය සුරක්ෂිතතා සෞඛ්‍ය ප්‍රමිති පිළිබඳ දේශනය

මෙම දේශනය අගෝස්තු මස 29 දින BMICH හි සුරක්ෂිතතා නිලධාරින් හා කර්මාන්ත ක්ෂේත්‍රයේ සේවයෙහි නියුතු සියලු දෙනාහට අවශ්‍ය දැනුම ලබාදීම සඳහා දේශන පැවැත්විය.

## CIC කෘෂි නිෂ්පාදන ආයතනය සඳහා නිවැරදි ඉරියව් භාවිතය පිළිබඳ එක් දින වැඩමුළුව

2018.10.18 දින ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය විසින් එක් දින වැඩසටහනක් සීඅයිසී ආයතනය සඳහා පවත්වන ලදී. මෙහි දී සේවයෙහි නිරත වීමේ දී නිවැරදි ඉරියව් භාවිතය පිළිබඳ වැඩි අවබෝධයක් මෙම ආයතනයේ සේවකයින් සඳහා ලබාදීම සිදුකරන ලදී. මෙම වැඩසටහන සඳහා 50 කගේ සහභාගිත්වය සිදුවිය.

මීට අමතරව 2018 දෙසැම්බර් 11වන දින සුපරීක්ෂකවරුන් සඳහා සුපරීක්ෂක පුහුණුවක් ලබාදීම සිදුකරන ලදී.

පොත් ද්වීත්වයක් වැවිලි අංශයේ වෘත්තීය සුරක්ෂිතතා නිලධාරින් සඳහා සකස් කිරීම

### ජාතික වෘත්තීය සුරක්ෂිතතා සතිය

කැබිනට් මණ්ඩලය මගින් සෑම වර්ෂයකම ඔක්තෝබර් මස 2 වන සතිය රැකියාවල නියුක්ත වෘත්තිකයන්ගේ සෞඛ්‍යය හා සුරක්ෂිතතාවය තහවුරු කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සතිය ප්‍රකාශයට පත් කොට ඇත.

### අරමුණු

මෙවර ජාතික වෘත්තීය සුරක්ෂිතතා සතිය 2018 ඔක්තෝබර් මස 02 වන දින සිට ඔක්තෝබර් 09 වන දින දක්වා පැවති අතර ඒ සම්බන්ධයෙන් පහත ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලදී.

1. වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ජාතික සම්න්ත්‍රණය - 2018 ඔක්තෝබර් 02- කොළඹ ගලධාරි හෝටලයෙහි පැවැත්වීම.

2. වෘත්තීය සුරක්ෂිතතා නිලධාරින් සඳහාවන ඩිප්ලෝමා ප්‍රධානෝත්සවය - 2018 ඔක්තෝබර් 02 දින පැවැත්වීම.

3. වෘත්තීය සුරක්ෂිතතා නිලධාරින් සඳහා වන සහතික පත්‍ර පාඨමාලාව - 2018 ඔක්තෝබර් 02 වන දින පැවැත්වීම.

4. වෘත්තීය සුරක්ෂිතතාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම - මාධ්‍යවේදීන් සඳහා කොළඹ රජයේ ප්‍රවෘත්ති පත්‍ර දෙපාර්තමේන්තුවෙහි 2018 ඔක්තෝබර් 09 පැවැත්වීම.

### වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ජාතික සම්මන්ත්‍රණය.

මෙම සම්මන්ත්‍රණය 2018 ඔක්තෝබර් 02 වන දින පෙ.ව 9.00 සිට කොළඹ ගලධාරි හෝටලයේ දී පවත්වන ලදී. මෙහි තේමාව වූයේ වෘත්තීය සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය කලමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම හා වෘත්තීය ආපදා සඳහා සූදානම් වීමය. මෙහි මූලික අරමුණ වූයේ වෘත්තීකයන්ගේ සේවා සුරක්ෂිතතාවය හා ආරක්ෂාව තහවුරු කිරීම සඳහා අපේ රටේ හා අනෙකුත් ලෝකයේ රටවල්වල නව තාක්ෂණය හා නව ක්‍රමවේදයන් භාවිතය සෞඛ්‍ය ප්‍රමිති පිළිබඳ අවබෝධය හා වර්ධනය වැඩිකරමින් සහභාගිවන සමාජිකයන් දැනුවත් කිරීමය. මෙහි දී විදේශීය දේශීය සම්පත් දායකයින්ගේ සහභාගිත්වය ද සිදුවිය. එසේම හරවත් දේශන මෙම සම්මන්ත්‍රණය තුළ ඇතුළත් විය. මේ සඳහා ශ්‍රී ලාංකික සේව්‍ය සේවක දෙපාර්ශවයම නියෝජනය කරමින් 350 කට වැඩි කර්මාන්ත හිමියන්, සුරක්ෂිතතා නිලධාරින්ගේ සහභාගිත්වය සිදු විය.

### ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය සඳහා වෑන් රථයක් මිලදී ගැනීම.

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය විසින් සිදුකරනු ලබන සේවාවන් තව දුරටත් ව්‍යාප්ත කිරීම සඳහා වෑන් රථයක් මිළදී ගැනීම සිදුකරනු ලැබීය.

# කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය

සේවයේ යෙදී සිටින අවස්ථාවේදී සිදුවන අනතුරු සම්බන්ධයෙන් වන්දි ලබාදීම සඳහා 1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥා පනත පනවා ඇත. මෙම පනතට යම් යම් අවස්ථාවන්හිදී සංශෝධන කිහිපයක් ඇතුළත් වූ අතර, අවසාන සංශෝධනය 2005 අංක 10 පනතින් සිදුකර ඇත. කම්කරු වන්දි උසාවිය දිසා විනිසුරු හා මහේස්ත්‍රාත් බලතල සහිතව මුළු දිවයිනම ආවරණය වන පරිදි සංචාරක උසාවි 14 කින් ද සමන්විත වේ. අධිකරණ සේවා කොමිෂන් සභාව මගින් පත්කරනු ලබන අධිකරණ නිලධාරීන් වන කම්කරු වන්දි කොමසාරිස්, අතිරේක කම්කරු වන්දි කොමසාරිස් හා නියෝජ්‍ය කම්කරු වන්දි කොමසාරිස් යන තනතුරු 3කින් ද ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I වන පන්තියේ තනතුරක්ද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තනතුරක් ද ඇතුළු තනතුරු 43 කින් සමන්විත වේ.

එසේම මෙම කාර්යාලය නඩු අංශය, ආයතන අංශය, ගිණුම් අංශය, බාලවයස්කාර වන්දි කටයුතු සහ රක්ෂණ බලපත්‍ර අංශයෙන් සමන්විත වේ.

කම්කරු වන්දි අධිකරණ ක්‍රියාවලිය සඳහා අපරාධ නඩු විධාන සංග්‍රහය, සිවිල් නඩු විධාන සංග්‍රහය සහ සාක්ෂි ආඥා පනත අදාල කර ගන්නා අතර අභියාචන පටිපාටිය දිසා අධිකරණයකට සමාන වේ.

**දැක්ම**

ආපදාවකට හෝ මරණයකට පත්වන සේවකයින් වෙනුවෙන් සේවා යෝජකයින්ගෙන් අප්‍රමාදව වන්දි අයකර දීම මගින් සේවක තෘප්තිය ඇති කිරීම

**මෙහෙවර**

රැකියාවේ යෙදී සිටීම හේතු කොට ගෙන ඇති වූ අනතුරු මරණ හෝ රෝග පීඩා සම්බන්ධයෙන් සේවකයින්ට හෝ ඔවුන්ගේ යැපෙන්නන්ට නියමිත වන්දි මුදල අයකර දීමට කටයුතු කිරීම සඳහා උසාවි ක්‍රියා මාර්ග ගැනීම සහ උපදෙස් දීම

**ප්‍රධාන අරමුණු**

රැකියාවේ යෙදී සිටියදී සිදුවන අනතුරු වලින් තුවාල ලබන සේවකයින්ට, රැකියාවේ ස්වභාවය නිසා වැළඳුණු රෝගවලින් පීඩා විඳින සේවකයින්ට සහ සේවයේ යෙදී සිටින විට සිදුවන අනතුරු වලින් මියයන සේවකයින්ගේ යැපෙන්නන්ට වන්දි අයකර දීම.

**1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥා පනතේ බලතල හා විධිවිධාන අනුව කම්කරු වන්දි කොමසාරිස්ට හිමි ප්‍රධාන කාර්යභාරයන් වන්නේ,**

1. රජයේ සහ පෞද්ගලික අංශයේ සේවකයන්ට සේවයේ යෙදී සිටියදී සිදුවන අනතුරු, වෘත්තීය රෝගාබාධ සහ මරණයකදී නම් යැපෙන්නන්ට වන්දි අයකර දීමේ කටයුතු (2005 අංක 10 දරණ අවසන් සංශෝධනයට අනුව ලබාදිය හැකි උපරිම වන්දි මුදල රු:550,000/=කි.)
2. බාල වයස්කරුවන් වයස් පූර්ණත්වයට පත්වන තුරු කම්කරු වන්දි කොමසාරිස් භාරයේ ජාතික ඉතිරිකිරීම් බැංකුවේ ගිණුම් පවත්වා ගෙන යාම හා ඒවායේ පරිපාලන කටයුතු
3. සේවකයන්ට සිදුවන අනතුරකදී සේවායෝජකයන් වන්දි ගෙවීම පැහැර හැරි අවස්ථාවල ඔවුන්ගේ නිශ්චල හා චංචල දේපල තහනමට ගෙන ඒවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා වන්දි මුදල් අයකර දීම.
4. එමෙන්ම කම්කරු වන්දි රක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම, අළුත් කිරීම, බලපත්‍ර අවලංගු කිරීමේ කටයුතු.
5. සේවකයකුට අනතුරක් සිදුවූ විට එම ස්ථානයට ගොස් පරීක්ෂා කර බැලීම.
6. ලංකාවේ ලියාපදිංචි කර ඇති නැව්වල සහ ගුවන් නැව්වල සේවකයන්ට ලංකාවෙන් පිටත දී සිදුවන අනතුරු සඳහා වන්දි අයකර දීම.

**2018.01.01 සිට 2018.12.31 දක්වා ප්‍රගතිය (උසාවි කටයුතු)**

| කාර්යය | 2018.01.01 – 2018.12.31 |
|---|---|
| විධිමත් ලෙස වාර්තාගත කරන ලද අනතුරු සංඛ්‍යාව | 481 |
| විභාගයට ගන්නා ලද ලිපිගොනු සංඛ්‍යාව | 2538 |
| කටයුතු අවසන් කරන ලද වන්දි අයදුම්පත් සංඛ්‍යාව | 634 |
| ලියාපදිංචි කළ ගිවිසුම් සංඛ්‍යාව | 146 |
| මාරක අනතුරු සම්බන්ධයෙන් වන්දි ලෙස අයකර ගත් මුදල් (රු.) | 170,471,719.08 |
| මාරක නොවන අනතුරු වෙනුවෙන් උසාවි නියෝගයන් අනුව සේවා යෝජකයන් විසින් සේවකයන්ට ගෙවන ලද වන්දි මුදල් ප්‍රමාණය (රු.) | 48,392,495.23 |
| ලියාපදිංචි කළ ගිවිසුම්පත් අනුව මාරක නොවූ අනතුරු වෙනුවෙන් සේවකයින්ට ගෙවා ඇති වන්දි මුදල් ප්‍රමාණය (රු.) | 15,826,878.58 |
| මාරක අනතුරු සම්බන්ධයෙන් අයකර ගන්නා ලදුව බාලවයස්කාර යැපෙන්නන්ගේ ඉතිරිකිරීමේ ගිණුම්වල තැන්පත් කළ මුදල් ප්‍රමාණයන්. (රු.) | 26,382,495.65 |
| බාලවයස්කරුවන් වෙනුවෙන් විවෘත කළ ගිණුම් සංඛ්‍යාව | 155 |
| බාලවයස්කරුවන්ගේ වයස අවුරුදු 18 සම්පූර්ණ වීමෙන් පසු නිදහස් කළ ගිණුම් සංඛ්‍යාව | 170 |
| නිදහස් කළ බාලවයස්කාර ගිණුම් වලින් ගෙවූ මුදල් ප්‍රමාණය (රු.) | 17,777,343.37 |

**2018.01.01 සිට 2018.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය.**

| විස්තරය | 2018 වර්ෂයේ ප්‍රතිපාදන (රු.) | 2018 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වියදම (රු.) | ඉතිරිවීම් (රු.) | වියදම් ප්‍රතිශතය |
|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 33,400,000 | 33,080,528.44 | 319,471.56 | 99.04 % |
| ප්‍රාග්ධන වියදම් | 3,850,000 | 498,867.50 | 3,351,132.50 | 12.96 % |
| මුළු වියදම් | 37,250,000 | 33,579,395.94 | 3,670,604.06 | 90.15% |

**සුනිසි මෙහෙවර වැඩසටහන**

උක්ත වැඩසටහන යටතේ කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය මගින් සිදුවන කාර්යභාරය හා වන්දි අයදුම් කිරීමේ ක්‍රමවේදය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා කෙටි චිත්‍රපටයක් නිර්මාණය කිරීම, 2018 වර්ෂයේ දෙසැම්බර් මාසය වන විට අවසන් කර ඇත.

07

# සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය වර්තමානයේ ශ්‍රී ලංකාවේ 2වන විශාලතම හා ප්‍රමුඛ සමාජ ආරක්ෂණ අරමුදල වන අතර, එය 1980 අංක 46 දරණ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත මගින් සංස්ථාපිතව 1981 මාර්තු මස 01 වන දින සිට ක්‍රියාත්මක වේ. මෙම අරමුදල සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය මගින් පරිපාලනය වන වේ.

පෞද්ගලික අංශයේ හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයන් මෙම අරමුදලේ අනිවාර්ය සාමාජිකයන් වේ. පනතේ විධිවිධාන ප්‍රකාරව සේවා දායකයන්ගේ මාසික දළ ඉපයීම වලින් 3% කට සමාන ප්‍රමාණයක් මාසිකව මෙම අරමුදලට බැර කිරීමට සේවා යෝජකයන් බැඳී සිටී. තවද, ස්වයං රැකියා ලාභීන් හා විදේශගත ශ්‍රමිකයන්ටද ස්වෙච්ඡාවෙන් මෙම අරමුදලේ සාමාජිකත්වය ලබාගත හැකිය.

මණ්ඩලය විසින් සේවා දායකයන්ගේ සෞඛ්‍ය හා නිවාස අවශ්‍යතා වෙනුවෙන් සහ ඔවුන්ගේ දූ දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් ප්‍රතිලාභ යෝජනා ක්‍රම 10 ක් ක්‍රියාත්මක කරනු ලබයි.

2018 දෙසැම්බර් මස 31 වන දිනට මුළු සාමාජික ගිණුම් සංඛ්‍යාව මිලියන 14.6 ක් වේ. එයින් සාමාජික ගිණුම් මිලියන 2.6 ක් වර්තමානයේ සාමාජික මුදල් ගෙවන ක්‍රියාකාරි සාමාජික කොටසට අයත් වේ.

වර්තමානය වනවිට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය භාරකරුවෙක් සහ අරමුදලේ කළමනාකරුවෙක් ලෙස එහි ආවේනික සංවිධාන ව්‍යුහය තුළ ක්‍රියාත්මක වන අතර, අනාගතයේදී ඉතාමත් ක්‍රියාශීලි මුල්‍ය ආයතනයක් බවට පත්වීමට අදිටන් කරගෙන සිටී.

සේවා යෝජකයින් විශාල පිරිසක් බස්නාහිර පළාත තුළ කේන්ද්‍රගතව සිටිම නිසා ආරම්භයේදී සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය මධ්‍යගත ආයතනයක් ලෙස ක්‍රියාත්මක විය. ප්‍රාදේශිය කාර්යාල ජාලය තුළ සිදු කරන ලද ප්‍රතිසංවිධාන කටයුතු නිමවීමෙන් පසුව නව විභවයක් සහිත ප්‍රදේශ වල ආරම්භ කරන ලද ප්‍රාදේශිය හා දිස්ත්‍රික් කාර්යාල සමග ක්‍රියාත්මක කිරීම් හා නීති කටයුතු වල තීව්‍ර සංවර්ධනයක් සිදුවිය. පසුකාලීනව ප්‍රධානතම සාමාජික සේවා කටයුතු එනම් ඉල්ලුම්පත් භාර ගැනීම, ප්‍රතිලාභ ගෙවීම්, සාමාජිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් ආදිය විමධ්‍යගත කරන ලදි.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ කාර්යන් පුළුල් වශයෙන් මෙහෙයුම් සහ සහයක සේවා වශයෙන් දෙආකාරයකට බෙදිය හැක. මෙහෙයුම් කාර්යන් ලෙස රැස්කිරීම් හා සේවා යෝජක සබඳතා, සාමාජික සේවා සහ ආයෝජන අංශ හඳුනා ගෙන ඇත. පරිපාලන හා මානව සම්පත්, මුදල්, තොරතුරු තාක්ෂණ, සංඛ්‍යාන විශ්ලේෂණ සහ අභ්‍යන්තර විගණන අංශ සහයක සේවා අංශ ලෙස හඳුනාගෙන ඇත.

## මණ්ඩලයේ ප්‍රගතිය

| | 2018.12.31 (රු මිලියන) | | වෙනස |
|---|---|---|---|
| | අයවැයගත | තත්‍ය | % |
| සාමාජික අරමුදල | 278,500 | 281,125 | 0.94 |
| මුළු වත්කම | 305,868 | 312,088 | 2.03 |
| වාර්ෂික ආදායම | 30,316 | 29,127 | (3.9) |
| ශුද්ධ ලාභය | 24,090 | 23,325 | (3.8) |
| රජයට ගෙවන ලද බදු ප්‍රමාණය | 3,893 | 3,705 | 4.8 |

**දිවයින පුරා පිහිටි ප්‍රාදේශිය කාර්යාල 19**

1. කොළඹ දිස්ත්‍රික් කාර්යාලය
2. කොළඹ 01 - 07
3. කොළඹ 08 - 15
4. මහනුවර
5. ගම්පහ
6. මාතර
7. ගාල්ල
8. හම්බන්තොට
9. කළුතර
10. රත්නපුර
11. කෑගල්ල
12. කුරුණෑගල
13. අනුරාධපුර
14. බදුල්ල
15. යාපනය
16. අම්පාර
17. වව්නියා (නව ප්‍රාදේශිය කාර්යාලය)
18. නුවර එළිය (නව ප්‍රාදේශිය කාර්යාලය)
19. ත්‍රිකුණාමලය (නව ප්‍රාදේශිය කාර්යාලය)

**2018 දෙසැම්බර් මස 31 වන දිනට අයවැයගත සංඛ්‍යාවලට සාපේක්ෂව තත්‍ය සංඛ්‍යා**

| ක්‍රියාකාරකම | අයවැයගත අගය | තත්‍ය අගය | වෙනස % |
|---|---|---|---|
| දායක මුදල් රැස්කිරීම් (රු මිලියන) | 25,320 | 25,256 | (0.25) |
| අධිභාර (රු මිලියන) | 268 | 351 | 30.1 |
| අන්තර්ජාල බැංකු ක්‍රමය හරහා දායක මුදල් ගෙවනු ලබන ආයතන සංඛ්‍යාව | 1276 | 1187 | 6.97 |

**සෞඛ්‍ය ප්‍රතිලාභ**

1. නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය - රු.200,000
2. හෘද සැත්කම් සඳහා මූල්‍යාධාරය - රු.300,000
3. වකුගඩු බද්ධ කිරීම සඳහා මූල්‍යාධාරය - රු.300,000
4. අක්ෂි කාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය - රු. 30,000
5. ශ්‍රමසුව රැකවරණ රොහල් රක්ෂණ ක්‍රමය - රු. 50,000
6. මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය - රු.100,000

**අධ්‍යාපන ප්‍රතිලාභ**

7. සේ.නි.භා.අ. සාමාජිකයන්ගේ දරුවන් සඳහාවූ 05 වසර ශිෂ්‍යත්ව මූල්‍යාධාර රු 15,000/= බැගින් ශිෂ්‍යත්ව 9,000 ක් වාර්ෂිකව
8. සේවා කාලය තුළදී නිත්‍ය දුබලතාවයට පත් අරමුදලේ සාමාජිකයින්ගේ 05 වසර සමත් දරුවන්ට ශිෂ්‍යත්ව ප්‍රදානය
9. අපොස (උසස්පෙළ) විභාගය සමත් අරමුදලේ සාමාජිකයින්ගේ දරුවන් 5,000 කට රු. 12,000= බැගින් වාර්ෂික මූල්‍යාධාර

**නිවාස ප්‍රතිලාභ**

10. “වියන” අඩු පොලී නිවාස ණය යෝජනා ක්‍රමය

**2018 දෙසැම්බර් මස 31 වන දිනට අයවැයට සාපේක්ෂව තත්‍ය දත්තයන්**

**දායක මුදල් ආපසු ගෙවීම්**

(රු මිලියන)

| ආපසු ගෙවීම් | අයවැයගත | තත්‍ය | වෙනස |
|---|---|---|---|
| දායක මුදල් ආපසු ගෙවීම් | 20,980 | 18,292 | 2,688 |
| සාමාජික ප්‍රතිලාභ | 616 | 476 | 140 |
| **එකතුව** | 21,596 | 18,768 | 2,828 |

**ප්‍රතිලාභ ගෙවීම්**

(රු මිලියන)

| ප්‍රතිලාභ වර්ගය | අයවැයගත | තත්‍ය | වෙනස |
|---|---|---|---|
| මරණ ප්‍රතිලාභ | 120 | 97 | 23 |
| නිත්‍ය දුබලතා | 14 | 6 | 8 |
| හෘද සැත්කම් | 216 | 161 | 55 |
| වකුගඩු බද්ධ කිරීම් | 8 | 3 | 5 |
| අක්ෂි කාච බද්ධ කිරීම් | 9 | 3 | 6 |
| 5 වසර ශිෂ්‍යත්ව | 135 | 88 | 47 |
| උසස් පෙළ ශිෂ්‍යත්ව | 60 | 19 | 41 |
| ශ්‍රම සුව රැකවරණ | 54 | 11 | 43 |
| **එකතුව** | **616** | **388** | **228** |
| වියන නිවාස ණය | 300 | 94 | 206 |

**+ වාසිදායක වෙනස**
**- අවාසිදායක වෙනස**

**මණ්ඩලයේ ආයෝජන කොටස් දෙකකින් සමන්විත වේ**

**ස්ථාවර ආදායම් උපකරණ**

- භාණ්ඩාගාර බැඳුම්කර හා භාණ්ඩාගාර බිල්පත්
- ස්ථාවර තැන්පත්, ණයකර
- NDB වියන තැන්පතු

**කොටස් ආයෝජන**

- ලැයිස්තුගත කොටස්
- ඒකක භාර

**2018 වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනට ආයෝජන කළඹ**

(රු මිලියන)

| ආයෝජන වර්ගය | වටිනාකම | දේපල % |
|---|---|---|
| භාණ්ඩාගාර බැඳුම්කර (8% සිට 13%) | 218,961 | 75.1 |
| ස්ථාවර තැන්පතු | 55,476 | 19.0 |
| ණයකර | 2,565 | 0.9 |
| බැඳුම්කර (Kerawalapitiya – 10.39%) | 1,743 | 0.6 |
| කොටස් ආයෝජන | 11,660 | 4.0 |
| ඒකක භාර | 233 | 0.1 |
| වෙනත් ආයෝජන | 1,027 | 0.4 |
| **එකතුව** | **291,665** | **100** |

**ලංකා ලුණු සමාගමේ ආයෝජනය**

1997/01/24 වන දින ලංකා ලුණු සමාගමේ සාමාන්‍ය කොටස් අයිතියෙන් 90% ක ප්‍රමාණයක් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය මගින් රුපියල් මිලියන 452 ක ප්‍රතිශ්ඨාවකට මිලදී ගන්නා ලදි. මෙම මිලදී ගැනිම මුදල් අමාත්‍යාංශය සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය කොටස් මිලදී ගැනිම හා විකිණීම සඳහා වූ ගිවිසුමක් මගින් සිදුකර ඇත.

**2018 දෙසැම්බර් මස 31 වන දිනට ප්‍රධාන මූල්‍ය තොරතුරු**

(රු මිලියන)

| | අයවැයගත | තත්‍ය | වෙනස |
|---|---|---|---|
| ආයෝජන ආදායම් | 29,981 | 28,708 | (1,273) |
| වෙනත් ආදායම් | 335 | 418 | 83 |
| සේවක මණ්ඩල වියදම් | 1,100 | 1,115 | (15) |
| මෙහෙයුම් වියදම් | 248 | 199 | 49 |
| සාමාජික වියදම් | 985 | 783 | 202 |
| ආදායම් බදු වියදම | 3,893 | 3,705 | 188 |
| **ශුද්ධ ලාභය** | 24,090 | 23,325 | (766) |

**ප්‍රධාන කාර්ය සාධක දර්ශක - 2018 දෙසැම්බර් මස 31 වන දිනට**

| | දෙසැම්බර් 2017 | දෙසැම්බර් 2018 |
|---|---|---|
| ආයෝජන මත ප්‍රතිලාභ | 9.00 | 10.30 |
| දල ප්‍රතිලාභ (වෙනත් ආදායම් ඇතුළුව) | 9.18 | 10.48 |
| මෙහෙයුම් වියදම් | 0.47 | 0.49 |
| සාමාජික වියදම් | 0.28 | 0.30 |
| මුළු වියදම් | 0.76 | 0.79 |
| ආයෝජන මත ශුද්ධ ප්‍රතිලාභ අනුපාතය | 8.42 | 9.69 |

**කෙටි කාලීන සැලසුම් - 2018**

- දායක මුදල් රැස්කිරීම වර්ධනය කිරීම 12%
- ආයෝජන ආදායම වර්ධන කිරීම 10%
- සාමාජික අරමුදල වර්ධනය කිරීම 12%

**2018/01/01 සිට 2018/12/31 දක්වා සැලසුම් කළ වැඩසටහන්වල ප්‍රගතිය**

දායක මුදල් රැස්කිරීම වර්ධනය කිරීම සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණ වේගවත් කිරීම ඉලක්ක කොට ගෙන මුදල් අමාත්‍යාංශයේ මූල්‍ය සහයෝගිතාවය සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ (ILO) තාක්ෂණික සහයෝගිතාවය මත ***"ඊසා ව්‍යාපෘතිය"*** (EISA – ETF Inspection System Application) හඳුන්වා දීමට පියවර ගෙන ඇත.

සේවා යෝජකයින් විසින් අන්තර්ජාලය හරහා මුදල් ගෙවීම සහ දායක මුදල් වාර්තා එවීම පහසු කරලීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා ඇත.

මානව සම්පත් සංවර්ධන සැලැස්මක් හඳුන්වා දීම සහ ක්‍රියාත්මක කිරීම.

සමස්ථ පාර්ශවකරුවන්ට පුළුල් සේවයක් සැලසීමේ අරමුණෙන් කලාප කාර්යාලයන් පිහිටුවීම සඳහා ගම්පහ, වව්නියා සහ හම්බන්තොට ප්‍රදේශයේ ඉඩම් අත්පත් කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත.

අභ්‍යන්තර විගණන අංශය ප්‍රතිව්‍යුහගතකරණය සහ අවශ්‍ය සේවක සංඛ්‍යා ස්ථාපිත කිරීම සහ අවධානම් කළමනාකරණ ක්‍රියාවලියක් මණ්ඩලයට හඳුන්වා දීම.

ජාතික හැඳුනුම්පත පදනම්ව සාමාජිකයා කේන්ද්‍ර කොටගත් පද්ධතියක් සහ සේ.නි. භාර අරමුදල සඳහා අවේනික අංකයක් හඳුන්වාදීම සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව සහ කම්කරු දෙපාර්තමේන්තුව සමඟ සහයෝගිතා ගිවිසුමක් අත්සන් කර ඇත.

ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ සහය ඇතිව ඵලදායිතා සංකල්ප හඳුන්වාදීම හා ඵලදායිතා අත්පොතක් පිළියෙල කිරීම.

මානව සම්පත් සංවර්ධනය සඳහා ඉහළ ප්‍රමුඛතාවයක් දී ඇති අතර, විවිධ මට්ටම්වල සේවයකයින්ගේ දැනුම, ආකල්ප සහ හැකියාවන් වැඩි දියුණු කිරීම සඳහා විවිධ වැඩමුළු, සම්මන්ත්‍රණ, පුහුණු පාඨමාලා පැවැත්වීමට පියවර ගෙන ඇත. තවද, වෘත්තීය සමිති සාමාජිකයින් සඳහා ඔවුන්ගේ අදාල ක්ෂේත්‍රයන්හි පුහුණුවීම් අවස්ථා ලබාදී ඇත. මෙම වසර තුළදී ඉහළ කළමනාකරණය සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ සහ අනෙකුත් විදේශ ආධාර නියෝජිත ආයතන වල සහයෝගිතාවය මත විදේශ පුහුණු අවස්ථා ලබා දීමට හැකිවිය. ඒ අනුව නිලධාරීන් 46 දෙනෙකු මෙම විදේශීය පුහුණුවීම් සඳහා සහභාගි කරවීමට හැකි විය.

5 වසර ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සව 2 ක් 2018.04.04 වන දින බදුල්ලේ දී හා 2018.08.31 වන දින V 2025 එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා ප්‍රදර්ශනයට සමගාමීව පවත්වන ලදි.

# ශ්‍රම වාසනා අරමුදල

1998 අංක 12 දරණ පනතින් ස්ථාපිත ශ්‍රම වාසනා අරමුදල කම්කරු අමාත්‍යංශය යටතේ පවතින කම්කරු සුභ සාධනය උදෙසා ආරම්භ කරන ලද ආයතනයකි. ශ්‍රම වාසනා අරමුදල් පනතේ අරමුණු 6ක් ඔස්සේ ආරම්භයේ සිට මේ දක්වා විවිධ සුභ සාධන වැඩසටහන් පවත්වා ශ්‍රී ලංකීය සේවා නියුක්තිකයින්ගේ උන්නතියට කටයුතු සම්පාදනය කර ඇත.

ශ්‍රම වාසනා අරමුදල වෙත ප්‍රධාන ආදායම් මාර්ගය ලෙස ජාතික ලොතරැයි මණ්ඩලය විසින් ලබා දෙන ජාතික සම්පත ලොතරැයි අරමුදල හැඳින්විය හැක. ජාතික සම්පත ලොතරැයි අලෙවිය ක්‍රම ක්‍රමයෙන් වැඩි වෙමින් එම දායකත්වය වැඩිවීමත් සමඟ කම්කරු සුභ සාධනය උදෙසා සිදු කිරීමට නියමිත සේවාවන් ද වර්ධනය කර ගත හැක.

### ශ්‍රම වාසනා අරමුදලේ අරමුණු

I. සේවා නියුක්තිකයන්ගේ සුභ සාධනය ප්‍රවර්ධනය කිරීම.
II. සේවා නියුක්තයන් සේවයෙහි යෙදී සිටි ආයතන පූර්ව දැනුම් දීමකින් තොරව වසා දැමූ අවස්ථාවක ඒ සේවා නියුක්තයන්ට මූල්‍ය හා වෙනත් ආධාර සැපයීම.
III. හදිසි අවස්ථා වලදී සේවා නියුක්තයන්ට වෛද්‍ය හා වෙනත් පහසුකම් සැපයීම.
IV. සේවා නියුක්තයන්ට විරුද්ධව පරීක්ෂණ ආරම්භ කරනු ලැබූ විටකදී ඔවුන්ට තාවකාලික ආධාර සැපයීම.
V. ව්‍යසන අවස්ථා වලදී සේවා නියුක්තයන්ට හෝ ඔවුන්ගෙන් යැපෙන්නන්ට මූල්‍යමය හා වෙනත් පහසුකම් සැපයීම.
VI. සේවා නියුක්තිකයන්ගේ සුභ සාධනය සඳහා විශිෂ්ඨ සේවයක් කර ඇති තැනැත්තන්ට ත්‍යාග පිරිනැමීම.

### වැඩසටහන්වල ප්‍රගතිය

| වැඩසටහන/ක්‍රියාකාරකම | | 2018 වසර සඳහා වූ ඉලක්ක | | 2018.01.01 දින සිට 2018.12.31 දක්වා භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | භෞතික | මූල්‍ය (රු.මි.) | භෞතික | මූල්‍ය (රු.මි.) |
| 1 | වෛද්‍ය සායන කඳවුරු | 9 | 5 | 9 | 4.9 |
| 2 | සව්බල ගැන්වීමේ වැඩසටහන් | 5 | 2.5 | 4 | 2.3 |
| 3 | දැනුවත් කිරීමේ වැඩසටහන් | 53 | 1.29 | 55 | 1.15 |
| 4 | සුබසාධන වැඩසටහන් | 4 | 8.04 | 8 | 7.84 |
| 5 | වෘත්තීය අධ්‍යාපන වැඩසටහන් | 12 | 0.36 | 6 | 0.5 |
| 6 | කෘත්‍රිම අත් පා ලබා දීම | 30 | 3.5 | 12 | 2.5 |
| 7 | නීති ආධාර වැඩසටහන්<br>නීති ආධාර අභියාචනා | 50<br>5 | 1<br>0.25 | 16<br>3 | 0.5<br>0.09 |
| 8 | වෛද්‍ය සහන | 25 | 0.25 | 2 | 0.2 |
| 9 | ශිෂ්‍යත්ව වැඩසටහන් | 100 | 6 | 51 | 3.96 |
| 10 | ආපදා සහන වැඩසටහන් | 50 | 2.3 | 1 | 1.69 |
| 11 | ප්‍රවර්ධන වැඩසටහන් /රූපවාහිනි දැන්වීම් | 20 | 3.2 | 20 | 2.84 |

# අමාත්‍යාංශයේ විශේෂ ක්‍රියාකාරකම් වලින් බිඳක්



පිබිදෙමු පොළොන්නරුව වැඩසටහනේ දී
ශ්‍රම වාසනා අරමුදල විසින් පාසල් උපකරණ බෙදා දීම.



බදුල්ලේ දී පැවති ජංගම සේවා වැඩසටහනේ දී
කම්කරු වන්දි මුදල් ප්‍රදානය කිරීම.



හැටන් කම්කරු කාර්යාලය සඳහා
මුල්ගල තැබීම.



කොග්ගල අපනයන සැකසුම් කලාපයේ
නිරීක්ෂණ චාරිකාව.




ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය විසින්
කොළඹ දී පැවැත් වූ වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය
පිළිබඳ ජාතික සම්මන්ත්‍රණය



ජාතික කම්කරු උපදේශන සභා රැස්වීම්
අවස්ථාවක්




ශ්‍රම අධ්‍යයන ආයතනයේ ඩිප්ලෝමා සහතික පත් ලබා දීම.



සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය මගින් මොණරාගල දී පැවැත්වූ “V 2025” ප්‍රදර්ශන භූමියේදී පාසල් උපකරණ ලබාදීම.



මිනිස්බල රැකිරක්ෂා දෙපාර්තමේන්තුව මඟින් කොරියානු මිනිස්බල දෙපාර්තමේන්තුවේ නියෝජිත සහභාගීත්වයෙන් කුරුණෑගල රැකියා කේන්ද්‍රය විවෘත කිරීම.



සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට අයත් හම්බන්තොට පිහිටි ලංකා ලුණු සමාගමෙහි නිරීක්ෂණ චාරිකාව



මොණරාගල දිස්ත්‍රික්කයේ පවත්වන ලද එන්ටර්ප්‍රයිසස් ශ්‍රී ලංකා ප්‍රදර්ශනයට සමගාමීව පැලවත්ත සීනි කර්මාන්ත ශාලාවේ සේවකයින් වෙත සේ.නි. භාර අරමුදල් මණ්ඩලයේ හෘද සැත්කම් සඳහා මූල්‍යාධාර ලබාදීම.



අම්පාර සංචාරක නිවාසය විවෘත කිරීම.